# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,482 - 2026 මාර්තු මස 27 සිකුරාදා - 2026.03.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු ... ... | - | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... ... | - |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළ කිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 අප්‍රේල් මස 17 දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 අප්‍රේල් මස 02 දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති

2026 ජනවාරි මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


1307 - B 82774 - (2026/03)
E - 01

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබුවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ෂඩ් වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත හටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

"1968 අංක 25 දරන විභාගපනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගඅපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. ඊ“

(i)විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii)යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක වක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii)යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

**රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය**

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව

**සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ පරිපාලන I ශ්‍රේණියට උසස් කිරීම සඳහා අයදුම්පත් කැඳවීම

ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ පරිපාලන I ශ්‍රේණියට 2026.01.01 දින පවත්නා පුරප්පාඩු 18 ක් සඳහා, අංක 2199/10 දරන 2020.10.27 දිනැති *අති විශේෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රසිද්ධියට පත්කරන ලද ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයට අනුව පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති රේඛීය අමාත්‍යාංශය/පළාත් සභාවල සේවය කරන ආයුර්වේද වෛද්‍ය සේවයේ පරිපාලන II ශ්‍රේණියේ වෛද්‍ය නිලධරයෙන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. සපුරාලිය යුතු සුදුසුකම් :

i ආයුර්වේද වෛද්‍ය සේවයේ පරිපාලන II ශ්‍රේණියේ වසර 03ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක තුනක් (03) උපයාගෙන තිබීම.

ii රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.

iii III පරිශිෂ්ඨයේ දැක්වෙන පරිදි ආයුර්වේද රෝහල් කළමනාකරණය පිළිබඳ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්ව විද්‍යාලයකින් පශ්චාත් උපාධියක් ලබා තිබීම.

02. උසස්වීම් ක්‍රමය :

2.1 තනතුරු පුරප්පාඩු ඇතිවන අවස්ථාවේ දී සේවයේ නියුතු ඉහත සඳහන් සපුරාලිය යුතු සුදුසුකම් සම්පූර්ණ කරන ලද ආයුර්වේද වෛද්‍ය නිලධාරීන් අතුරින් අයදුම්පත් කැඳවනු ලැබේ. පත්කිරීම් බලධරයා විසින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් පත්කිරීම හා එයට අදාළවන ලකුණු පරිපාටිය අනුමත කරනු ලබන අතර, ඒ අනුව අදාළ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කර එම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශය අමාත්‍යාංශ ලේකම්වරයාගේ නිර්දේශ ද සහිතව පත්කිරීම් බලධරයා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමෙන් පසුව උසස් වීම ලබා දීමට කටයුතු කරනු ලැබේ.

2.2 ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ පරිපාලන I ශ්‍රේණියට උසස් කිරීම සිදු කරනුයේ, වාර්ෂික ඇස්තමේන්තුවලින් අනුමත තනතුරු සංඛ්‍යාඛ්‍යාවේ පවත්නා පුරප්පාඩු පිරවීම සඳහා පමණකි.

2.3 අනුමත තනතුරු සංඛ්‍යාවේ පුරප්පාඩු පිරවීමේ දී උසස්වීම් කරනුයේ 2023.10.27 සහ ඉන් අනතුරුව සෑම වර්ෂයකම ජනවාරි මස 01 දිනට හෝ ජූලි මස 01 දින සිට බල පැවැත්වෙන අයුරිනි.

03. පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 18 කි.

ආයුර්වේද වෛද්‍ය සේවයේ පරිපාලන I ශ්‍රේණියේ පවත්නා පුරප්පාඩු 18 පහත පරිදි වේ.

| *අනු අංකය* | *පුරප්පාඩු පවතින දිනය* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|---|
| 1. | 2023.10.27 දිනට | 13 |
| 2. | 2024.01.01 දිනට | 01 |
| 3. | 2024.07.01 දිනට | 01 |
| 4. | 2025.01.01 දිනට | 02 |
| 5. | 2025.07.01 දිනට | 0 |
| 6. | 2026.01.01 දිනට | 01 |

3.1 2023.10.27 දින සිට 2026.01.01 දින දක්වා සෑම මසකම ඇති වූ පරිපාලන ශ්‍රේණියේ පුරප්පාඩු සඳහා (උදා: 2023.10.27 දිනට, 2024.01.01 දිනට, 2024.07.01 දිනට ආදී වශයෙන්) උසස් වීම් සිදුකරන බැවින් එම දිනයන් වනවිට ඉහත සපුරාලිය යුතු සුදුසුකම් සම්පූර්ණ කරන ලද ආයුර්වේද වෛද්‍ය සේවයේ පරිපාලන II ශ්‍රේණියේ නිලධාරින්ට මේ සඳහා ඉල්ලුම් කළ හැකිය.

| *තනතුරු නාම* | *රෝහල/ආයතනය* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|---|
| අධ්‍යක්ෂ | බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය, නාවින්න. | 01 |
| | ආයුර්වේද ජාතික රෝහල, බොරැල්ල. | 01 |
| | ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ශික්ෂණ රෝහල. | 01 |
| | සිරිමාවෝ බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණ රෝහල, අම්පාර. | 01 |
| | සිද්ධ ශික්ෂණ රෝහල, කෝනේෂ්පුරි, ත්‍රිකුණාමලය. | 01 |
| | චමල් රාජපක්ෂ ආයුර්වේද පර්යේෂණ රෝහල, හම්බන්තොට. | 01 |
| | යුනානි ආයුර්වේද පර්යේෂණ රෝහල,මන්වන්තෝඩුවාව, මඩකලපුව. | 01 |
| | ආයුර්වේද පර්යේෂණ රෝහල,මැදවච්චිය. | 01 |
| අධ්‍යක්ෂ (ශිල්පීය) | සෞඛ්‍ය හා ජනමාධ්‍ය ආමාත්‍යාංශය - දේශීය වෛද්‍ය අංශය | 01 |
| පළාත් ආයුර්වේද කොමසාරිස් | බස්නාහිර පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව | 01 |
| | මධ්‍යම පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව | 01 |
| | දකුණු පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව | 01 |
| | උතුරු පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව | 01 |
| | නැගෙනහිර පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව | 01 |
| | වයඹ පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව | 01 |
| | උතුරු මැද පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව | 01 |
| | ඌව පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව | 01 |
| | සබරගමුව පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව | 01 |
| **එකතුව** | | **18** |

3.2 විශ්‍රාම ගන්නා අවස්ථාවේ දී ඉහත අංක 01 හි සපුරාලිය යුතු සුදුසුකම් සපුරා ඇති ආයුර්වේද වෛද්‍ය සේවයේ පරිපාලන **II** ශ්‍රේණියේ නිලධාරින්ටද මේ සඳහා ඉල්ලුම් කළ හැකිය.

04. මේ නිවේදනය අවසානයේ දැක්වෙන ආකෘතිය ප්‍රකාරව (අයදුම්පත www.ayurveda.gov.lk ඔස්සේ ද ලබාගත හැක.) සකස් කරන ලද අයදුම්පත් **2026.04.09** දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් ආයුර්වේද කොමසාරිස් ජනරාල්, ආයුර්වේද දෙපාර්තමේන්තුව, පරණ කොට්ටාව පාර, නාවින්න. මහරගම යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ “ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ නිලධාරින් පරිපාලන **I** ශ්‍රේණියට උසස් කිරීම සඳහා අයදුම්පත් කැඳවීම” යනුවෙන් සඳහන් කළ යුතුය.

05. ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ පරිපාලන 1 ශ්‍රේණියේ තනතුරකට අදාළ ආරම්භක වැටුප 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි SL-1-2016 හෝ 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හි SL-1-2025 දරන වැටුප් කේතයේ 20 පියවරවන අතර එම චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව වැටුප් ගෙවීම සිදු කෙරේ.

06. ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ පරිපාලන 1 ශ්‍රේණියට උසස් කිරීම සඳහාවන සම්මුඛ පරීක්ෂණයට අදාළ ලකුණු ලබාදීමේ පරිපාටිය පහත පරිදි වේ. :

6.1. සේවා කාලය:

ඉහත අංක 01 යටතේ සඳහන් මූලික සුදුසුකම් සපුරා ඇති නිලධාරින් අතරින් පරිපාලන II ශ්‍රේණියට උසස්වීම් ලැබ වසර 03 ක සතුටුදායක සේවා කාලයෙන් පසු එළඹෙන සෑම සම්පූර්ණ කර ඇති,

| | |
|---|---|
| මාස 03 කට | ලකුණු 02 |
| මාස 06 කට | ලකුණු 04 |
| වසරකට | ලකුණු 08 |

**සටහන 01**: සේවා කාලය සලකා බලනු ලබනුයේ අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට වේ.

6.2. පුහුණු: (උපරිම ලකුණු 10)

(අ) සහතික පත්‍ර පාඨමාලා, දින 02 කට වැඩි දින 05 කට අඩු පාඨමාලා සහතික පත්‍රයක් සඳහා ලකුණු 0.5 බැගින් — ලකුණු 02

(ආ) දින 05 හෝ ඊට වැඩි සහතික පත්‍ර පාඨමාලා, සහතික පත්‍රයක් සඳහා ලකුණු 02 බැගින් — ලකුණු 08

***සටහන 02:***

i ආයතන ප්‍රධානිගේ පූර්ව අනුමැතිය මත හදාරා තිබෙන පුහුණු පාඨමාලාවක් හෝ එසේ නොමැති නම්, රාජ්‍ය, අර්ධ රාජ්‍ය, රජය විසින් පිළිගනු ලැබූ (රජයේ ආයතනයක් යටතේ ලියාපදිංචි) ආයතනයක් වෙතින් අදාළ පාඨමාලාව හදාරා තිබිය යුතු වේ.

ii ඉහත සියලුම 6.2 හි දැක්වෙන පාඨමාලා පුහුණු උසස්වීම ක්‍රියාත්මකවන දිනට පෙර ලබා තිබිය යුතු ය.

6.3. අමතර අධ්‍යාපන සුදුසුකම්: (උපරිම ලකුණු 30)

පරිපාලන I ශ්‍රේණියේ තනතුරට අදාළව සලකා බලන ලද විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන දේශීය හෝ විදේශීය උසස් අධ්‍යාපන ආයතනයක්, පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනයක් හෝ විශ්ව විද්‍යාලයකින් ලබා ගත් වසර දෙකකට නොඅඩු ආයුර්වේද රෝහල් කළමණාකරණය පිළිබඳ පශ්චාත් උපාධියට අමතරව වෙනත් අධ්‍යාපන සුදුසුකම් සළකා බලනු ලැබේ.

** කළමණාකරණය, පරිපාලනය. ව්‍යාපාර පරිපාලනය, ප්‍රසම්පාදනය හා ගිණුම්කරණය, නීතිය, ආර්ථික විද්‍යාව වැනි පරිපාලන විෂයය ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් දේශීය/ විදේශීය විශ්ව විද්‍යාලයකින් හෝ දේශීය/විදේශීය පශ්චාත් උපාධි ආයතනයකින් ලබාගෙන ඇති පශ්චාත් උපාධි සුදුසුකම් සඳහා,

(අ) ඩිප්ලෝමා, මාස 06කට නොඅඩු ඩිප්ලෝමාවක් සඳහා — ලකුණු 05

(ආ) උසස් ඩිප්ලෝමා. අවුරුද්දකට වැඩි ඩිප්ලෝමාවක් සඳහා — ලකුණු 06

(ඇ) උපාධි, ** අදාළ උපාධියකට — ලකුණු 08

(ඈ) පශ්චාත් උපාධි, ** අදාළ පශ්චාත් උපාධියකට — ලකුණු 10

(ඉ) දර්ශනපති (Ph.D), ** අදාළ දර්ශනපති උපාධියකට — ලකුණු 12

*සටහන 03:* ඉහත 6.3 හි දැක්වෙන අමතර අධ්‍යාපන සුදුසුකම් උසස්වීම ක්‍රියාත්මකවන දිනට පෙර ලබා තිබිය යුතු ය.

6.4. ප්‍රකාශන හා පර්යේෂණ:

ජාත්‍යන්තර/ ජාතික මට්ටමේ සඟරා/ පොත්/ ප්‍රකාශන යනාදිය සඳහා

(*අ*) ජාත්‍යන්තර මට්ටමේ සඟරාවල ශාස්ත්‍රීය ප්‍රකාශන හෝ පර්යේෂණ සඳහා (එකකට ලකුණු 04 බැගින් උපරිම ලකුණු 08)

(*ආ*) ප්‍රකාශිත ශාස්ත්‍රීය ග්‍රන්ථයක් සඳහා (එකකට ලකුණු 02 බැගින් උපරිම ලකුණු 04)

(*ඇ*) ජාතික මට්ටමේ සඟරා/ ප්‍රකාශන/ පුවත්පතක වචන 500 නොඅඩු පර්යේෂණ ලිපි සඳහා (එකකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 03)

*සටහන 04:*

i කතෘන් කිහිපදෙනකුගේ සහභාගීත්වයෙන් පළකරන ලද ප්‍රකාශන සම්බන්ධයෙන් අයදුම්කරුගේ දායකත්ව ප්‍රමාණය පැහැදිලිව දක්වා තිබිය යුතු අතර, එම දායකත්ව ප්‍රමාණයට සමානුපාතිකව අයදුම්කරුට ලකුණු ලබා දෙනු ලැබේ.

ii එකම දත්ත/ පර්යේෂණ තොරතුරු මත පදනම්ව පළකරනු ලබන, බොහෝ දුරට සමාන නිගමනයන්ට එළැඹී ඇති ප්‍රකාශන වෙන් වෙන් වශයෙන් සලකා බලනු නොලැබේ. ඒවැනි අවස්ථාවක දී ලකුණු ලබා දීම සඳහා එක් ප්‍රකාශනයක් පමණක් සලකා බලනු ලැබේ.

iii පරිපාලන II ශ්‍රේණියේ තනතුර සඳහා උසස් වූ දිනට පසු ඉහත 6.4 යටතේවන ප්‍රකාශන හා පර්යේෂණ පමණක් මෙහි දී සලකා බලනු ලැබේ.

iv කළමණාකරණය, පරිපාලනය, ව්‍යාපාර පරිපාලනය, ප්‍රසම්පාදනය හා ගිණුම්කරණය, නීතිය, ආර්ථික විද්‍යාව වැනි පරිපාලන විෂයය ක්ෂේත්‍රයන් හා ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රයට අදාළවන ප්‍රකාශන හා පර්යේෂණ මෙහි දී සලකා බලනු ලැබේ.

v ඉහත සියලුම 6.4 හි දැක්වෙන ප්‍රකාශන හා පර්යේෂණ අදාළ උසස්වීම ක්‍රියාත්මකවන දිනට පෙර ප්‍රකාශයට පත්කර තිබිය යුතු ය.

6.5. වෙනත් සුදුසුකම්: (උපරිම ලකුණු 15)

(අ) සන්ධාන භාෂාව පිළිබඳ පාඨමාලාවකට (මාස 6ට වැඩි) ලකුණු 03

(ආ) තොරතුරු තාක්ෂණය පිළිබඳ පාඨමාලාවකට (මාස 6 ට වැඩි) ලකුණු 03

(ඇ) ක්ෂේත්‍රයට අදාළව පවරා ඇති රාජකාරී ඉටු කිරීම් හා වෙනත් විශේෂ රාජකාරී සඳහා (ප්‍රශංසා ලිපි නියමිත ආකෘතියෙන් (පොදු 230 බී) දෙපාර්තමේන්තු ප්‍රධානියා ඇතුළත්ව ඊට ඉහළ තනතුරක නිලධාරියකු විසින් නිකුත් කරනු ලැබූ) ලිපියකට (ලකුණු 2.5)

**සටහන 05:** ඉහත සුදුසුකම් සඳහා ලකුණු ලබා දීමේ දී විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, සෞඛ්‍ය අමාත්‍යාංශය හෝ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන සහතික පත්‍ර පාඨමාලා පමණක් සලකනු බලනු ලැබේ.

**සටහන 06:** ඉහත සියලුම සුදුසුකම් උසස්වීම ක්‍රියාත්මක වන දිනට පෙර සම්පූර්ණ කර තිබිය යුතු ය.

6.6. සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය (උපරිම ලකුණු 10)

(කුසලතාවය, නායකත්වය, ආකල්ප, පෞර්ෂත්වය හා සන්නිවේදනය කුසලතා සඳහා)

07. තෝරා ගන්නා ක්‍රමය :

සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් මූලික සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන්ගේ අධ්‍යාපන, වෘත්තීය, ජ්‍යෙෂ්ඨතාවය, සේවා පළපුරුද්ද හා පුහුණු සම්බන්ධ සහතික හා ලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව ඉහත සඳහන් ලකුණු ලබාදීමේ පටිපාටිය අනුව ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන්, පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුව ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ පරිපාලන ශ්‍රේණියට උසස් කිරීමට කටයුතු කරනු ලැබේ.

08. මෙම නිවේදනය මගින් ආවරණය නොවන යම් කරුණක් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ තීරණය අවසන් තීරණය වනු ඇත. තවද, මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා
කමිටුවේ නියමය පරිදි,

ලේකම්,
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය.

2026, 03 මස 18 දින.
කොළඹ දී.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ පරිපාලන I ශ්‍රේණියට උසස් කිරීම සඳහා අයදුම්පත**

01. මුලකුරු සමග නම : ..........................................................................................................................................

02. සම්පූර්ණ නම : ..............................................................................................................................................

03. උපන් දිනය : ...................................................................................................................................................

04. ජාතික හැඳුනුම්පත් අංකය : ................................................................................................................................

05. (i) ස්ථිර ලිපිනය : ...........................................................................................................................................
   (ii) ජංගම දුරකථන අංකය : ..............................................................................................................................
   (iii) විද්‍යුත් තැපැල් ලිපිනය : ..........................................................................................................................

06. (i) සේවා ස්ථානයේ නම හා ලිපිනය : ..................................................................................................................
   (පරිපාලන II තනතුරට අදාළව)
   (ii) දුරකථන අංකය : ........................................................................................................................................

07. (i) මුල් පත්වීමේ දිනය : ..................................................................................................................................
   (ii) පරිපාලන II ශ්‍රේණියට උසස් වූ දිනය : ...........................................................................................................
   (iii) අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට පරිපාලන II ශ්‍රේණියේ සේවා කාලය : .................................................................

08. සේවා පළපුරුද්ද : ..........................................................................................................................................

09. ලබා ඇති පශ්චාත් උපාධි සුදුසුකම් :
   (ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ III පරිශිෂ්ටයට අනුව)

| *ආයතනය* | *ලබා ඇති පශ්චාත් උපාධියේ නම* | *කාලය* | *සම්පූර්ණ කළ දිනය (පුහුණු කාලය ඇතුළත්ව)* |
|---|---|---|---|
| | | | |
| | | | |

10. අනෙකුත් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය
   (i) සිංහල/දෙමළ වර්ෂය : ..................................................................................................................................

11. වැටුප් රහිත නිවාඩු/ අඩ වැටුප් සහිත නිවාඩු/ විදේශ නිවාඩු (වැටුප් රහිත/ වැටුප් සහිත) ලබාගෙන ඇත්නම් ඒ පිළිබඳ විස්තර :

| *වැටුප් රහිත නිවාඩු/ අඩ වැටුප් සහිත නිවාඩු/ විදේශ නිවාඩු (වැටුප් රහිත/ වැටුප් සහිත) ලබා ගැනීමට හේතුව* | *නිවාඩු කාල සීමාව* | | *ලබාගත් නිවාඩු ප්‍රමාණය* | | |
|---|---|---|---|---|---|
| | *සිට* | *දක්වා* | *අවු.* | *මාස.* | *දින.* |
| | | | | | |

12. ඔබගේ සේවා කාලය තුළ කුමන හෝ අවස්ථාවක ඔබට විරුද්ධව විනයානුකූල පියවර ගෙන තිබේ ද? (එසේ නම්)

| *විනය තීරණය* | *චෝදනා පත්‍රයට අනුව වරද සිදුවූ කාල සීමාව* |
|---|---|
| | |

ඉහත දක්වා ඇති සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

දිනය ................................ නම : ......................................................

අත්සන :.......................................................

**ආයතන ප්‍රධානියාගේ / ප්‍රධාන ලේකම්වරයාගේ නිර්දේශය**

.................................................................................. මයා/ මිය/ මෙනවිය විසින් ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ පරිපාලන I ශ්‍රේණියට උසස් කිරීම සඳහා ඉදිරිපත් කර ඇති අයදුම්පත මේ සමග ඉදිරිපත් කරනු ලබන අතර, එහි සඳහන් තොරතුරු නිවැරදි බවත්, පූර්වාසන්න වසර 05 තුළ නිලධාරියා/ නිලධාරිනිය සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති / නැති බවත්, පූර්වාසන්න වසර 05 තුළ නිලධාරියාට/ නිලධාරිනියට විරුද්ධව විනය ක්‍රියාමාර්ගයක් ගෙන ඇති*/ නොමැති බවත් සහතික කරමි.

දිනය : .................................... ..........................................................,

ආයතන ප්‍රධානියාගේ / ප්‍රධාන ලේකම්වරයාගේ

අත්සන හා නිල මුද්‍රාව

* විනය ක්‍රියාමාර්ගයක් ගෙන ඇතිනම් ඒ පිළිබඳව සඳහන් කළ යුතු ය.

* අසම්පූර්ණ ලෙස ඉදිරිපත් කරන ලද අයදුම්පත් සම්මුඛ පරීක්ෂණය වෙත ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කරන බවත්, ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත් සහ අසම්පූර්ණ ඉල්ලුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

03 - 1093

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ විධායක නිලධාරි ගණයේ III ශ්‍රේණියේ සහකාර ලේකම් (නීති) තනතුර සඳහා බඳවා ගැනීම - 2026

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ විධායක නිලධර ගණයේ III ශ්‍රේණියේ සහකාර ලේකම් (නීති) තනතුරුවල පවතින පුරප්පාඩු 01 ක් සඳහා සුදුස්සන් තෝරා ගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි සුදුසුකම් සපුරන ශ්‍රී ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර **ලේකම්, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය, අංක 19, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10** යන ලිපිනය වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. කවරය වම්පස උඩ කෙළවරේ **"විධායක නිලධාරී ගණයේ III ශ්‍රේණියේ සහකාර ලේකම් (නීති) තනතුර සඳහා බඳවා ගැනීම"** යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය.

(*අ*) අයදුම්පත් කැඳවන අවසාන දිනය **2026.04.26** දින වේ.

**I සටහන** : ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි පාඩුව අයදුම්කරු විසින්ම විඳදරා ගත යුතු ය.

**1. බඳවා ගැනීමේ ක්‍රමය:**

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතරින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා පුරප්පාඩුව සඳහා බඳවා ගනු ලැබේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 06 යටතේ සඳහන්) ලකුණු ලබාදීමේ පටිපාටියට අනුකූලව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

පත්වීම ක්‍රියාත්මකවන දිනය වන්නේ පත්වීම් ලිපියේ සඳහන් දිනය හෝ පත්වීම්ලාභියා තනතුරෙහි වැඩභාරගත් දිනය යන දින දෙකෙන් පසුව එළැඹෙන දිනය වේ.

**2. අවශ්‍ය සුදුසුකම්:**

(i) අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් -

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදේශීය හෝ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන නීතිවේදී උපාධියක් ලබා තිබීම;

*හෝ*

ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන නීතිවේදී උපාධියක් ලබා තිබීම;

*හෝ*

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25A වගන්තිය යටතේ පිළිගත් නීතිවේදී උපාධියක් ලබා තිබීම ;

*හෝ*

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වශයෙන් දිවුරුම් දී තිබීම.

(ii) පළපුරුද්ද

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු නීතිඥවරයකු වශයෙන් වසර තුනකට (03) නොඅඩු සක්‍රිය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම. (සක්‍රිය වෘත්තීය පළපුරුද්ද සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ලේඛනවල පළපුරුද්ද ලබාගත් කාලය, සහතික කරන්නාගේ නිලමුද්‍රාව හා සහතික කළ දිනය පැහැදිලිව සඳහන් කර තිබිය යුතු ය.)

***II සටහන:*** මූලික සුදුසුකම සනාථ කෙරෙන ලේඛනවල අයදුම්කරු විසින්ම සහතික කළ පිටපත් අයදුම්පත්‍රයට අමුණා තිබිය යුතුය. **සේවා කාලය ආරම්භවන හා අවසානවන දිනය පැහැදිලිව සඳහන් සහතික අමුණා නොමැති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය.**

(iii) කායික යෝග්‍යතාව

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(iv) වෙනත් සුදුසුකම්

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.
- මනා ලෙස ඉංග්‍රීසි භාෂාව හැසිරවීමේ හැකියාව තිබිය යුතු ය.
- අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
- අයදුම්පත් කැඳවන අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

**3. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :**

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ අනත්දරුවිශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

(ii) මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්ය.තනතුරට බඳවාගෙන වසර 03ක් ඇතුළත බඳවා ගැනීම් පටිපාටියේ සඳහන් ආකාරයට පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

(iii) 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි සඳහන් විධිවිධාන හා ඊට ආනුෂංගික චක්‍රලේඛවල විධිවිධාන අනුව මෙම තනතුරට පත් වී වසර පහක් ඉකුත්වීමට පෙර සේවයට බැඳුණු භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතාවය ලබා ගත යුතු අතර, රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරින් විසින් පරිවාස කාලය තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතු ය.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

(v) ඉල්ලුම්කරනු ලබන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලබන අතර, ඔබ පත්වීම ලැබීමට සුදුසුකම්ලත් භාෂා මාධ්‍ය වනුයේ, ඔබ විසින් අයදුම් පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍ය වේ.

**4. වයස් සීමාව :**

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය. දැනට රාජ්‍ය සේවයේ නියුතු නිලධාරින්ට උපරිම වයස් සීමාවක් බල නොපැවැත්වේ.

**5. වැටුප් පරිමාණය :**

අංක 10/2025 දරන 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන අනුව මෙම පත්වීමට හිමි මාසික වැටුප් පරිමාණය
රු. 82,150-10×2,400-8×2,940-17×3,900- රු. 195,970 (SL-1-2025) වේ.

**6. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ.**

| *අනු. අංකය* | *විෂයය* | *ලකුණු* | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 01 | **අතිරේක අධ්‍යාපන සුදුසුකම් -** | | **20** |
| | රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2025 හි ඇතුළත් විධිවිධාන අනුව පිළිගත් විශ්වවිද්‍යාලයක් විසින් ලබාදෙන, | | |
| | • පළමු පන්තියේ සාමාර්ථය සහිත නීතිවේදී උපාධිය | 20 | |
| | • දෙවන පන්තියේ ඉහළ සාමාර්ථය සහිත නීතිවේදී උපාධිය | 15 | |
| | • දෙවන පන්තියේ පහළ සාමාර්ථයක් සහිත නීතිවේදී උපාධිය | 12 | |
| | • සාමාන්‍ය සාමාර්ථයක් සහිත නීතිවේදී උපාධිය | 10 | |
| | හෝ | | |
| | • නීති විද්‍යාලයේ අවසාන වසරේ පළමු පන්තියේ සාමාර්ථය | 15 | |
| | • නීති විද්‍යාලයේ අවසාන වසරේ දෙවන පන්තියේ සාමාර්ථය | 10 | |

<table>
<tr><th>අනු. අංකය</th><th>විෂයය</th><th>ලකුණු</th><th>උපරිම ලකුණු</th></tr>
<tr><td></td><td>අතිරේක වෘත්තීය සුදුසුකම් -<br><br>(අ) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2025 හි ඇතුළත් විධිවිධාන අනුව පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගන්නා ලද නීතිය පිළිබඳ පශ්චාත් උපාධිය</td><td>15</td><td>15</td></tr>
<tr><td></td><td>(ආ) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2025 හි ඇතුළත් විධිවිධාන අනුව පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් නීතිය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ උසස් නීති අධ්‍යාපන ආයතනයෙන් ලබාගත් පශ්චාත් නීති ඩිප්ලෝමාවක්</td><td>10</td><td></td></tr>
<tr><td>02</td><td>අමතර පළපුරුද්ද<br><br>නඩුවලට අදාළ ලේඛන සකස් කිරීම සහ විවෘත අධිකරණයේ කරුණු දැක්වීම්
<table>
<tr><th></th><th>නඩු ගොනු කිරීම් (එක් නඩුවක් සඳහා)</th><th>අධිකරණය ඉදිරියේ පෙනී සිට කරුණු දැක්වීම් සඳහා ලකුණු (එක් නඩුවක් සඳහා)</th></tr>
<tr><td>ශ්‍රේෂ්ඨාධිකරණය</td><td>2</td><td>5</td></tr>
<tr><td>අභියාචනාධිකරණය</td><td>2</td><td>4</td></tr>
<tr><td>මහාධිකරණය</td><td>2</td><td>3</td></tr>
<tr><td>දිස්ත්‍රික් උසාවි</td><td>4</td><td>5</td></tr>
<tr><td>විනිශ්චයාධිකාර</td><td>2</td><td>3</td></tr>
</table>
සටහන-<br>ඉහත සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ නඩු තීන්දුවල පිටපත් හෝ අවසන් වරට නඩුව පැවති දිනයේ නඩු වාර්තාවේ සහතික පිටපතක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු ය.</td><td></td><td>30</td></tr>
<tr><td>03</td><td>පරිගණක හැකියාව<br><br>(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය හෝ පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා තිබීම සඳහා<br><br>(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයෙන් හෝ වෙනත් රජය පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නීතිය පිළිබඳ ඩිප්ලෝමාවක්.<br><br>(ඇ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් හෝ වෙනත් ආයතනයකින් ලබාගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ NVQ 5 හෝ ඊට ඉහළ මට්ටමේ ඩිප්ලෝමාවක්.<br><br>(ඈ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ හෝ වෙනත් රජය පිළිගත් වෘත්තීය ආයතනයක තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නීති ක්ෂේත්‍රයේ පාඨමාලා හදාරා/පුහුණු වැඩසටහන්වලට සහභාගී වී ලබාගත් සහතික පත්‍ර. (එක් සහතිකයකට ලකුණු 02 බැගින් උපරිම සහතික දෙකකට ලකුණු ලබා දෙනු ලැබේ.)</td><td>15<br><br>12<br><br>10<br><br>04</td><td>15</td></tr>
</table>

| අනු. අංකය | විෂයය | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| 04 | **ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය**<br><br>(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස ඇතුළත්ව ලබාගත් උපාධිය.<br><br>(ආ) පිළිගත් අන්තර්ජාතික හෝ ජාතික මට්ටමේ ආදර්ශ අධිකරණ තරඟවල දී (Moot court competitions) දක්වා ඇති ඉංග්‍රීසි භාෂාවේ ව්‍යක්ත බව<br><u>තේවල</u><br>i. ප්‍රථම ස්ථානය/හොඳම කුසලතාව - 12<br>ii. දෙවන ස්ථානය - 10<br>iii. තෙවන ස්ථානය/ වෙනත් කුසලතා - 08<br><u>කණ්ඩායම්</u><br>i. ප්‍රථම ස්ථානය/හොඳම කුසලතාව - 10<br>ii. දෙවන ස්ථානය - 08<br>iii. තෙවන ස්ථානය/ වෙනත් කුසලතා - 06<br><br>(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් ඩිප්ලෝමාවක් හෝ වෙනත් ආයතනයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් SLQF 3 හෝ ඊට ඉහළ මට්ටමේ ඩිප්ලෝමාවක් හෝ රජයේ පුහුණු ආයතනයකින් / රජයේ පුහුණු ආයතනයකට අනුබද්ධ ආයතනයකින් අවම වශයෙන් අධ්‍යයන පැය 1500ක පාඨමාලාවක් හදාරා ලබාගත් ඉංග්‍රීසි භාෂාව සඳහා වූ ඩිප්ලොමාවක්.<br><br>(ඈ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී (දේශීය හෝ ලන්ඩන්) ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් අධි සාමාර්ථයක් ලබා තිබීම හෝ IELTS සමස්ථ ලකුණ 6.5 හෝ ඊට ඉහළ, TOEFL-IBT 79 හෝ ඊට ඉහළ, TOEFL-CBT 213 හෝ ඊට ඉහළ හෝ TOEFL-PBT 550 හෝ ඊට ඉහළ වීම.<br><br>(ඉ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් උසස් සහතික පත්‍රයක් හෝ වෙනත් ආයතනයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් SLQF 2 මට්ටමේ සහතිකයක් | 15<br><br>12<br><br>10<br><br>08<br><br>05 | **15** |
| 05 | **සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය**<br>තනතුරෙහි භූමිකාව ඉටුකිරීමට උපස්ථම්භවන අයදුම්කරුගේ:<br>○ ශක්තීන් (Strength questions) (ලකුණු 01),<br>○ අවස්ථානුකූලව තීරණ ගැනීමේ හැකියාව (Situational questions)(ලකුණු 02)හා<br>○ දක්ෂතාව (Competency questions) (ලකුණු 02)<br>ඇගයීමට ලක් කිරීම අරමුණු කර ගත් ප්‍රශ්නවලට ලබාදෙන පිළිතුරු අනුව ලකුණු පිරිනමනු ලැබේ. | | **05** |
| | **එකතුව** | | **100** |

***සටහන :*** **ඉහත ලකුණු පටිපාටියේ අතිරේක පළපුරුද්දට හැර අනෙකුත් එක් එක් ශීර්ෂය යටතේ ඉහළම සුදුසුකමට පමණක් ලකුණු පිරිනැමෙනු ඇත.**

**7. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :**

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත්කර ඇති අපේක්ෂකයින් පමණි.

සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතිකපත්වල මුල් පිටපත් හා අයදුම්කරු විසින්ම නිසි පරිදි සහතික කරන ලද පිටපතක් ද බැගින් ඉදිරිපත් කළ යුතු ය.

සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත.

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

**8. අයදුම්පත් ඉදිරිපත් කළයුතු ආකාරය :**

(i) අයදුම්පත් 2026.04.26 වැනි දිනට හෝ ඊට ප්‍රථම **"ලේකම්, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය, අංක 19, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10"** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස්කර මුල් පිටුව අංක 01 සිට 13 දක්වාත් දෙවැනි පිටුව 14 සිට 16 දක්වාත් තෙවැනි පිටුව අයදුම්කරුගේ සහතිකය, අයදුම්කරුගේ අත්සන සහතික කිරීම හා අයදුම්කරුවන් රාජ්‍ය සේවයේ නියුතු නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකයත් වන ආකාරයෙන් පිළියෙළකර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය.

(iii) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ සහකාර ලේකම් (නීති) තනතුර සඳහා බඳවා ගැනීම" යනුවෙන් සඳහන් කළ යුතු ය.

(iv) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයකු/ සාමදාන විනිශ්චයකාරවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයකු/ නීතිඥවරයකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධරයකු හෝ රු. 82,150/- ක හෝ ඊට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතු ය.

(v) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරින් තම අයදුම්පත්, තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතු ය.

(vi) මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

**9. සාවද්‍ය තොරතුරු සැපයීම :**

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

**10.** පුරප්පාඩු සියල්ලම පිරවීම හෝ නොපිරවීම හෝ කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් පිරවීම හෝ මෙම රෙගුලාසිවල සඳහන්කර නොමැති යම් කරුණක් පිළිබඳව අවසන් තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

**11.** මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

**12.** මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් හෝ මෙම බඳවා ගැනීමේ ක්‍රියාමාර්ග තුළ කිසියම් ගැටලුකාරී තත්වයක් ඇති වුවහොත් ඒ පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණ අවසාන තීරණ වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා
අමාත්‍යාංශය.

2026 මාර්තු මස 13 දින.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

**අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ විධායක නිලධාරී ගණයේ III ශ්‍රේණියේ සහකාර ලේකම් (නීති) තනතුර සඳහාවන අයදුම්පත**

අංකය :-----------------------

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

(අයදුම් කරනු ලබන මාධ්‍යය වෙනස් කළ නොහැක.)
සිංහල - 2 / දෙමළ - 3 /ඉංග්‍රීසි- 4

1. (අ) මුලකුරු සමඟ නම (සිංහලෙන් / දෙමළෙන්) :- ..........................................................................................
..........................................................................................

මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :- ..........................................................................................

..........................................................................................

(ආ) සම්පූර්ණ නම (සිංහලෙන් / දෙමළෙන්) :- ..........................................................................................

..........................................................................................

සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :- ..........................................................................................

..........................................................................................

2. ස්ථිර ලිපිනය (සිංහලෙන් / දෙමළෙන්) :- ..........................................................................................
..........................................................................................

3. ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :- ..........................................................................................
..........................................................................................

4. දුරකථන අංකය :- ..........................................................................................
5. විද්‍යුත් ලිපිනය :- ..........................................................................................
6. ජාතික හැඳුනුම්පත් අංකය :- ..........................................................................................
7. ස්ත්‍රී/පුරුෂ භාවය :- ..........................................................................................
8. උපන් දිනය :- වර්ෂය:- .............. මාසය :- ........... දිනය :- ..........
9. ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස :- වර්ෂ :- .............. මාස :- ........... දින :- ..........
10. ජාතිකත්වය :- ..........................................................................................
11. විවාහක/අවිවාහක බව :- ..........................................................................................
12. නීති උපාධිය පිළිබඳ විස්තර :- ..........................................................................................
විශ්ව විද්‍යාලය :- ..........................................................................................
උපාධිය පිරිනැමූ දිනය :- ..........................................................................................
භාෂා මාධ්‍යය :- ..........................................................................................
13. නීතිඥයෙකු ලෙස දිවුරුම් දුන් දිනය :- ..........................................................................

16. නීතිඥයෙකු ලෙස වෘත්තිය පළපුරුද්ද :- වසර ගණන ..............................................................

17. අයදුම්පත කැඳවීමේ නිවේදනයේ 06 වන ඡේදයට අනුව සුදුසුකම් :-

i. ........................................................................................................................................
ii. ........................................................................................................................................
iii. ........................................................................................................................................
iv. ........................................................................................................................................
v. ........................................................................................................................................
vi. ........................................................................................................................................
vii. ........................................................................................................................................
viii. ........................................................................................................................................
ix. ........................................................................................................................................
x. ........................................................................................................................................
xi. ........................................................................................................................................
xii. ........................................................................................................................................
xiii. ........................................................................................................................................
xiv. ........................................................................................................................................
xv. ........................................................................................................................................
xvi. ........................................................................................................................................
xvii. ........................................................................................................................................
xviii. ........................................................................................................................................
xix. ........................................................................................................................................
xx. ........................................................................................................................................

18. භාෂා ප්‍රවීණතාව :- (අදාළ තීරුවේ √ ලකුණ යොදන්න)

| | ඉතා හොඳයි | හොඳයි | සාමාන්‍යයි | දුර්වලයි |
|---|---|---|---|---|
| සිංහල | | | | |
| දෙමළ | | | | |
| ඉංග්‍රීසි | | | | |

**අයදුම්කරුගේ සහතිකය**

............................................................................... වන මම මෙහි සඳහන් කරන ලද සියලුම කරුණු සත්‍යය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මම රජයේ සේවයෙන් පහකර හෝ සානුකම්පිත විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමතාව මත සේවයෙන් විශ්‍රාම ගන්වා හෝ නොමැති බවත්, තනතුරු අතහැර ගිය අයෙකු සේ සලකා නැති බවත් සහතික කරමි. මෙහි අන්තර්ගත කරුණු කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර හෙළි වුවහොත් නුසුදුසු කිරීමට යටත්වන බවත්, තෝරා ගැනීමෙන් අනතුරුව එවැනි තත්වයක් අනාවරණය වුවහොත් නුසුදුසු කිසිදු වන්දියක් නොගෙවා රැකියාවෙන් ඉවත් කළ හැකි බවත් මම දනිමි.

............................................... ,

අයදුම්කරුගේ අත්සන .

දිනය : .......................................

**අයදුම්කරුගේ අත්සන සහතික කිරීම**

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ............................................................................. මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා බවත් මා ඉදිරියේදී ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

නම :-............................................................

පදවි නාමය:-............................................................

ලිපිනය :-............................................................

දිනය :-.............................................................

..................................................,

අත්සන් සහතික කරන ලද නිලධාරියාගේ අත්සන.

**රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

.................................................................................................... මහතා/මෙනවිය/මිය දැනට මෙම අමාත්‍යාංශයේ /දෙපාර්තමේන්තුවේ ...............................................................................................වශයෙන් ස්ථිර/ තාවකාලික/අනියම් නිලධාරියෙකු/නිලධාරිනියක වශයෙන් සේවය කරන බවත්, මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

..........................................................,

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා

නිල මුද්‍රාව.

දිනය :- .....................................................................

නම :- .....................................................................

තනතුර :- .....................................................................

අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව:- ...........................................................

03 - 1095

**අධිකරණ සේවා කොමිෂන් සභාව**

මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ පහත උපලේඛනයේ සඳහන් ප්‍රදේශවල 'ක්වාසි' තනතුරු සඳහා ක්වාසි විනිසුරුවරුන් පත්කිරීම - 2026

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති පුද්ගලයින් හට මේ සඳහා අයදුම් කළ හැක.

අයදුම්කරු මුස්ලිම් පුරුෂයෙකු විය යුතු අතර, පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිධාරියෙකු හෝ ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් පිළිගත් ආයතනයක් විසින් ප්‍රදානය කරන ලද සහතිකයක් දරන මෞලවි කෙනෙකු හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන අල් - ආලිම් සහතිකයක් දරන්නෙකු හෝ නීතිඥවරයෙකු හෝ ඊට සමාන වෘත්තිමය සුදුසුකම් දරන්නෙකු හෝ විශ්‍රාමික රජයේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු විය යුතු ය.

දැනට රාජ්‍ය සේවයේ නියුතු අයෙකුට මේ සඳහා අයදුම්කළ නොහැක.

අයදුම්කරු ඉස්ලාම් ආගම පිළිබඳ මනා දැනුමක් ඇති, වයස අවුරුදු 40ට වැඩි, මනා ශාරීරික යෝග්‍යතාවයෙන් යුත්, යහපත් චරිතයක් ඇති, මුස්ලිම් විවාහ හා දික්කසාද පනත හා ඉස්ලාම් නීතිය පිළිබඳ විශේෂිත වූ මනා දැනුමක් ඇති සහ සමාජය තුළ යහපත් පිළිගැනීමක් ඇති විවාහකයෙකු විය යුතු ය.

තෝරා ගනු ලබන අපේක්ෂකයා පත්වීම් ලිපියේ නිශ්චිතව සඳහන් කරනු ලබන කාලසීමාවක් සඳහා පත් කරනු ලැබේ.

ක්වාසිවරයෙකු තමා පත්කරනු ලබන ප්‍රදේශය තුළ ස්ථිරව පදිංචි වී සිටීම නීතිමය වශයෙන් අවශ්‍යය.

ක්වාසිවරයා හට මසකට රුපියල් 7,500/- ක දීමනාවකට අමතරව සහායක සේවාවන්, ලිපිද්‍රව්‍ය හා තැපැල් වියදම් සඳහා මසකට උපරිම රුපියල් 6,250/- ක ගෙවීමක් කරනු ලැබේ.

මෙහි පහත දක්වා ඇති ආකෘති පත්‍රය අනුව සැකසූ අයදුම්පත්, ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ක්වාසි" යනුවෙන් සඳහන් කොට **2026 අප්‍රේල් මස 17** දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් මා වෙත ලැබෙන සේ එවිය යුතු ය . අයදුම්පත් සමග ලිපි ලේඛනාදියෙහි මුල්පිටපත් එවිය යුතු නොවේ.

**ආනන්දි කනගරත්නම්,**
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2026 මාර්තු මස 27 දින,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය,
තැ.පෙ. 573,
අලුත්කඩේ,
කොළඹ 12.

**උපලේඛනය**

| | *ක්වාසි අධිකරණය* | *ක්වාසි අධිකරණ කලාපය* |
|---|---|---|
| 01 | අඩ්ඩාලච්චේනයි | අම්පාර දිස්ත්‍රික්කයේ අඩ්ඩාලච්චේනයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය |
| 02 | අක්කරපත්තු | අම්පාර දිස්ත්‍රික්කයේ අක්කරපත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය |
| 03 | අනුරාධපුර | අනුරාධපුර දිස්ත්‍රික්කයේ නුවරගම් පළාත, හුරුලුගම් පළාත සහ කලගම් පළාත ආදායම් කොට්ඨාසය |
| 04 | අවිස්සාවේල්ල | අවිස්සාවේල්ල අධිකරණ කලාපය |

| | ක්වාසි අධිකරණය | ක්වාසි අධිකරණ කලාපය |
|---|---|---|
| 05 | බලපිටිය සහ ඇල්පිටිය | ගාල්ල දිස්ත්‍රික්කයේ බලපිටිය සහ ඇල්පිටිය අධිකරණ කලාපය |
| 06 | බේරුවල | කළුතර දිස්ත්‍රික්කයේ බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය |
| 07 | බෝරා ප්‍රජාව | ශ්‍රී ලංකා බෝරා ප්‍රජාව |
| 08 | බියගම | ගම්පහ දිස්ත්‍රික්කයේ බියගම, දොම්පේ, කැළණිය සහ වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය |
| 09 | කොළඹ නැගෙනහිර | කොළඹ අධිකරණ කලාපයට අයත් අළුත් කඩේ, ග්‍රෑන්ඩ්පාස්, මාලිගාවත්ත, සෙබස්ටියන් පාර, නිව් බසාර්, තොටහේන, කොච්චිකඩේ, කොටහේන, පාදුක්ක, හෝකන්දර, මීගොඩ, ගොඩගම, පනාගොඩ, මාලඹේ, තලංගම උතුර, කොටිකාවත්ත සහ බුත්ගමුව යන අධිකරණ බල ප්‍රදේශ |
| 10 | කොළඹ බටහිර | කොළඹ අධිකරණ කලාපයට අයත් දෙහිවල, ගල්කිස්ස, රත්මලාන, නුගේගොඩ, පැපිලියාන, මහරගම, පන්නිපිටිය, හෝමාගම, පොල්ගස්ඕවිට, ඉංගිරිය, රාජගිරිය, බත්තරමුල්ල සහ අතුරුගිරිය යන අධිකරණ බල ප්‍රදේශ |
| 11 | එරාවූර් | මඩකලපුව දිස්ත්‍රික්කයේ එරාවූර්පත්තු ආදායම් බල ප්‍රදේශය |
| 12 | ගාල්ල | ගාල්ල දිස්ත්‍රික්කයේ ගාල්ල අධිකරණ කලාපය |
| 13 | ගම්පහ | ගම්පහ දිස්ත්‍රික්කයේ ගම්පහ, අත්තනගල්ල, මීරිගම සහ මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස |
| 14 | හම්බන්තොට | හම්බන්තොට දිස්ත්‍රික්කයේ හම්බන්තොට අධිකරණ කලාපය |
| 15 | හාරිස්පත්තුව සහ පූජාපිටිය | මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුව සහ පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය |
| 16 | ඉරක්කාමම් | අක්කරපත්තු අධිකරණ කලාපයේ වරිප්පොත්තාන්චේනයි, ඔට්ටිපුරම්, අමීරලිපුරම්, 10 කොට්ඨාසය ඒ, 11 කොට්ඨාසය ඒ, නල්ලවන්දිමලේ, ඉරක්කාමම් ග්‍රාමසේවා කොට්ඨාසයේ, 01 සිට 09 දක්වා වූ ප්‍රදේශ |
| 17 | කල්පිටිය | පුත්තලම දිස්ත්‍රික්කයේ කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය |
| 18 | කළුතර | කළුතර දිස්ත්‍රික්කයේ කළුතර අධිකරණ කලාපය |
| 19 | මහනුවර | මහනුවර දිස්ත්‍රික්කයේ කඩවත් සතර සහ ගඟවට කෝරළය යන ආදායම් කොට්ඨාසය |
| 20 | කෑගල්ල | කෑගල්ල දිස්ත්‍රික්කයේ කෑගල්ල අධිකරණ කලාපය |
| 21 | කුලියාපිටිය | කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුලියාපිටිය, දිවුරුම්පොල, ආරියගම, හෙට්ටිපොළ, පන්නල, බණ්ඩාරකොස්වත්ත, ඇලබඩගම, බුම්මාන, නාරම්මල, දඹදෙණිය, හොරොම්බාව, ඇතුන්ගහකොටුව, කැකුණගොල්ල, කොබෙයිගනේ, අරක්යාල සහ මෙම ප්‍රදේශයට අයත් අනිකුත් කුඩා ගම්මාන |
| 22 | කුරුණෑගල | කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුරුණෑගල අධිකරණ කලාපය |
| 23 | මන්නාරම | මන්නාරම දිස්ත්‍රික්කයේ මන්නාරම සහ මාන්දයි ආදායම් කොට්ඨාසය |
| 24 | මේමන් ප්‍රජාව | ශ්‍රී ලංකා මේමන් ප්‍රජාව සඳහා |
| 25 | මොණරාගල | මොණරාගල දිස්ත්‍රික්යේ මොණරාගල අධිකරණ කලාපය |
| 26 | මුතූර් (කොඩ්ඩියාර් පත්තුව) | ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කොඩ්ඩියාර් පත්තුව ආදායම් කොට්ඨාසය |
| 27 | නාවලපිටිය | මහනුවර දිස්ත්‍රික්කයේ උඩබුලත්ගම ආදායම් කොට්ඨාසය සහ නුවරඑළිය දිස්ත්‍රික්කයේ හබුගස්තලාව යන ප්‍රදේශ |
| 28 | නින්තවූර් | අම්පාර දිස්ත්‍රික්කයේ නින්තවූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය |

| | *ක්වාසි අධිකරණය* | *ක්වාසි අධිකරණ කලාපය* |
|---|---|---|
| 29 | නුවරඑළිය | නුවරඑළිය දිස්ත්‍රික්කයේ නුවර එළිය අධිකරණ කලාපය |
| 30 | ඔට්ටමාවඩි | මඩකලපුව දිස්ත්‍රික්කයේ බටහිර කෝරලයිපත්තු ආදායම් කොට්ඨාසය |
| 31 | පහතහේවාහැට | මහනුවර දිස්ත්‍රික්කයේ පහත හේවාහැට උප්පැන්න, විවාහ හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය |
| 32 | පොතුවිල් | අම්පාර දිස්ත්‍රික්කයේ පානම්පත්තුව (පොතුවිල්) ආදායම් කොට්ඨාසය |
| 33 | පුල්මුඩේ | ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ නැගෙනහිර සහ බටහිර කට්ටුකුලම්පත්තු ආදායම් කොට්ඨාසය |
| 34 | රත්නපුර | රත්නපුර දිස්ත්‍රික්කයේ රත්නපුර අධිකරණ කලාපය |
| 35 | අවතැන්වූවන් | පුත්තලම දිස්ත්‍රික්කයේ වෙසෙන අවතැන්වූවන් සඳහා |
| 36 | සායින්තමරුදු (කරවාහුපත්තු දකුණ) | අම්පාර දිස්ත්‍රික්කයේ සායින්තමරුදු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය |
| 37 | තම්බලගමුව සහ කන්තලේ | ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ තඹලගමුව සහ කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය |
| 38 | තංගල්ල | හම්බන්තොට දිස්ත්‍රික්කයේ තංගල්ල අධිකරණ කලාපය |
| 39 | ත්‍රිකුණාමලය | ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ත්‍රිකුණාමලය නගරය, ගුවට්ස් සහ මෝරාවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය |
| 40 | තුම්පනේ | මහනුවර දිස්ත්‍රික්කයේ තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය |
| 41 | ගම්පොල (උඩපළාත) | මහනුවර දිස්ත්‍රික්කයේ ගම්පොළ (උඩපළාත) අධිකරණ කලාපය |
| 42 | වාලච්චේන (කෝරලයිපත්තුව) | මඩකලපු දිස්ත්‍රික්කයේ කෝරලයිපත්තුව නැගෙනහිර (ඕට්ටමාවාඩි හැර) ආදායම් කොට්ඨාසය |
| 43 | යටිනුවර | මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර ආදායම් කොට්ඨාසය |
| 44 | යාපනය | යාපනය දිස්ත්‍රික්කයේ යාපනය, පේදුරුතුඩුව හා කයිට්ස් අධිකරණ කලාපය |

**1965 අංක 1 සහ 1969 අංක 32 දරන මුස්ලිම් විවාහ හා දික්කසාද පනත්වලින් සංශෝධිත මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ ක්වාසිවරයකු පත්කිරීමේ ආදර්ශ අයදුම්පත**

---

ක්වාසි බල ප්‍රදේශය :- ________________

1. මුලකුරු සමග නම : ________________

උ:අබ්දූර් රහ්මාන් එම්.අයි.

2. සම්පූර්ණ නම : ________________

උදා: මුහම්මදු ඉස්හාක් අබ්දූර් රහ්මාන්

3. ස්ථිර පදිංචිය :

4. ලිපිනය :

5. උපන් දිනය : | ව | ව | ව | ව | මා | මා | දි | දි |

6. වයස :

7. ජාතිය :

8. ආගම :

9. ජා.හැ.ප අංකය :

10. දුරකතන අංකය :

11. අධ්‍යාපන සුදුසුකම්

---

1. ______________________________
2. ______________________________
3. ______________________________
4. ______________________________
5. ______________________________

12. වෘත්තීය සුදුසුකම්

---

1. ______________________________
2. ______________________________
3. ______________________________
4. ______________________________
5. ______________________________

13. කියවීමට හා ලිවීමට හැකි භාෂාවන්:

14. ඉස්ලාම් නීතිය පිළිබඳ දැනීමක් තිබේද: ඔව් [ ] නැත [ ]

15. විවාහකද?: ඔව් [ ] නැත [ ]

16. භාර්යාව ජීවත්ව සිටී ද? : ඔව් [ ] නැත [ ]

17. ඉහත දී කරන ලද සහ දැනට කරන රක්ෂා (දිනත් සමඟ)

| සිට | දක්වා | රැකියාව | ස්ථානය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

18. ඉල්ලුම්කරු සතු දේපලවල වටිනාකම : රු. [ ]

19. මාසික ආදායම : රු. [ ]

20. කොපමණ ණය ගැතිද, ඇතොත් : රු. [ ]

21. පසුගිය අවුරුදු 10 තුළ ඔබ ක්‍රියාකාරීව දේශපාලන කටයුතුවල නිරතව සිටියේ ද? : ඔව් [ ] නැත [ ]

22. ඔබ ආදායම් බදු ගෙවන්නෙක් ද ? : ඔව් [ ] නැත [ ]

23. ඔබට එරෙහිව අධිකරණයක අපරාධ නඩු තිබුනේ ද? තිබේ ද ? : ඔව් [ ] නැත [ ]

24. උසාවිවලින් දඬුවම් ලබා ඇතොත් ඒවායේ විස්තර : [ ]

25. පෞද්ගලික තොරතුරු විමසිය හැකි අය (ඒ අය ඔබව හොඳින් දන්නා වග කිවයුතු පුද්ගලයන් විය යුතුය)

| | |
|---|---|
| නම: | නම: |
| ලිපිනය: | ලිපිනය: |
| දුරකථන අංක: | දුරකථන අංක: |
| රැකියාව : | රැකියාව : |
| ඔබ දැන සිටි කාලපරිච්ඡේදය: | ඔබ දැන සිටි කාලපරිච්ඡේදය: |

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බැව් සහතික කරමි.

........................................ ........................................

ඉල්ලුම්කරුගේ අත්සන දිනය

<u>සටහන</u>

සියලුම සහතිකයන්හි පිටපත් ද මෙයට අමුණන්න'

03 - 1135

**අධිකරණ සේවා කොමිෂන් සභාව**

මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ ක්වාසි මණ්ඩලය සඳහා සභාපති හා සමාජිකයින් පත්කිරීම - 2026.

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති පුද්ගලයින් හට මේ සඳහා අයදුම් කළ හැක.

අයදුම්කරු මුස්ලිම් පුරුෂයෙකු විය යුතු අතර, පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිධාරියෙකු හෝ ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් පිළිගත් ආයතනයක් විසින් ප්‍රදානය කරන ලද සහතිකයක් දරන මෞලවි කෙනෙකු හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන අල් - ආලිම් සහතිකයක් දරන්නෙකු හෝ නීතිඥවරයෙකු හෝ ඊට සමාන වෘත්තිමය සුදුසුකම් දරන්නෙකු හෝ විශ්‍රාමික රජයේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු විය යුතු ය.

දැනට රාජ්‍ය සේවයේ නියුතු අයෙකුට (අධිකරණ නිලධාරියෙකු හැර) මේ සඳහා අයදුම් කළ නොහැක. අයදුම්කරු ඉස්ලාම් ආගම පිළිබඳ මනා දැනුමක් ඇති, වයස අවුරුදු 40 ට වැඩි, මනා ශාරීරික යෝග්‍යතාවයෙන් යුත්, යහපත් චරිතයක් ඇති, මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත හා ඉස්ලාම් නීතිය පිළිබඳ විශේෂිතවූ මනා දැනුමක් ඇති සහ සමාජය තුළ යහපත් පිළිගැනීමක් ඇති විවාහකයෙකු විය යුතු ය.

තෝරා ගනු ලබන අපේක්ෂකයා පත්වීම් ලිපියේ නිශ්චිතව සඳහන් කරනු ලබන කාලසීමාවක් සඳහා පත් කරනු ලැබේ.

ක්වාසි මණ්ඩලයේ සභාපතිවරයා හට මසකට රුපියල් 15,000/- ක දීමනාවක් සහ එක් රැස්වීමකට රුපියල් 3,750/- බැගින් මසකට රුපියල් 15,000/- ක උපරිමයට යටත්ව ගමන් වියදම් දීමනාවක් ද, සමාජිකයෙකුට රුපියල් 12,000/- ක දීමනාවක් සහ එක් රැස්වීමකට රුපියල් 2,000/- බැගින් මසකට රුපියල් 8,000/- ක උපරිමයට යටත්ව ගමන් වියදම් දීමනාවක් ද ගෙවනු ලැබේ.

මෙහි පහත දක්වා ඇති ආකෘති පත්‍රය අනුව සැකසූ අයදුම්පත්, ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ “ක්වාසි මණ්ඩලය” යනුවෙන් සඳහන් කොට **2026 අප්‍රේල් මස 17** දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් මා වෙත ලැබෙන සේ එවිය යුතු ය . අයදුම්පත් සමග ලිපි ලේඛනාදියෙහි මුල්පිටපත් එවිය යුතු නොවේ.

**ආනන්දි කනගරත්නම්,**
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2026 මාර්තු මස 27 දින,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය,
තැ.පෙ. 573,
කොළඹ 12.

**1965 අංක 1 සහ 1969 අංක 32 දරන මුස්ලිම් විවාහ හා දික්කසාද පනත්වලින් සංශෝධිත මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 වැනි පරිච්ඡේදය) යටතේ ක්වාසි මණ්ඩලයේ සභාපති හා සාමාජිකයින් පත්කිරීමේ ආදර්ශ අයදුම්පත**

---

**දිස්ත්‍රික්කය :-**

1. මුලකුරු සමග නම :

| | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | |

උදා :අබ්දුර් රහ්මාන් එම්.අයි.

2. සම්පූර්ණ නම :

| | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | |

උදා : මුහම්මදු ඉස්හාක් අබ්දුර් රහ්මාන්

3. ස්ථිර පදිංචිය :

4. ලිපිනය :

5. උපන් දිනය :

| ව | ව | ව | ව | මා | මා | දි | දි |
|---|---|---|---|---|---|---|---|

6. වයස :

7. ජාතිය :

8. ආගම :

9. ජා.හැ.ප අංකය :

10. දුරකතන අංකය :

11. අධ්‍යාපන සුදුසුකම්

1. ____________________
2. ____________________
3. ____________________
4. ____________________
5. ____________________

12. වෘත්තීය සුදුසුකම් :

1. ____________________
2. ____________________
3. ____________________
4. ____________________
5. ____________________

13. කියවීමට හා ලිවීමට හැකි භාෂාවන්:

14. ඉස්ලාම් නීතිය පිළිබඳ දැනීමක් තිබේද: | ඔව් | | නැත | |

15. විවාහකද?: | ඔව් | | නැත | |

16. ඔබ නීතිඥවරයෙක් ද? : | ඔව් | | නැත | |

17. නීතිඥවරයෙකු නම් බඳවා ගන්නා ලද දිනය : | ව | ව | ව | ව | මා | මා | දි | දි |

18. ඉහත දී කරන ලද සහ දැනට කරන රක්ෂා (දිනත් සමඟ)

| සිට | දක්වා | රැකියාව | ස්ථානය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

19. ඉල්ලුම්කරු සතු දේපළවල වටිනාකම : රු.

20. මාසික ආදායම : රු.

21. කොපමණ ණය ගැතිද, ඇතොත් : රු.

22. පසුගිය අවුරුදු 10 තුළ ඔබ ක්‍රියාකාරීව දේශපාලන කටයුතුවල නිරතව සිටියේ ද? : | ඔව් | | නැත | |

23. ඔබ ආදායම් බදු ගෙවන්නෙක් ද ? : | ඔව් | | නැත | |

24. ඔබට එරෙහිව අධිකරණයක අපරාධ නඩු තිබුනේ ද? තිබේ ද ? : | ඔව් | | නැත | |

25. උසාවිවලින් දඬුවම් ලබා ඇතොත් ඒවායේ විස්තර :

25. පෞද්ගලික තොරතුරු විමසිය හැකි අය (ඒ අය ඔබව හොඳින් දන්නා වග කිවයුතු පුද්ගලයන් විය යුතුය)

| | |
|---|---|
| නම: | නම: |
| ලිපිනය: | ලිපිනය: |
| දුරකථන අංක: | දුරකථන අංක: |
| රැකියාව : | රැකියාව : |
| ඔබ දැන සිටි කාලපරිච්ඡේදය: | ඔබ දැන සිටි කාලපරිච්ඡේදය: |

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බැව් සහතික කරමි.

........................................ ........................................

**ඉල්ලුම්කරුගේ අත්සන** **දිනය**

*සටහන*

සියලුම සහතිකයන්හි පිටපත් ද මෙයට අමුණන්න.

03 - 1136

**ශ්‍රී ලංකා පොලීසිය**

ශ්‍රී ලංකා පොලීසියට උපසේවා සහකාර පොලිස් අධිකාරි, පිරිමි/ කාන්තා (නීති නිලධාරි) තනතුරට අයදුම්පත් කැඳවීම

2026.02.20 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍ර අංක 2477 හි 1 කොටස: (අ) වැනි කොටසේ පල කිරීම් යටතේ 02-222 නිවේදනයේ පළ කළ දැන්වීමෙහි අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය 2026.04.20 දින දක්වා දීර්ඝ කරමි.

**ප්‍රියන්ත වීරසූරිය,**
පොලිස්පති.

2026 මාර්තු මස 23 දින,
කොළඹ 02,
පොලිස් මූලස්ථානයේ දී ය.

03 - 1149

---

**ශ්‍රී ලංකා පොලීසිය**

පොලිස් කොස්තාපල් තනතුර (සාමාන්‍ය පොලිස් සේවය /විශේෂ කාර්ය බලකාය)

ශ්‍රී ලංකා පොලීසියේ ආධුනික පොලිස් කොස්තාපල් (සාමාන්‍ය) සහ පොලිස් කොස්තාපල් (විශේෂ කාර්ය බලකාය) තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**02.** www.police.lk වෙබ් අඩවියට පිවිස " join us" විකල්පය තෝරා ගැනීමෙන් (Click කිරීමෙන්) හෝ පහත සඳහන් QR කේතය ස්කෑන් (Scan) කිරීමෙන් අයදුම්පත වෙත ඇතුළත් වී මාර්ගගත ක්‍රමවේදය (Online) ඔස්සේ පමණක් අයදුම්පත් සම්පූර්ණ කර 2026.05.08 දිනට පෙර යොමුකල යුතු අතර, කිසිදු අයදුම්පතක් තැපැල් මගින් යොමු නොකළ යුතු ය. මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ යොමුකල අයදුම්පතේ පිටපතක් මූලික පරීක්ෂණය සඳහා පැමිණීමේ දී අයදුම්කරු විසින් රැගෙන පැමිණිය යුතු ය. (පිටපතේ අයදුම්කරු විසින් තම අත්සන යොදා තිබිය යුතු ය.)

(අ) මෙම නිවේදනයේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් අතර කිසියම් නොගැළපීමක් හෝ අනුකූලතාවයක් පවතීනම් සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

(ආ) සම්මුඛ පරීක්ෂණයට සහභාගිවීම පත්වීම පිරිනැමීම සඳහා සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලබයි.

(ඇ) මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් මා විසින් තීරණය කරනු ඇත.

(ඈ) තනතුරෙහි පවතින පුරප්පාඩු මත ප්‍රමුඛතාවය අනුව බඳවා ගැනීම් සිදු කිරීමෙන් අනතුරුව මෙම *ගැසට්* නිවේදනය අවලංගු වේ.

(ඉ) අයදුම්පත් ලැබෙන අනුපිළිවෙල අනුව සම්මුඛ පරීක්‍ෂණ පවත්වනු ලැබේ.

**03.** **වැටුප් ක්‍රමය - (මාසිකව) පොලිස් කොස්තාපල් තනතුර (සාමාන්‍ය)**

රු. 49,550-7x540-27 x 670 -රු. 71,420.00 (RS 01- 2025)

මෙම වැටුප් ගණනය කිරීම රා.ප.ව. අංක 10/ 2025 අනුව සිදු කර ඇත.

ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ඇත.

| | | රු. ශත |
|---|---|---|
| (අ) | මූලික වැටුප | 49,550.00 |
| (ආ) | ජීවන වියදම් දීමනාව | 17,800.00 |
| (ඇ) | නිල ඇඳුම් පිරිසිදු කිරීම් දීමනාව | 250.00 |
| (ඈ) | මූලික වැටුපෙන් 22% + රු.1250.00 | 12,151.00 |
| (ඉ) | ආහාර හා නවාතැන් දීමනාව | 28,800.00 |
| (ඊ) | දුෂ්කර දීමනාව | 2,000.00 |

පුහුණුවෙන් පසු ගෙවීම් කරනු ලබන දීමනා

| | | |
|---|---|---|
| (උ) | අර්ධද්වීප දීමනාව(යාපනය අර්ධද්වීපයට පමණි) | 2,400.00 |
| (ඌ) | සිගරට් දීමනාව (මෙහෙයුම් කලාප සඳහා) | 500.00 |

**වැටුප් ක්‍රමය - (මාසිකව) පොලිස් කොස්තාපල් තනතුර (විශේෂ කාර්ය බලකාය)**
**රු. 49,550-7x540-27 x 670 -රු. 71,420.00 (RS 01- 2025)**

මෙම වැටුප් ගණනය කිරීම රා.ප.ච. අංක 10/ 2025 අනුව සිදු කර ඇත.
තවද, මෙම නිලධාරීන් 2022.12.15 වැනි දිනැති ශ්‍රී ලංකා පොලිසියේ නිවේදන CRTM 260 RTM 385 පරිදි ලබාදෙනු ලබන දීමනාවලට ද හිමිකම් ලබයි. ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ඇත.

| | | රු. ශත |
|---|---|---|
| (අ) | මූලික වැටුප | 49,550.00 |
| (ආ) | ජීවන වියදම් දීමනාව | 17,800.00 |
| (ඇ) | නිල ඇඳුම් පිරිසිදු කිරීම් දීමනාව | 250.00 |
| (ඈ) | මූලික වැටුපෙන් 22% +රු.1250.00 | 12,151.00 |
| (ඉ) | ආහාර හා නවාතැන් දීමනාව | 28,800.00 |
| (ඊ) | දුෂ්කර දීමනාව | 2,000.00 |
| (උ) | දිරි දීමනාව | 1,500.00 |

පුහුණුවෙන් පසු ගෙවීම් කරනු ලබන දීමනා

| | | |
|---|---|---|
| (ඌ) | මූලික වැටුපෙන් 25% ( රාජකාරියේ යෙදවීමෙන් පසු ) | 12,387.50 |
| (එ) | ප්‍රභූ ආරක්ෂක (ප්‍රභූ ආරක්ෂක පාඨමාලාව හැදෑරීමෙන් පසු ) | 800.00 |
| (ඒ) | සීතල දීමනාව 8% ( හිමිකම ඇති කඳවුරුවලට පමණි) | 3,964.00 |
| (ඔ) | අර්ධද්වීප දීමනාව(යාපනය අර්ධද්වීපයට පමණි) | 2,400.00 |
| (ඕ) | සිගරට් දීමනාව (මෙහෙයුම් කලාප සඳහා) | 500.00 |
| (ඖ) | විවාහක දීමනාව( විවාහක නිලධාරීන් සඳහා) | 300.00 |

**මෙම දීමනාවලට අමතරව (විශේෂ කාර්ය බලකාය සහ සාමාන්‍ය පොලිස් සේවය )**

(අ) ප්‍රවාහන පහසුකම්

(ආ) නිලධාරීන්ට සුභසාධන වෛද්‍ය පහසුකම් (විදේශ රටක දී වුවද ප්‍රතිකාර කිරීමට මුදලින් ආධාර ලබා ගත හැකිය.)

(ඇ) නිල ඇඳුම්

(ඈ) සුදුසුකම් සපුරන නිලධාරීන්ට රාජ්‍ය විශ්වවිද්‍යාල, ජාතික පොලිස් අභ්‍යාස ආයතනය සහ ශ්‍රී ලංකා උසස් අධ්‍යාපන ආයතන මගින් පවත්වනු ලබන උපාධි හා ඩිප්ලෝමා පාඨමාලා හැදෑරීමට අවස්ථාව හිමිවේ.

(ඉ) තමාගේ ක්‍රීඩා කෞශල්‍යා හා සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම්

(ඊ) රාජකාරි සඳහා ගමන් වියදම් දීමනා, දුෂ්කර දීමනා හා විශිෂ්ට රාජකාරී සඳහා තෑගි වශයෙන් පොලිස් ත්‍යාග අරමුදලින් මුදල් ප්‍රදානය කරනු ලැබේ.

**04 මූලික සුදුසුකම්**

**4:1** අධ්‍යාපන සුදුසුකම්

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ගණිතය, විද්‍යාව, සිංහල/දෙමළ භාෂාව සහ ඉංග්‍රීසි භාෂාව ඇතුලුව විෂයයන් පහක් (05) සඳහා සම්මාන සමාර්ථ සහිතව විෂයයන් හයකින් (06) දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත් වීම;

*හෝ*

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ගණිතය, සිංහල හෝ දෙමළ භාෂාව ඇතුලුව විෂයයන් පහක් (05) සඳහා සම්මාන සමාර්ථ සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් විෂයයන් හයකින් (06) දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත් වීම;

*සහ*

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් එක් වරක දී විෂයයන් දෙකකින් සමත් වීම.

සටහන 01 **ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂය වර්ගීකරණය අනුව විෂය අංක 41 සහ 44 දරන විද්‍යා විෂය යුගලය එක් විෂයක් ලෙසද, අංක 42 සහ 45 දරන ගණිතය විෂය යුගලය එක් විෂයක් ලෙස ද සළකා විභාගයෙන් සමත් විෂය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.**

සටහන 02 **අ.පො.ස. (සා/පෙළ) විභාගයේ තාක්ෂණ විෂයෙහි ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුවද, එම විෂය අසමත් ලෙස සලකනු ලැබේ.**

සටහන 03 **වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂය අ.පො.ස. (සා/පෙළ) විෂය ධාරාවට ඇතුළත් නොවන හෙයින්, එම විෂයයන් සමත්වීම අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සමත් විෂයයක් ලෙස ගණනය කරනු නොලැබේ.**

**4:2** කායික සුදුසුකම්

**සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.**

**4:3** වෙනත්

4:3:1 ශ්‍රී ලංකා පුරවැසියෙකු වීම.

4:3:2 අයදුම්කරු යහපත් චරිතයකින් යුක්ත විය යුතු ය.

4:3:3 අයදුම්කරු අවිවාහක විය යුතු ය. (දික්කසාද වුවන්, වැන්දඹුවන් සහ අවිවාහකව දරුවන් සිටින අයවලුන් සුදුසුකම් නොලබයි)

4:3:4 දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.

4.3.5 උස අඩි 05 අඟල් 04 හෝ ඊට වැඩි විය යුතුයි. (සෙන්ටිමීටර් 162.56)

4.3.6 පපුව අවම වශයෙන් හුස්ම නාල්ලා අඟල් 30 ක් විය යුතු ය. (සෙන්ටිමීටර් 76.2)

4:3:7 උපැස් යුවලක් හෝ ස්පර්ශ කාච නොමැතිව එක් එක් ඇසෙහි අවම දෘෂ්ඨිය 6/12 ට අඩු නොවිය යුතුය, එක් ඇසක දෘෂ්ටිය 6/6 වන විට අනෙක් ඇසෙහි 6/18 ක් විය යුතු ය.

4:3:8 පොලිස් සේවයේ ගරුත්වයට නොගැලපෙන හා රාජකාරිවලට බාධා විය හැකි අන්දමේ කෘතිම ශාරීරික වෙනස්කම් කර නොතිබිය යුතු ය.

4:3:9 අයදුම්කරුගේ සමීප ඥාතීන් (මව, පියා, භාරකරු, සමීපව සම්බන්ධතා පවත්වන අවිවාහක හෝ විවාහක සහෝදරයන්/ සහෝදරියන් සහ ඔවුන්ගේ කලත්‍රයින්) අපරාධ වරදකට වරදකරු වී නොතිබීම.

සටහන 01 **තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 4:1සහ 4:4 යන සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් දිනට සම්පූර්ණ කර තිබිය යුතු අතර 4:2 හා 4:3 හි සුදුසුකම් බඳවා ගන්නා දිනටද ඒ ආකාරයෙන්ම තිබිය යුතු ය.**

සටහන 02 **ඉහත පටිපාටීන්ට පරිබාහිරව ජාත්‍යන්තර මට්ටමේ, ජාතික මට්ටමේ හෝ විශිෂ්ට ක්‍රීඩා කෞෂල්‍යයකින් යුක්තවූ හෝ වෙනත් ක්ෂේත්‍රයකින් සුවිශේෂී දක්ෂතා හෝ ප්‍රවීණතා පෙන්නුම් කර ඇති අයදුම්කරුවකුගේ උස පිළිබඳ සුදුසුකම් නොසලකා අනෙකුත් සුදුසුකම් සපුරා ඇත්නම් පත්කිරීම් බලධරයාගේ අභිමතය පරිදි බඳවා ගත හැකිය.**

**4:4** වයස

*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18-24 ත් අතර විය යුතු ය.

**05.** බඳවා ගැනීමේ ක්‍රමය

**i.** **මූලික පරීක්ෂණය:**

අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් අතරින් සුදුසුකම් සහ වයස සපුරා ඇති අයදුම්කරුවන් පමණක් මූලික පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. එම පරීක්ෂණයේ දී ඉහත ඡේද 4:1, 4:2 හා 4:4 (4:3:1 , 4:3:2,4.3.4 ,4.3.7, 4.3.9 හැර) සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

**ii.** **ඔරොත්තු දීමේ පරීක්ෂණය:**

මූලික පරීක්ෂණයට පෙනී සිටින අයදුම්කරුවන් පොලිස්පතිවරයා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ඔරොත්තුදීමේ පරීක්ෂණයට පෙනී සිටිය යුතුය. අයදුම්කරුවන් විසින් ඔරොත්තුදීමේ පරීක්ෂණයට මුහුණ දීමට නුසුදුසු නොවන බවට කැඳවීම් ලිපිය සමඟ අමුණා එවනු ලබන පෝරමය ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරයෙකුගේ නිර්දේශය සහිතව එම අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතු ය.

| *ක්‍රියාකාරකම* | *කාලය* | *ලකුණු* |
|---|---|---|
| දුර දිවීමේ මීටර /Run meters 1000 | විනාඩි 03 ට අඩු නම් | 30 |
| | විනාඩි 03 ත් 04 ත් අතර | 20 |
| | විනාඩි 04 ත් 05 ත් අතර | 10 |
| | විනාඩි 05 ට වැඩිනම් | අසමත් |
| Chinup (වාර 05 ක්) | විනාඩි 01 යි | එක් වාරයකට ලකුණු 03 බැගින් උපරිම ලකුණු 15 කි |
| Pushup (වාර 15 ක්) | විනාඩි 01 යි | වාරයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 15 කි |
| Situp (වාර 15 ක්) | විනාඩි 01 යි | වාරයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 15 කි |
| Squat Thrust (වාර 15 ක්) | විනාඩි 01 යි | වාරයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 15 කි |
| Kim Gem (මතකය පරීක්ෂා කිරීම) | අයිතමයන් නිරීක්ෂණය කිරීම සඳහා තත්පර 30 යි<br>ධාරණය කර ගැනීමට තත්පර 30 යි<br>ලිවීමට තත්පර 120 යි | එක් අයිතමයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 10 කි |

**සටහන :** **1**. මීටර් 1000 ක දුරක් විනාඩි 05 ක කාලයක දී දිවීමට අසමත්වන අයදුම්කරුවන් යෝග්‍යතා පරීක්ෂණයෙන් අසමත් ලෙස සලකනු ලැබේ.

**2.** සාමාන්‍ය පොලිස් සේවය සඳහා බඳවාගැනීමේ දී ඉහත අභ්‍යාස වලින් මුළු ලකුණු 50%ක්ද පොලිස් විශේෂ කාර්ය බලකාය සඳහා බඳවාගැනීමේ දී ඉහත අභ්‍යාස වලින් මුළු ලකුණු 60%ක්ද යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් කඩඉම් ලකුණු ප්‍රමාණය ලෙසට සලකනු ලැබේ.

**06.** ලිඛිත විභාගය

ඔරොත්තුදීමේ පරීක්ෂණය පවත්වා අවසන් වීමෙන් පසු ඉන් සමත්වන අයදුම්කරුවන් සඳහා ලිඛිත විභාගය පවත්වනු ලැබේ.

ලිඛිත විභාගය පහත විෂයයන් යටතේ පවත්වනු ලැබේ.

| ***විෂයයන්*** | ***උපරිම ලකුණු ප්‍රමාණය*** | ***සමත් ලකුණු ප්‍රමාණය*** |
|---|---|---|
| 01. අවබෝධය හා භාෂා හැකියාව | 100 | 40 |
| 02. සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | 100 | 40 |

**07. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය**

ලිඛිත විභාගයෙන් සමත්වන අයදුම්කරුවන් අතරින් වැඩිම ලකුණු ලබාගත් අයදුම්කරුගේ සිට අවරෝහණ ක්‍රමයට සකස් කෙරෙන ප්‍රමුඛතා ලේඛනය අනුව, බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් පස් (5) ගුණයක් ( 1:5) පමණක් අවසන් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පොලිස්පතිවරයා විසින් පත් කරනු ලැබේ.

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 15 | 40 |
| 02. වෘත්තීය සුදුසුකම් | 15 | |
| 03. භාෂා හැකියාව | 10 | |
| 04. ක්‍රීඩා කුසලතාවය | 20 | |
| 05. නායකත්වය / ප්‍රජා සේවාවන් | 20 | |
| 06. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ දී දක්වන කුසලතාවය | 20 | |
| **එකතුව** | **100** | |

08. **පසුබිම් පරීක්ෂණය**

8:1 ලිඛිත විභාගයෙන් සහ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණු සංඛ්‍යාව එකතු කොට අයදුම්කරුවන් ලබාගත් මුළු ලකුණු සංඛ්‍යාව අවරෝහණ ක්‍රමයට සකස් කර ප්‍රමුඛතා ලේඛනයක් සකස් කරනු ලැබේ. ඉන් අනතුරුව පවතින පුරප්පාඩු ප්‍රමාණය සැළකිල්ලට ගනිමින් එම පුරප්පාඩු ප්‍රමාණය සම්පූර්ණවන තෙක් අවශ්‍ය අයදුම්කරුවන් ප්‍රමාණයක් පසුබිම් පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

8:2 අයදුම්කරුවන්ගේ අයහපත් චරිතය අනාවරණය කර ගැනීම සඳහා ඔහු හා ඔහුගේ සමීප ඥාතීන්ගේ ද, ඔහු සමීපව ඇසුරු කරන්නන්ගේ ද අයහපත් චරිතය හා හැසිරීම සම්බන්ධව අයදුම්කරු පදිංචි පොලිස් ස්ථානය, පොලිස් විශේෂ කාර්යාංශය හා රාජ්‍ය බුද්ධි සේවය මගින් පසුබිම් පරීක්ෂණ වාර්තා කැඳවනු ලබන අතර, එහි දී අයහපත් පසුබිම් වාර්තා සහිත අයදුම්කරුවන් නුසුදුස්සන් සේ සළකුණු ලැබේ.

**09. වෛද්‍ය පරීක්ෂණය**

වෛද්‍ය පරීක්ෂණය සඳහා තෝරාගත් අයදුම්කරුවන් සෞඛ්‍ය 169 පෝරමය සම්පූර්ණ කර පොලිස් රෝහල වෙත ඉදිරිපත් කළ යුතුය. මෙහි දී අයදුම්කරුවන් පොලිස් රාජකාරි ඉටුකිරීම සඳහා සුදුසු බවට සහ ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක රාජකාරී කිරීමට සුදුසු බවට ශාරීරික හා මානසික යෝග්‍යතාව සම්බන්ධයෙන් වෛද්‍ය පරීක්ෂණයකට ද භාජනය කරනු ලැබේ. අයදුම්කරුවන් පොලිස් රෝහල විසින් පවත්වනු ලබන අදාළ වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් විය යුතු ය. සෞඛ්‍ය 169 පෝරම සහ ශ්‍රී ලංකා පොලිස් පූර්ව පත්වීම් වෛද්‍ය ඇමුණුම යන වාර්තා 02 මගින්ම යෝග්‍යතාවය තහවුරු කරන අයදුම්කරුවන් පමණක් පවතින පුරප්පාඩු මත බඳවා ගැනීම සඳහා සලකා බලනු ලැබේ. වෛද්‍ය පරීක්ෂණයට භාජනය විය හැක්කේ එක් වරක් පමණි.

**10. පුහුණුව**

10:1 ඉහත පරීක්ෂණ සියල්ලන්ගෙන් සමත්වන අයදුම්කරුවන් පමණක් උපයාගත් ලකුණු ප්‍රමාණයේ අවරෝහණ ක්‍රමයට පවතින පුරප්පාඩු ප්‍රමාණය මත පත්කිරීමේ බලධාරියා විසින් නියම කරනු ලබන දිනක දී පුහුණුව සඳහා කැඳවනු ලැබේ.

10:2 මූලික පුහුණුව ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ දී ලබාදීම සිදුකරනු ලැබේ.

10:3 මූලික පුහුණුව සාර්ථකව අවසන් නොකරන නිලධාරින්ගේ මූලික පුහුණු කාලය දීර්ඝ කිරීම හෝ අවස්ථානුකූලව පත්වීම

අවලංගු කිරීම පත්කිරීමේ බලධාරියා විසින් තීරණය කරනු ලැබේ. එම තීරණය ප්‍රකාරව මූලික පුහුණුව දීර්ඝ කිරීමක් කළ හොත් එම කාලයට සමාන කාල සීමාවකින් පරිවාස කාලය දීර්ඝ කරනු ලැබේ.

**11. සේවා කොන්දේසි**

11:1 තෝරා ගනු ලබන අයදුම්කරුවන් පහත 11:3 වගන්තියට යටත්ව තුන් (03) අවුරුදු ආධුනික කාලපරිච්ඡේදයක් සම්පූර්ණ කළ යුතු ය.

11:2 තෝරා ගනු ලබන අයදුම්කරුවන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් සම්පාදිතව පවත්නා සහ මින් මතු ඒ සම්බන්ධයෙන් සම්පාදනය කරනු ලබන කිසියම් නියෝග වෙතොත් ඒවාට ද අනුකූලව කටයුතු කළ යුතු ය.

11:3 පොලිස් ආඥාපනතේ විධිවිධාන ඇතුළුව ජාතික පොලිස් කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, කොන්දේසි සහ චක්‍රලේඛ, ආයතන සංග්‍රහයේ විධි විධාන, මුදල් රෙගුලාසි, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, භාණ්ඩාගාර චක්‍රලේඛ, ශ්‍රී ලංකා පොලිස් නියෝග, පොලිස් *ගැසට්* නිවේදන, පොලිස්පති චක්‍රලේඛ, වෙනත් උපදෙස් සංග්‍රවල විධිවිධාන සහ පත්වීම් ලිපියේ ඇතුළත් කොන්දේසිවලටද යටත් විය යුතු ය.

11:4 පරිවාස කාලය තුළ, සිටින නිලධාරියෙකු සම්බන්ධයෙන්වන සුවිශේෂී කරුණු පිළිබඳව සළකා බලා පොලිස්පතිවරයා හෝ පොලිස්පතිවරයා විසින් නම් කරන ලද නිලධරයකුගේ විශේෂ අවසරයක් ඇතුව මිස විවාහ විය නොහැක.

11:5 බඳවා ගන්නා අයදුම්කරුවන් බඳවා ගන්නා අවස්ථාවේ දී අවුරුදු 05 ක අනිවාර්ය සේවා කාලයක් සඳහා ගිවිසුමකට ඇතුළත් විය යුතු ය. මෙම ගිවිසුමේ කොන්දේසි උල්ලංඝනය කරන අවස්ථාවන්හි දී පවත්නා නීති/ ආයතන සංග්‍රහය/ කාර්ය පටිපාටික රීති සහ ජාතික පොලිස් කොමිෂන් සභාවේ විධි විධානයන්ට යටත්ව කටයුතු කරනු ලැබේ.

11:6 බඳවා ගැනීමේ දී අයදුම්කරුවන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම ඔහු බඳවා ගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු සැපයූ බවට බඳවා ගැනීමෙන් පසුව හෙළිවුවහොත් ඕනෑම අවස්ථාවක දී සේවයෙන් ඉවත් කරනු ලැබේ.

**12.** තනතුරේ ස්වභාවය ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
(විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත්විය යුතු ය.)

**13. පත්වීම ස්ථිර කිරීම.**

13:1 පරිවාස කාලය තුළ දී ආධුනික ගොනුවක් පවත්වා ගෙන යා යුතුය. පරිවාස කාලය අවසානයේ දී එම නිලධාරින්ගේ සේවය ස්ථිර කිරීම, පත්කිරීමේ බලධරයා හෝ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් බලය අභිනියෝජිත බලධරයා විසින් සිදු කරනු ලැබේ.

13:2 පරිවාස කාලය තුළ දී පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත්වීමට අපොහොසත්වන නිලධාරින්ගේ ජ්‍යෙෂ්ඨතාවය, කාර්ය පටිපාටික රීති අනුව තීරණය කරුනු ලබයි.

13:3 පරිවාස කාලයකට යටත්කොට ඇති නිලධාරියෙකුගේ පත්වීම ස්ථිර කිරීම, පරිවාස කාලය දීර්ඝ කිරීම හෝ පත්වීම අවසන් කිරීම පවත්නා කාර්ය පටිපාටික රීතීන්හි විධිවිධානයන්ට අනුකූලව පත්කිරීමේ බලධරයා හෝ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් බලය අභිනියෝජිත බලධරයා විසින් සිදු කරනු ලැබේ.

**14. කාර්යක්ෂමතා කඩඉම :**

| *කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග* | *කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද* | *කාර්යක්ෂමතා කඩඉම් ස්වභාවය ලිඛිත පරීක්ෂණය/ වෘත්තිය පරීක්ෂණය/ සහතික පාඨමාලාව/ වෙනත්* |
|---|---|---|
| පළමුවන කාර්යක්ෂමතා කඩඉම (සේවය ස්ථිර කිරීමේ පරීක්ෂණය) | පොලිස්කොස්තාපල් තනතුරට පත්වී වසර 03ක් ගතවීමට පෙර | ලිඛිත , ප්‍රායෝගික හා වාචික |
| දෙවන කාර්යක්ෂමතා කඩඉම | පොලිස් සැරයන් තනතුරට පත්වී වසර 03ක් ගතවීමට පෙර | තනතුරට හැඩගැස්වීමේ පුහුණු පාඨමාලාව සාර්ථකව හදාරා ඇති බවට සහතික පත්‍රය ලබා තිබීම |

| *කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග* | *කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද* | *කාර්යක්ෂමතා කඩඉම් ස්වභාවය ලිඛිත පරීක්ෂණය/ වෘත්තිය පරීක්ෂණය/ සහතික පාඨමාලාව/ වෙනත්* |
|---|---|---|
| **තුන්වන කාර්යක්ෂමතා කඩඉම** | **පොලිස් මහසැරයන් තනතුරට පත්වී වසර 03ක් ගතවීමට පෙර** | **තනතුරට හැඩගැස්වීමේ පුහුණු පාඨමාලාව සාර්ථකව හදාරා ඇති බවට සහතික පත්‍රය ලබා තිබීම** |

**15.** **භාෂා ප්‍රවීණතාව :**

| *භාෂාව* | *ලබා ගත යුතු ප්‍රවීණතාව* |
|---|---|
| රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරින් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පත්වීම් දින සිට වසර 03 ක් ඉකුත්වීමට පෙර ලබා ගත යුතුය. |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/ 2020 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබාගත යුතුය. |

16. මෙම *ගැසට්* පත්‍රයේ 1 කොටස (11 අ) ඡේදයේ ආරම්භයේ පළ කරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි බලපානු ඇත.

17. අයදුම්පත සම්පූර්ණ කිරීමේ දී අයදුම්කරුවන් සුදු පසුබිමේ ලබාගන්නා ලද පාස්පෝට් ප්‍රමාණයේ වර්ණ ඡායාරූපයක් හා පහත දැක්වෙන ලිපි ලේඛනවල පිටපත් අයදුම්පත් සම්පූර්ණ කරන අවස්ථාවේ දී උඩුගත (Upload) කළ යුතු ය.

(*අ*) උප්පැන්න සහතිකය
(*ආ*) ජාතික හැඳුනුම්පත
(*ඇ*) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික
(*ඈ*) වලංගු රියදුරු බලපත්‍රය
(*ඉ*) අයදුම්කරු තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවට ප්‍රකාශිත ආයතන ප්‍රධානියාගෙන් ලබාගන්නා ලද ලිපිය. (දැනටමත් රැකියාවක නිරතවන්නේ නම් පමණක් අදාළ වේ.) (අයදුම්පතේ අංක 18 ආකෘතිය යටතේ විය යුතු ය)
(*ඊ*) ඔබ රජයේ සේවයෙන් හෝ සන්නද්ධ සේවයෙන් ඉවත්ව ඇත්නම් ඉවත්වීමේ ලිපිය.

18. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතුව සිටින අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත යොමුකිරීමේ දී අයදුම්පතේ අනු. අංක 18 යටතේ ඇති පහත ආකෘතියට අනුව සකස්කරන ලද ලිපියක් ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව සහිතව උඩුගත (Upload) කළ යුතු ය.

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .................................................................................................
මහතා ................................................................................................ දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/ මණ්ඩලයේ/ යුධ හමුදා බලකායේ සේවයේ නියුතු අයෙකු බවත්, ඔහු මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවත් ප්‍රකාශ කරමි.

..........................................
ආයතන ප්‍රධානියාගේ අත්සන
නම.................................
දිනය ................................
නිල මුද්‍රාව

*සටහන* - **පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කරුවන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ශ්‍රී ලංකා පොලිසිය විසින් ගෙවනු නොලැබේ.**

**ප්‍රියන්ත වීරසූරිය,**
පොලිස්පති.

03 - 1150/1

## ශ්‍රී ලංකා පොලීසිය

කාන්තා පොලිස් කොස්තාපල් තනතුර (සාමාන්‍ය පොලිස් සේවය /විශේෂ කාර්ය බලකාය)

ශ්‍රී ලංකා පොලිසියේ ආධුනික කාන්තා පොලිස් කොස්තාපල් තනතුර (සාමාන්‍ය) සහ ආධුනික කාන්තා පොලිස් කොස්තාපල් තනතුර (විශේෂ කාර්ය බලකාය) සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**02.** www.police.lk වෙබ් අඩවියට පිවිස "join us" විකල්පය තෝරා ගැනීමෙන් (Click කිරීමෙන්) හෝ පහත සඳහන් QR කේතය ස්කෑන් (Scan) කිරීමෙන් අයදුම්පත වෙත ඇතුළත් වී, මාර්ගගත ක්‍රමවේදය (Online) ඔස්සේ පමණක් අයදුම්පත් සම්පූර්ණ කර **2026.05.08** දිනට පෙර යොමුකළ යුතු අතර, කිසිදු අයදුම්පතක් තැපැල් මගින් යොමු නොකළ යුතු ය. මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ යොමුකළ අයදුම්පතේ පිටපතක් මූලික පරීක්ෂණය සඳහා පැමිණීමේ දී අයදුම්කාරිය විසින් රැගෙන පැමිණිය යුතු ය. (පිටපතේ අයදුම්කාරිය විසින් තම අත්සන යොදා තිබිය යුතු ය.)

- **2020.01.24 දිනැති රජයේ *ගැසට්* නිවේදන අංක 2160 හා 2020.02.14 දිනැති රජයේ *ගැසට්* නිවේදන අංක 2163 *ගැසට්* නිවේදනයන්ට අයදුම්පත් යොමුකළ කාන්තා පොලිස් කොස්තාපල් තනතුරට බඳවාගැනීමට සුදුසුකම් ලබා සිටි අයදුම්කාරියන් හට "වයස් සීමාව නොසලකා හැර" අනෙකුත් සුදුසුකම් සපුරා ඇත්නම් සාමාන්‍ය කාන්තා පොලිස් කොස්තාපල් තනතුරට පමණක් ඉල්ලුම්කළ හැක.**

(අ) මෙම නිවේදනයේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් අතර කිසියම් නොගැලපීමක් හෝ අනුකූලතාවයක් පවතීනම් සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

(ආ) සම්මුඛ පරීක්ෂණයට සහභාගීවීම පත්වීම පිරිනැමීම සඳහා සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලබයි.

(ඇ) මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් මා විසින් තීරණය කරනු ඇත.

(ඈ) තනතුරෙහි පවතින පුරප්පාඩු මත ප්‍රමුඛතාවය අනුව බඳවා ගැනීම් සිදු කිරීමෙන් අනතුරුව මෙම *ගැසට්* නිවේදනය අවලංගු වේ.

(ඉ) අයදුම්පත් ලැබෙන අනුපිළිවෙල අනුව සම්මුඛ පරීක්ෂණ පවත්වනු ලැබේ.

**03.** **වැටුප් ක්‍රමය -** (මාසිකව) **කාන්තා පොලිස් කොස්තාපල් තනතුර (සාමාන්‍ය)**

රු. 49,550-7 x 540-27x 670 - රු. 71,420.00 (RS 1-2025)

මෙම වැටුප් ගණනය කිරීම රා.ප.ච. අංක 10/ 2025 අනුව සිදු කර ඇත.

ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ඇත.

| | | *රු. ශත* |
|---|---|---|
| (අ) | මූලික වැටුප | 49,550.00 |
| (ආ) | ජීවන වියදම් දීමනාව | 17,800.00 |
| (ඇ) | නිල ඇඳුම් පිරිසිදු කිරීම් දීමනාව | 250.00 |
| (ඈ) | මූලික වැටුපෙන් 22% +රු.1250.00 | 12,151.00 |
| (ඉ) | ආහාර හා නවාතැන් දීමනාව | 28,800.00 |
| (ඊ) | දුෂ්කර දීමනාව | 2,000.00 |

පුහුණුවෙන් පසු ගෙවීම් කරනු ලබන දීමනා

| | | |
|---|---|---|
| (ඔ) | අර්ධද්වීප දීමනාව (යාපනය අර්ධද්වීපයට පමණි) | 2,400.00 |
| (ඕ) | සිගරට් දීමනාව (මෙහෙයුම් කලාප සඳහා) | 500.00 |

**වැටුප් ක්‍රමය - (මාසිකව) කාන්තා පොලිස් කොස්තාපල් තනතුර (විශේෂ කාර්ය බලකාය)**

රු. 49,550-7 x 540-27x 670 - රු. 71,420.00 (RS 1-2025)

මෙම වැටුප් ගණනය කිරීම රා.ප.ව. අංක 10/ 2025 අනුව සිදු කර ඇත.

තවද, මෙම නිලධාරිනියන් 2022.12.15 දිනැති ශ්‍රී ලංකා පොලිසියේ නිවේදන CRTM 260 RTM 385 පරිදි ලබාදෙනු ලබන දීමනාවලට ද හිමිකම් ලබයි. ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ඇත.

| | | *රු. ශත* |
|---|---|---|
| (අ) | මූලික වැටුප | 49,550.00 |
| (ආ) | ජීවන වියදම් දීමනාව | 17,800.00 |
| (ඇ) | නිල ඇඳුම් පිරිසිදු කිරීම් දීමනාව | 250.00 |
| (ඈ) | මූලික වැටුපෙන් 22% +රු. 1,250.00 | 12,151.00 |
| (ඉ) | ආහාර හා නවාතැන් දීමනාව | 28,800.00 |
| (ඊ) | දුෂ්කර දීමනාව | 2,000.00 |
| (උ) | දිරි දීමනාව | 1,500.00 |

පුහුණුවෙන් පසු ගෙවීම් කරනු ලබන දීමනා :

| | | *රු. ශත* |
|---|---|---|
| (ඌ) | මූලික වැටුපෙන් 25% ( රාජකාරියේ යෙදවීමෙන් පසු ) | 12,387.50 |
| (එ) | ප්‍රභූ ආරක්ෂක (ප්‍රභූ ආරක්ෂක පාඨමාලාව හැදෑරීමෙන් පසු ) | 800.00 |
| (ඒ) | සීතල දීමනාව 8% ( හිමිකම ඇති කඳවුරුවලට පමණි) | 3,964.00 |
| (ඔ) | අර්ධද්වීප දීමනාව (යාපනය අර්ධද්වීපයට පමණි) | 2,400.00 |
| (ඕ) | සිගරට් දීමනාව (මෙහෙයුම් කලාප සඳහා) | 500.00 |
| (ඖ) | විවාහක දීමනාව (විවාහක නිළධාරින් සඳහා) | 300.00 |

**මෙම දීමනාවලට අමතරව (සාමාන්‍ය පොලිස් සේවය සහ විශේෂ කාර්ය බලකාය)**

(අ) ප්‍රවාහන පහසුකම්
(ආ) නිලධාරිනියන්ට සුභසාධන වෛද්‍ය පහසුකම් (විදේශ රටක දී වුව ද ප්‍රතිකාර කිරීමට මුදලින් ආධාර ලබා ගත හැකිය.)
(ඇ) නිල ඇඳුම්
(ඈ) සුදුසුකම් සපුරන නිලධාරිනියන්ට රාජ්‍ය විශ්වවිද්‍යාල, ජාතික පොලිස් අභ්‍යාස ආයතනය සහ ශ්‍රී ලංකා උසස් අධ්‍යාපන ආයතන මගින් පවත්වනු ලබන උපාධි හා ඩිප්ලෝමා පාඨමාලා හැදෑරීමට අවස්ථාව හිමිවේ.
(ඉ) තමාගේ ක්‍රීඩා කෞශල්‍යා හා සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම්
(ඊ) රාජකාරි සඳහා ගමන් වියදම් දීමනා, දුෂ්කර දීමනා හා විශිෂ්ඨ රාජකාරි සඳහා තෑගි වශයෙන් පොලිස් ත්‍යාග අරමුදලින් මුදල් ප්‍රදානය කරනු ලැබේ.

**04. මූලික සුදුසුකම් :-**

**4:1 අධ්‍යාපන සුදුසුකම් :**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ගණිතය, විද්‍යාව, සිංහල/දෙමළ භාෂාව සහ ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් පහ (05) ක් සඳහා සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් (06) දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත්වීම;

*හෝ*

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ගණිතය, සිංහල හෝ දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් පහක් (05) සඳහා සම්මාන සාමාර්ථ සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් විෂයයන් හය (06) කින් දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත්වීම;

*සහ*

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් එක් වරක දී විෂයයන් දෙකකින් සමත්වීම.

සටහන 01 **ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂය වර්ගීකරණය අනුව විෂය අංක 41 සහ 44 දරන විද්‍යා විෂය යුගලය එක් විෂයයක් ලෙසද, අංක 42 සහ 45 දරන ගණිතය විෂය යුගලය එක් විෂයයක් ලෙස ද සලකා විභාගයෙන් සමත් විෂය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.**

සටහන 02 **අ.පො.ස. (සා/පෙළ) විභාගයේ තාක්‍ෂණ විෂයෙහි ලිඛිත පරීක්‍ෂණයෙන් අසමත්වීම එම විෂයේ ප්‍රායෝගික පරීක්‍ෂණය සමත් වුව ද, එම විෂය අසමත් ලෙස සලකනු ලැබේ.**

සටහන 03 වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂය අ.පො.ස. (සා/පෙළ) විෂය ධාරාවට ඇතුළත් නොවන හෙයින්, එම විෂයයන් සමත්වීම අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සමත් විෂයයක් ලෙස ගණනය කරනු නොලැබේ.

**4:2** කායික සුදුසුකම් :-

**සෑම අපේක්ෂිකාවකම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත වියයුතු ය.**

**4:3** වෙනත් :-

4:3:1 ශ්‍රී ලංකා පුරවැසියෙකු වීම.

4:3:2 අයදුම්කාරිය අයහපත් චරිතයකින් යුක්ත නොවීම.

4:3:3 අයදුම්කාරිය අවිවාහක විය යුතු ය. (දික්කසාද වූවන්, වැන්දඹුවන්, ගර්භනීව සිටීම සහ අවිවාහකව දරුවන් සිටින අයවලුන් සුදුසුකම් නොලබයි)

4:3:4 දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.

4.3.5 උස අඩි 05 අඟල් 01 හෝ ඊට වැඩි විය යුතුයි. (සෙන්ටිමීටර් 154.94)

4:3:6 උපැස් යුවලක් හෝ ස්පර්ශ කාච නොමැතිව එක් එක් ඇසෙහි අවම දෘෂ්ඨිය 6/12 ට අඩු නොවිය යුතු ය, එක් ඇසක දෘෂ්ටිය 6/6 වන විට අනෙක් ඇසෙහි 6/18 ක් විය යුතු ය.

4:3:7 පොලිස් සේවයේ ගරුත්වයට නොගැලපෙන හා රාජකාරිවලට බාධා විය හැකි අන්දමේ කෘතිම ශාරීරික වෙනස්කම් කර නොතිබිය යුතු ය.

4:3:8 අයදුම්කාරියගේ සමීප ඥාතීන් (මව, පියා, භාරකරු, සමීපව සම්බන්ධතා පවත්වන අවිවාහක හෝ විවාහක සහෝදරයන්/ සහෝදරියන් සහ ඔවුන්ගේ කලත්‍රයින්) අපරාධ වරදකට වරදකරු වී නොතිබීම.

සටහන 01: **තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 4:1 සිට 4:4 යන සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් දිනට සම්පූර්ණ කර තිබිය යුතු අතර 4:2 හා 4:3 හි සුදුසුකම් බඳවා ගන්නා දිනට ද ඒ ආකාරයෙන්ම තිබිය යුතු ය.**

සටහන 02: **ඉහත පටිපාටින්ට පරිබාහිරව ජාත්‍යන්තර මට්ටමේ, ජාතික මට්ටමේ හෝ විශිෂ්ඨ ක්‍රීඩා කෞශල්‍යයකින් යුක්තවූ හෝ වෙනත් ක්ෂේත්‍රයකින් සුවිශේෂී දක්‍ෂතා හෝ ප්‍රවීණතා පෙන්නුම් කර ඇති අයදුම්කාරියකගේ උස පිළිබඳ සුදුසුකම් නොසලකා අනෙකුත් සුදුසුකම් සපුරා ඇත්නම් පත්කිරීම් බලධරයාගේ අභිමතය පරිදි බඳවා ගත හැකිය.**

**4:4** වයස :

*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18-24 ත් අතර විය යුතු ය.

**05.** බඳවා ගැනීමේ ක්‍රමය :-

**i.** **මූලික පරීක්‍ෂණය:**
අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කාරියන් අතරින් සුදුසුකම් සහ වයස සපුරා ඇති අයදුම්කාරියන් පමණක් මූලික පරීක්‍ෂණය සඳහා කැඳවනු ලැබේ. එම පරීක්‍ෂණයේදී ඉහත ඡේද 4:1(4:3:1, 4:3:2, 4:3:4, 4:3:6, 4:3:8 හැර) සුදුසුකම් පරීක්‍ෂා කරනු ලැබේ.

**ii.** **ඔරොත්තු දීමේ පරීක්‍ෂණය:**
මූලික පරීක්‍ෂණයට පෙනී සිටින අයදුම්කාරියන් පොලිස්පති විසින් පත්කරනු ලබන මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ඔරොත්තුදීමේ පරීක්‍ෂණයට පෙනී සිටිය යුතු ය. අයදුම්කාරියන් විසින් ඔරොත්තුදීමේ පරීක්‍ෂණයට මුහුණදීමට නුසුදුසු නොවන බවට කැඳවීම් ලිපිය සමග අමුණා එවනු ලබන පෝරමය ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරයෙකුගේ නිර්දේශය සහිතව එම අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු ය.

| *ක්‍රියාකාරකම* | *කාලය* | *ලකුණු* |
|---|---|---|
| දුර දිවීමේ මීටර /Run meters 1000 | විනාඩි 03 ට අඩු නම් | 30 |
| | විනාඩි 03 ත් 04 ත් අතර | 20 |
| | විනාඩි 04 ත් 05 ත් අතර | 10 |
| | විනාඩි 05 ට වැඩිනම් | අසමත් |
| Chinup (වාර 05 ක්) | විනාඩි 01 යි | එක් වාරයකට ලකුණු 03 බැගින් උපරිම ලකුණු 15 කි |
| Pushup (වාර 15 ක්) | විනාඩි 01 යි | වාරයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 15 කි |
| Situp (වාර 15 ක්) | විනාඩි 01 යි | වාරයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 15 කි |
| Squat Thrust (වාර 15 ක්) | විනාඩි 01 යි | වාරයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 15 කි |
| Kim Gem (මතකය පරීක්‍ෂා කිරීම) | අයිතමයන් නිරීක්‍ෂණය කිරීම සඳහා තත්පර 30 යි<br>ධාරණය කර ගැනීමට තත්පර 30 යි<br>ලිවීමට තත්පර 120 යි | එක් අයිතමයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 10 කි |

*සටහන :* **1.** මීටර් 1000 ක දුරක් විනාඩි 05 ක කාලයකදී දිවීමට අසමත්වන අයදුම්කාරියන් යෝග්‍යතා පරීක්‍ෂණයෙන් අසමත් ලෙස සලකනු ලැබේ.

**2.** සාමාන්‍ය පොලිස් සේවය සඳහා බඳවාගැනීමේදී ඉහත අභ්‍යාසවලින් මුළු ලකුණු 50%ක්ද පොලිස් විශේෂ කාර්ය බලකාය සඳහා බඳවාගැනීමේදී ඉහත අභ්‍යාස වලින් මුළු ලකුණු 60%ක්ද යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් කඩඉම් ලකුණු ප්‍රමාණය ලෙසට සලකණු ලැබේ.

**06.** **ලිඛිත විභාගය :**

ඔරොත්තුදීමේ පරීක්‍ෂණය පවත්වා අවසන් වීමෙන් පසු ඉන් සමත්වන අයදුම්කාරියන් සඳහා ලිඛිත විභාගය පවත්වනු ලැබේ. ලිඛිත විභාගය පහත විෂයන් යටතේ පවත්වනු ලැබේ.

| ***විෂයයන්*** | ***උපරිම ලකුණු ප්‍රමාණය*** | ***සමත් ලකුණු ප්‍රමාණය*** |
|---|---|---|
| 01. අවබෝධය හා භාෂා හැකියාව | 100 | 40 |
| 02. සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්‍ෂණය | 100 | 40 |

**07.** **යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්‍ෂණය**

ලිඛිත විභාගයෙන් සමත් වන අයදුම්කාරියන් අතරින් වැඩිම ලකුණු ලබාගත් අයදුම්කාරියගේ සිට අවරෝහණ ක්‍රමයට සකස් කෙරෙන ප්‍රමුඛතා ලේඛණය අනුව, බඳවා ගැනීමට අපේක්‍ෂිත සංඛ්‍යාව මෙන් පස් (5) ගුණයක් ( 1:5) පමණක් අවසන් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්‍ෂණය සඳහා කැඳවනු ලැබේ. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්‍ෂණ මණ්ඩලය පොලිස්පති විසින් පත් කරනු ලැබේ.

| **ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ** | **උපරිම ලකුණු ප්‍රමාණය** | **තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය** |
|---|---|---|
| 01. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 15 | 40 |
| 02. වෘත්තීය සුදුසුකම් | 15 | |

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 03. භාෂා හැකියාව | 10 | 40 |
| 04. ක්‍රීඩා කුසලතාවය | 20 | |
| 05. නායකත්වය / ප්‍රජා සේවාවන් | 20 | |
| 06. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ දී දක්වන කුසලතාවය | 20 | |
| එකතුව | 100 | |

08. **පසුබිම් පරීක්ෂණය**

8:1 ලිඛිත විභාගයෙන් සහ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණු සංඛ්‍යාව එකතු කොට අයදුම්කාරියන් ලබාගත් මුලු ලකුණු සංඛ්‍යාව අවරෝහණ ක්‍රමයට සකස් කර ප්‍රමුඛතා ලේඛණයක් සකස් කරනු ලැබේ. ඉන් අනතුරුව පවතින පුරප්පාඩු ප්‍රමාණය සැළකිල්ලට ගනිමින් එම පුරප්පාඩු ප්‍රමාණය සම්පූර්ණ වන තෙක් අවශ්‍ය අයදුම්කාරියන් ප්‍රමාණයක් පසුබිම් පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

8:2 අයදුම්කාරියන්ගේ අයහපත් චරිතය අනාවරණය කර ගැනීම සඳහා ඇය හා ඇයගේ සමීප ඥාතීන්ගේද, ඇය සමීපව ඇසුරු කරන්නන්ගේද අයහපත් චරිතය හා හැසිරීම සම්බන්ධව අයදුම්කාරිය පදිංචි පොලිස් ස්ථානය, පොලිස් විශේෂ කාර්යාංශය හා රාජ්‍ය බුද්ධි සේවය මගින් පසුබිම් පරීක්ෂණ වාර්තා කැඳවනු ලබන අතර, එහිදී අයහපත් පසුබිම් වාර්තා සහිත අයදුම්කාරියන් නුසුදුස්සන් සේ සළකුණු ලැබේ.

**09. වෛද්‍ය පරීක්ෂණය**

වෛද්‍ය පරීක්ෂණය සඳහා තෝරාගත් අයදුම්කාරියන් සෞඛ්‍ය 169 පෝරමය සම්පූර්ණ කර පොලිස් රෝහල වෙත ඉදිරිපත් කළ යුතු ය. මෙහිදී අයදුම්කාරියන් පොලිස් රාජකාරි ඉටුකිරීම සඳහා සුදුසු බවට සහ ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක රාජකාරී කිරීමට සුදුසු බවට ශාරීරික හා මානසික යෝග්‍යතාව සම්බන්ධයෙන් වෛද්‍ය පරීක්ෂණයකටද භාජනය කරනු ලැබේ. අයදුම්කාරියන් පොලිස් රෝහල විසින් පවත්වනු ලබන අදාළ වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් විය යුතු ය. සෞඛ්‍ය 169 පෝරම සහ ශ්‍රී ලංකා පොලිස් පූර්ව පත්වීම් වෛද්‍ය ඇමුණුම යන වාර්තා 02 මගින්ම යෝග්‍යතාවය තහවුරු කරන අයදුම්කාරියන් පමණක් පවතින පුරප්පාඩු මත බඳවා ගැනීම සඳහා සලකා බලනු ලැබේ. වෛද්‍ය පරීක්ෂණයට භාජනය විය හැක්කේ එක් වරක් පමණි.

**10. පුහුණුව**

10:1 ඉහත පරීක්ෂණ සියල්ලන්ගෙන් සමත් වන අයදුම්කාරියන් පමණක් උපයාගත් ලකුණු ප්‍රමාණයේ අවරෝහණ ක්‍රමයට පවතින පුරප්පාඩු ප්‍රමාණය මත පත්කිරීමේ බලධාරියා විසින් නියම කරනු ලබන දිනකදී පුහුණුව සඳහා කැඳවනු ලැබේ.

10:2 මූලික පුහුණුව ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ දී ලබාදීම සිදුකරනු ලැබේ.

10:3 මූලික පුහුණුව සාර්ථකව අවසන් නොකරන නිලධාරිනියන්ගේ මූලික පුහුණු කාලය දීර්ඝ කිරීම හෝ අවස්ථානුකූලව පත්වීම අවලංගු කිරීම පත්කිරීමේ බලධාරියා විසින් තීරණය කරනු ලැබේ. එම තීරණය ප්‍රකාරව මූලික පුහුණුව දීර්ඝ කිරීමක් කළ හොත් එම කාලයට සමාන කාල සීමාවකින් පරිවාස කාලය දීර්ඝ කරනු ලැබේ.

**11. සේවා කොන්දේසි**

11:1 තෝරා ගනු ලබන අයදුම්කාරියන් පහත 11:3 වගන්තියට යටත්ව තුන් (03) අවුරුදු ආධුනික කාල පරිච්ඡේදයක් සම්පූර්ණ කළ යුතු ය.

11:2 තෝරා ගනු ලබන අයදුම්කාරියන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් සම්පාදිතව පවත්නා සහ මින් මතු ඒ සම්බන්ධයෙන් සම්පාදනය කරනු ලබන කිසියම් නියෝග වෙතොත් ඒවාටද අනුකූලව කටයුතු කළ යුතු ය.

11:3 පොලිස් ආඥාපනතේ විධිවිධාන ඇතුළුව ජාතික පොලිස් කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, කොන්දේසි සහ චක්‍රලේඛ, ආයතන සංග්‍රහයේ විධි විධාන, මුදල් රෙගුලාසි, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, භාණ්ඩාගාර චක්‍රලේඛ, ශ්‍රී ලංකා පොලිස්

නියෝග, පොලිස් ගැසට් නිවේදන, පොලිස්පති චක්‍රලේඛ, වෙනත් උපදෙස් සංග්‍රහවල විධිවිධාන සහ පත්වීම් ලිපියේ ඇතුළත් කොන්දේසිවලටද යටත් විය යුතු ය.

11:4 පරිවාස කාලය තුළ, සිටින නිලධාරිනියක සම්බන්ධයෙන් වන සුවිශේෂී කරුණු පිළිබඳව සළකා බලා පොලිස්පතිවරයා හෝ පොලිස්පතිවරයා විසින් නම් කරන ලද නිලධරයකුගේ විශේෂ අවසරයක් ඇතුව මිස විවාහ විය නොහැක.

11:5 බඳවා ගන්නා අයදුම්කාරියන් බඳවා ගන්නා අවස්ථාවේ දී අවුරුදු 05 ක අනිවාර්ය සේවා කාලයක් සඳහා ගිවිසුමකට ඇතුළත් විය යුතු ය. මෙම ගිවිසුමේ කොන්දේසි උල්ලංඝනය කරන අවස්ථාවන්හිදී පවත්නා නීති/ ආයතන සංග්‍රහය/ කාර්ය පටිපාටික රීති සහ ජාතික පොලිස් කොමිෂන් සභාවේ විධි විධානයන්ට යටත්ව කටයුතු කරනු ලැබේ.

11:6 බඳවා ගැනීමේදී අයදුම්කාරියන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම ඇය බඳවා ගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු සැපයූ බවට බඳවා ගැනීමෙන් පසුව හෙළිවුවහොත් ඕනෑම අවස්ථාවක දී සේවයෙන් ඉවත් කරනු ලැබේ.

**12. තනතුරේ ස්වභාවය :**

ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
(විශ්‍රාම වැටුප් ක්‍රමය පිලිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත්විය යුතු ය.)

**13. පත්වීම ස්ථිර කිරීම :**

13:1 පරිවාස කාලය තුළ දී ආධුනික ගොනුවක් පවත්වා ගෙන යා යුතු ය. පරිවාස කාලය අවසානයේදී එම නිලධාරිනියන්ගේ සේවය ස්ථිර කිරීම, පත්කිරීමේ බලධරයා හෝ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් බලය අභිනියෝජිත බලධරයා විසින් සිදු කරනු ලැබේ

13:2 පරිවාස කාලය තුළදී පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත්වීමට අපොහොසත්වන නිලධාරිනියන්ගේ ජ්‍යෙෂ්ඨතාවය, කාර්ය පටිපාටික රීති අනුව තීරණය කරනු ලබයි.

13:3 පරිවාස කාලයකට යටත්කොට ඇති නිලධාරිනියකගේ පත්වීම ස්ථිර කිරීම, පරිවාස කාලය දීර්ඝ කිරීම හෝ පත්වීම අවසන් කිරීම පවත්නා කාර්ය පටිපාටික රීතීන්හි විධිවිධානයන්ට අනුකූලව පත්කිරීමේ බලධරයා හෝ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් බලය අභිනියෝජිත බලධරයා විසින් සිදු කරනු ලැබේ.

**14. කාර්යක්ෂමතා කඩඉම :**

| *කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග* | *කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද* | *කාර්යක්ෂමතා කඩඉම් ස්වභාවය ලිඛිත පරීක්ෂණය/ වෘත්තිය පරීක්ෂණය/ සහතික පාඨමාලාව/ වෙනත්* |
|---|---|---|
| පළමුවන කාර්යක්ෂමතා කඩඉම (සේවය ස්ථිර කිරීමේ පරීක්ෂණය) | කාන්තා පොලිස් කොස්තාපල් තනතුරට පත්වී වසර 03ක් ගතවීමට පෙර | ලිඛිත , ප්‍රායෝගික හා වාචික |
| දෙවන කාර්යක්ෂමතා කඩඉම | කාන්තා පොලිස් සැරයන් තනතුරට පත්වී වසර 03ක් ගතවීමට පෙර | තනතුරට හැඩගැස්වීමේ පුහුණු පාඨමාලාව සාර්ථකව හදාරා ඇති බවට සහතික පත්‍රය ලබා තිබීම |
| තුන්වන කාර්යක්ෂමතා කඩඉම | කාන්තා පොලිස් මහසැරයන් තනතුරට පත්වී වසර 03ක් ගතවීමට පෙර | තනතුරට හැඩගැස්වීමේ පුහුණු පාඨමාලාව සාර්ථකව හදාරා ඇති බවට සහතික පත්‍රය ලබා තිබීම |

**15.** **භාෂා ප්‍රවීණතාව :**

| *භාෂාව* | *ලබා ගත යුතු ප්‍රවීණතාව* |
|---|---|
| රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරිනියන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පත්වීම් දින සිට වසර 03 ක් ඉකුත්වීමට පෙර ලබා ගත යුතු ය. |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/ 2020 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබාගත යුතු ය. |

16. මෙම *ගැසට්* පත්‍රයේ 1 කොටස (11 අ) ඡේදයේ ආරම්භයේ පල කරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි බලපානු ඇත.

17. අයදුම්කාරියන් සුදු පසුබිමේ ලබාගන්නා ලද පාස්පෝට් ප්‍රමාණයේ වර්ණ ඡායාරූපයක් හා පහත දැක්වෙන ලිපි ලේඛණවල පිටපත් අයදුම්පත් යොමුකරන අවස්ථාවේදී උඩුගත (Upload) කළ යුතු ය.

(*අ*) උප්පැන්න සහතිකය,
(*ආ*) ජාතික හැඳුනුම්පත,
(*ඇ*) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික,
(*ඈ*) වලංගු රියදුරු බලපත්‍රය
(*ඉ*) අයදුම්කාරිය තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවට ප්‍රකාශිත ආයතන ප්‍රධානියාගෙන් ලබාගන්නා ලද ලිපිය. (දැනටමත් රැකියාවක නිරතවන්නේ නම් පමණක් අදාල වේ.) (අයදුම්පතේ අංක 18 ආකෘතිය යටතේ විය යුතු ය),
(*ඊ*) ඔබ රජයේ සේවයෙන් හෝ සන්නද්ධ සේවයෙන් ඉවත්ව ඇත්නම් ඉවත්වීමේ ලිපිය.

18. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතුව සිටින අයදුම්කාරියන් ඔවුන්ගේ අයදුම්පත යොමුකිරීමේදී අයදුම්පතේ අනු අංක 18 යටතේ ඇති පහත ආකෘතියට අනුව සකස්කරන ලද ලිපියක් ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව සහිතව සහිතව උඩුගත (Upload) කළ යුතු ය.

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .................................................................................... මෙනවිය ...................................................................................... දෙපාර්තමේන්තුවේ / සංස්ථාවේ/ මණ්ඩලයේ/යුධ හමුදා බලකායේ සේවයේ නියුතු අයෙකු බවත්, ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවත් ප්‍රකාශ කරමි.

.........................................,
ආයතන ප්‍රධානියාගේ අත්සන,
නම.................................,
නිල මුද්‍රාව.

දිනය : .................................

*සටහන* - **පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කාරියන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ශ්‍රී ලංකා පොලිසිය විසින් ගෙවනු නොලැබේ.**

**ප්‍රියන්ත වීරසූරිය,**
පොලිස්පති.

03 - 1150/2

**ශ්‍රී ලංකා පොලීසිය**

පොලිස් කොස්තාපල් රියදුරු තනතුර (සාමාන්‍ය පොලිස් සේවය /විශේෂ කාර්ය බලකාය)

ශ්‍රී ලංකා පොලිසියේ ආධුනික පොලිස් කොස්තාපල් රියදුරු තනතුර (සාමාන්‍ය) පොලිස් කොස්තාපල් රියදුරු තනතුර (විශේෂ කාර්ය බලකාය) සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**02.** www.police.lk වෙබ් අඩවියට පිවිස “ join us “ විකල්පය තෝරා ගැනීමෙන් (Click කිරීමෙන්) හෝ පහත සඳහන් QR කේතය ස්කෑන් (Scan) කිරීමෙන් අයදුම්පත වෙත ඇතුළත් වී, මාර්ගගත ක්‍රමවේදය (Online) ඔස්සේ පමණක් අයදුම්පත් සම්පූර්ණ කර 2026.05.08 දිනට පෙර යොමුකළ යුතු අතර, කිසිදු අයදුම්පතක් තැපැල් මගින් යොමු නොකළ යුතු ය. මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ යොමුකල අයදුම්පතේ පිටපතක් මූලික පරීක්ෂණය සඳහා පැමිණිමේදී අයදුම්කරු විසින් රැගෙන පැමිණිය යුතු ය. (පිටපතේ අයදුම්කරු විසින් තම අත්සන යොදා තිබිය යුතු ය.) :

**(අ)** **මෙම නිවේදනයේ සිංහල,දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් අතර කිසියම් නොගැලපීමක් හෝ අනුකූලතාවයක් පවතිනම් සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කළ යුතු ය;**

**(ආ)** **සම්මුඛ පරීක්ෂණයට සහභාගිවීම පත්වීම පිරිනැමීම සඳහා සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලබයි;**

**(ඇ)** **මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් මා විසින් තීරණය කරනු ඇත;**

**(ඈ)** **තනතුරෙහි පවතින පුරප්පාඩු මත ප්‍රමුඛතාවය අනුව බඳවා ගැනීම් සිදු කිරීමෙන් අනතුරුව මෙම *ගැසට්* නිවේදනය අවලංගු වේ;**

**(ඉ)** **අයදුම්පත් ලැබෙන අනුපිළිවෙල අනුව සම්මුඛ පරීක්ෂණ පවත්වනු ලැබේ.**

**03.** **වැටුප් ක්‍රමය .- (මාසිකව)- පොලිස් කොස්තාපල් රියදුරු තනතුර (සාමාන්‍ය)**

රු. 49,550-7x540-27 x 670 -රු. 71,420.00 (RS 01- 2025)

මෙම වැටුප් ගණනය කිරීම රා.ප.ව. අංක 10/ 2025 අනුව සිදු කර ඇත.

ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ඇත:

| | | *රු. ශත* |
|---|---|---|
| (*අ*) | මූලික වැටුප | 49,550.00 |
| (*ආ*) | ජීවන වියදම් දීමනාව | 17,800.00 |
| (*ඇ*) | නිල ඇඳුම් පිරිසිදු කිරීම් දීමනාව | 250.00 |
| (*ඈ*) | මූලික වැටුපෙන් 22% +රු.1250.00 | 12,151.00 |
| (*ඉ*) | ආහාර හා නවාතැන් දීමනාව | 28,800.00 |
| (*උ*) | දුෂ්කර දීමනාව | 2,000.00 |

පුහුණුවෙන් පසු ගෙවීම් කරනු ලබන දීමනා :

| | | |
|---|---|---|
| (*ඔ*) | අර්ධද්වීප දීමනාව (යාපනය අර්ධද්වීපයට පමණි) | 2,400.00 |
| (*ඕ*) | සිගරට් දීමනාව (මෙහෙයුම් කලාප සඳහා) | 500.00 |

**වැටුප් ක්‍රමය .- (මාසිකව)- පොලිස් කොස්තාපල් රියදුරු තනතුර (විශේෂ කාර්ය බලකාය)**

රු. 49,550-7x540-27 x 670 -රු. 71,420.00 (RS 01- 2025)

මෙම වැටුප් ගණනය කිරීම රා.ප.ව. අංක 10/ 2025 අනුව සිදු කර ඇත.

තවද, මෙම නිලධාරින් 2022.12.15 දිනැති ශ්‍රී ලංකා පොලිසියේ නිවේදන CRTM 260 RTM 385 පරිදි ලබාදෙනු ලබන දීමනාවලට ද හිමිකම් ලබයි. ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ඇත.

| | | රු. ශත |
|---|---|---|
| (අ) | මූලික වැටුප | 49,550.00 |
| (ආ) | ජීවන වියදම් දීමනාව | 17,800.00 |
| (ඇ) | නිල ඇඳුම් පිරිසිදු කිරීම් දීමනාව | 250.00 |
| (ඈ) | මූලික වැටුපෙන් 22% +රු.1250.00 | 12,151.00 |
| (ඉ) | ආහාර හා නවාතැන් දීමනාව | 28,800.00 |
| (ඊ) | දුෂ්කර දීමනාව | 2,000.00 |
| (උ) | දිරි දීමනාව | 1,500.00 |

පුහුණුවෙන් පසු ගෙවීම් කරනු ලබන දීමනා :

| | | |
|---|---|---|
| (ඌ) | මූලික වැටුපෙන් 25% ( රාජකාරියේ යෙදවීමෙන් පසු ) | 12,387.50 |
| (එ) | ප්‍රභූ ආරක්ෂක (ප්‍රභූ ආරක්ෂක පාඨමාලාව හැදෑරීමෙන් පසු ) | 800.00 |
| (ඒ) | සීතල දීමනාව 8% ( හිම්කම ඇති කඳවුරු වලට පමණි) | 3,964.00 |
| (ඔ) | අර්ධද්වීප දීමනාව(යාපනය අර්ධද්වීපයට පමණි) | 2,400.00 |
| (ඕ) | සිගරට් දීමනාව (මෙහෙයුම් කලාප සඳහා) | 500.00 |
| (ඖ) | විවාහක දීමනාව( විවාහක නිළධාරින් සඳහා) | 300.00 |

මෙම දීමනා වලට අමතරව (විශේෂ කාර්ය බලකාය සහ සාමාන්‍ය පොලිසිය) :

(අ) ප්‍රවාහන පහසුකම්

(ආ) නිලධාරින්ට සුභසාධන වෛද්‍ය පහසුකම් (විදේශ රටක දී වුව ද ප්‍රතිකාර කිරීමට මුදලින් ආධාර ලබා ගත හැකිය.)

(ඇ) සියලුම නිල ඇඳුම් ශ්‍රී ලංකා පොලිසියෙන් සපයනු ලැබේ.

(ඈ) සුදුසුකම් සපුරන නිලධාරින්ට රාජ්‍ය විශ්ව විද්‍යාල මගින් පවත්වනු ලබන උපාධි හා ඩිප්ලෝමා පාඨමාලා හැදෑරීමට අවස්ථාව හිමිවේ.

(ඉ) තමාගේ ක්‍රීඩා කෞශල්‍යා හා සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම්

(ඊ) රාජකාරි සඳහා ගමන් වියදම් ද දුෂ්කර සේවය හා විශිෂ්ඨ රාජකාරී සඳහා තෑගි වශයෙන් පොලිස් ත්‍යාග අරමුදලින් මුදල් ද ප්‍රදානය කරනු ලැබේ.

**04. අවශ්‍ය මූලික සුදුසුකම් :**

**4:1 වයස් සීමාව**

*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18-28 ත් අතර විය යුතු ය.

**4:2 අධ්‍යාපන සුදුසුකම්**

අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් ගණිතය හා මාධ්‍ය භාෂාව ඇතුලුව දෙවරකට නොවැඩි වාර ගණනක දී සම්මාන දෙකක් සහිතව විෂයයන් 06 කින් සමත් වීම.

**සටහන 01:** ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂය වර්ගීකරණය අනුව විෂය අංක 41 සහ 44 දරන විද්‍යා විෂයය යුගලය එක් විෂයයක් ලෙසද, අංක 42 සහ 45 දරන ගණිතය විෂයය යුගලය එක් විෂයයක් ලෙසද සලකා විභාගයෙන් සමත් විෂය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

**සටහන 02:** අ.පො.ස. (සා/පෙළ) විභාගයේ තාක්ෂණ විෂයය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුවද එම විෂයය අසමත් ලෙස සලකනු ලැබේ.

**4:3 වෘත්තීය සුදුසුකම් -**

සැහැල්ලු මෝටර් රථ හෝ බර වාහන පැදවීමේ වලංගු රියදුරු බලපත්‍රයක් ලබා තිබීම.

**සටහන 01: මෝටර් රථ කාර්මික ශිල්පය පිළිබඳ දැනීම හෝ මෝටර් රථ අලුත්වැඩියාව පිළිබඳ පළපුරුද්ද හෝ දිගුකාලීනව රිය පැදවීමේ පලපුරුද්ද වෙනුවෙන් ප්‍රමුඛතාවය දෙනු ලැබේ.**

**4:3 කායික සුදුසුකම්**

- උස අඩි 05 අඟල් 02 හෝ ඊට වැඩි විය යුතු යි. (සෙන්ටිමීටර් 157.48 )
- පපුව අඟල් 30 හෝ ඊට වැඩි විය යුතු යි. (සෙන්ටිමීටර් 76) හුස්ම නාල්ලා

4:3:1 සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

4:3:2 **දෘෂ්ටිය පිළිබඳ අවශ්‍යතාවයන් -** උපැස් යුවලක් හෝ ස්පර්ශ කාච නොමැතිව එක් එක් ඇසෙහි අවම දෘෂ්ටිය 6/12 ට අඩු නොවිය යුතුය, එක් ඇසක දෘෂ්ටිය 6/6 වන විට අනෙක් ඇසෙහි 6/18 ක් විය යුතු ය. උපැස් යුවලක් හෝ ස්පර්ශ කාච පාවිච්චි කරන කවර හෝ අයදුම්කරුවෙකු සුදුස්සෙකු නොවනු ඇත.

4:3:3 පොලිස් සේවයේ ගරුත්වයට නොගැලපෙන හා රාජකාරීවලට බාධා විය හැකි අන්දමේ කෘතිම ශාරීරික වෙනස්කම් කර නොතිබිය යුතු ය.

**4:4 වෙනත් සුදුසුකම්**

4:4:1 ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතු ය.

4:4:2 අයදුම්කරු අයහපත් චරිතයකින් යුක්ත නොවිය යුතු ය.

4:4:3 අයදුම්කරු අවිවාහක විය යුතු ය. (දික්කසාද වූවන්, වැන්දඹුවන් සහ අවිවාහකව දරුවන් සිටින අයවලුන් සුදුසුකම් නොලබයි)

4:4:4 දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.

4:4:5 තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය වන 4:1 සහ 4:2 යන සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් දිනට සම්පූර්ණ කර තිබිය යුතු අතර 4:4 හි සුදුසුකම් බඳවා ගන්නා දිනටද ඒ ආකාරයෙන්ම තිබිය යුතු ය.

**05. මූලික පරීක්ෂණය :**

අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් අතරින් සුදුසුකම් සහ වයස සපුරා ඇති අයදුම්කරුවන් පමණක් මූලික පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. එම පරීක්ෂණයේදී ඉහත ඡේද 4:1, 4:2 හා 4:3 (4:3:1 හා 4:3:2 හැර) සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

මූලික පරීක්ෂණයට පෙනී සිටින අයදුම්කරුවන් පොලිස්පති විසින් පත්කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ඔරොත්තුදීමේ පරීක්ෂණයට පෙනී සිටිය යුතුය. අයදුම්කරුවන් විසින් ඔරොත්තුදීමේ පරීක්ෂණයට මුහුණදීමට සුදුසු බවට කැඳවීම් ලිපිය සමග අමුණා එවනු ලබන පෝරමය ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරයකුගේ නිර්දේශය සහිතව එම අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතු ය.

මූලික පරීක්ෂණයෙන් සමත් වන සියලු අයදුම්කරුවන් යෝග්‍යතා පරීක්ෂණයට යොමු කරන අතර, එහි දී මීටර් 1000 ක දුරක් විනාඩි 05 කට වඩා අඩු කාලයක් තුළදී සම්පූර්ණ කිරීම (දිවීම) යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් ලෙස සලකනු ලැබේ.

***සටහන :*** මීටර් 1000 ක දුරක් විනාඩි 05 ක කාලයකදී දිවීමට අසමත් වන අයදුම්කරුවන් යෝග්‍යතා පරීක්ෂණයෙන් අසමත් ලෙස සලකනු ලැබේ.

**06. වෘත්තීමය පරීක්ෂණය :**

මූලික පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් වෘත්තීමය පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. වෘත්තිය පරීක්ෂණය පහත විෂයන් යටතේ පවත්වනු ලැබේ.

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය | |
|---|---|---|---|
| 01. ලිඛිත | 40 | 20 | 50 % |
| 02. ප්‍රායෝගික පරීක්ෂණය | 60 | 30 | |

**07. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :**

මූලික පරීක්ෂණයෙන් හා වෘත්තීයමය පරීක්ෂණය සමත් වන අයදුම්කරුවන් පමණක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා යොමු කරනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පොලිස්පති විසින් පත් කරනු ලැබේ.

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 | අදාළ නොවේ |
| 02. කාර්මික දැනුම/ භාෂා දැනුම/ පරිගණක හැකියාව/ වෙනත් | 20 | |
| 03. ක්‍රීඩා කුසලතාවය | 20 | |
| 04. නායකත්වය / ප්‍රජා සේවාවන් | 20 | |
| 05. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ඇගයීම | 20 | |
| එකතුව | 100 | |

**08. බඳවා ගැනීමේ ක්‍රමවේදය :**

වෘත්තීය පරීක්ෂණයෙන් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණු සංඛ්‍යාව එකතු කොට අයදුම්කරුවන් ලබා ගත් මුලු ලකුණු සංඛ්‍යාව අවරෝහණ ක්‍රමයට සකස් කරනු ලැබේ. එම ලකුණු අනු පිළිවෙල අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් 125 % ක අයදුම්කරුවන් ගණනක් පසුබිම් පරීක්ෂණ සහ වෛද්‍ය පරීක්ෂණයන්ට කැඳවා ඉන් සමත්වන අයදුම්කරුවන් පවතින පුරප්පාඩු සංඛ්‍යාව මත තනතුරට බඳවා ගනු ලැබේ.

*සටහන :* ඉහත පටිපාටින්ට පරිබාහිරව ජාත්‍යන්තර මට්ටමේ, ජාතික මට්ටමේ හෝ විශිෂ්ඨ ක්‍රීඩා කෞශල්‍යයකින් යුක්තවූ හෝ වෙනත් ක්ෂේත්‍රයකින් සුවිශේෂී දක්ෂතා හෝ ප්‍රවීණතා පෙන්නුම් කර ඇති අයදුම්කරුවකුගේ උස සහ පපුව පිළිබඳ සුදුසුකම් නොසලකා අනෙකුත් සුදුසුකම් සපුරා ඇත්නම් පත්කිරීම් බලධාරියාගේ අභිමතය පරිදි බඳවා ගත හැකි ය.

**09. පසුබිම් පරීක්ෂණය :**

9:1 ඉහත ඡේද 08 පරිදි බඳවා ගැනීමට සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් සම්බන්ධයෙන් යහපත් චරිතය තහවුරු කරගැනීම සඳහා පසුබිම් පරීක්ෂණයක් පවත්වනු ලබයි.

9:2 මෙහි දී අයදුම්කරුගේ අයහපත් චරිතය අනාවරණය කර ගැනීම සඳහා ඔහු හා ඔහුගේ සමීප ඥාතීන්ද ඔහු සමීපව ඇසුරු කරන්නන්ගේ ද අයහපත් චරිතය හා හැසිරීම සම්බන්ධව පරීක්ෂණ පවත්වන ලබන අතර, අයහපත් පසුබිම් වාර්තා සහිත අයදුම්කරුවන් බඳවා ගනු නොලැබේ.

9:3 බඳවා ගැනීමේ දී අයදුම්කරුවන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම ඔහු බඳවා ගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු සැපයූ බව බඳවා ගැනීමෙන් පසුව හෙළිවුවහොත් ඕනෑම අවස්ථාවකදී පත්වීම අවලංගු කිරීම,සේවයෙන් පහ කිරීම සිදුකරනු ලැබේ.

*සටහන:* කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ වගන්ති 59 හි හා දැනට අනුමත බඳවා ගැනීම් පටිපාටියේ වගන්ති 7:2:4:5:2 හා පොලිස්පති චක්‍රලේඛ 2014/ 2007 හි සඳහන් කරුණුවලට අදාළව අසත්‍ය තොරතුරු සපයා පොලිස් සේවයට බැඳී ඇති බවට අනාවරණය වුවහොත් ඔබ සේවයෙන් ඉවත් කිරීමට ගනු ලබන තීරණයන්ට එකඟ විය යුතු ය.

**10. වෛද්‍ය පරීක්ෂණය :**

අයහපත් පසුබිම් වාර්තා නොමැති අයදුම්කරුවන් පමණක් වෛද්‍ය පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. තෝරාගත් අයදුම්කරුවන් අධ්‍යක්ෂ පොලිස් වෛද්‍ය සේවා ඇතුලු වෛද්‍ය මණ්ඩලයක් විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් විය යුතු ය. මෙහිදී අයදුම්කරුවන් පොලිස් රාජකාරි සඳහා සුදුසු බවට ශාරීරික හා මානසික යෝග්‍යතාව සම්බන්ධයෙන් වෛද්‍ය පරීක්ෂණයකට ද යොමු කරනු ලැබේ. වෛද්‍ය පරීක්ෂණයට භාජනය විය හැක්කේ එක් වරක් පමණි. වෛද්‍ය පරීක්ෂණය සෞඛ්‍ය 169 පෝරමයට අදාළව සිදු කරනු ලබයි. වෛද්‍ය මණ්ඩලය ප්‍රතික්ෂේප කරනු ලබන අයදුම්කරුවන්ට අභියාචනා ඉදිරිපත් කළ නොහැක.

**11. පුහුණුව :**

11:1 ඉහත පරීක්ෂණ සියල්ලන්ගෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් පවතින පුරප්පාඩු ප්‍රමාණය මත පොලිස්පති විසින් නියම කරනු ලබන දිනකදී පුහුණුව සඳහා කැඳවනු ලැබේ. මූලික පුහුණුව ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ ලබාදෙන අතර, ඉන් පසුව ආධුනික කාලය අවසන් වන තෙක් අදාල ක්ෂේත්‍ර පුහුණුව ලබා දීම සිදුකරනු ලැබේ.

11:2 මූලික පුහුණුව සාර්ථකව අවසන් නොකරන නිලධාරින්ගේ මූලික පුහුණු කාලය දීර්ඝ කිරීම හෝ අවස්ථානුකූලව පත්වීම අවලංගු කිරීම පත්කිරීම් බලධාරියා විසින් තීරණය කරනු ලැබේ.

**12. තනතුරේ ස්වභාවය :**

ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
(විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත්විය යුතු ය.)

**13. සේවා කොන්දේසි :**

13:1 තෝරා ගනු ලබන අයදුම්කරුවන් පහත 13:3 වගන්තියට යටත්ව තුන් (03) අවුරුදු ආධුනික කාල පරිච්ඡේදයක් සම්පූර්ණ කළ යුතු ය.

13:2 තෝරා ගනු ලබන අයදුම්කරුවන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් සම්පාදිතව පවත්නා සහ මින් මතු ඒ සම්බන්ධයෙන් සම්පාදනය කරනු ලබන කිසියම් නියෝග වෙතොත් ඒවාටද අනුකූලව කටයුතු කළ යුතු ය.

13:3 රාජ්‍ය සේවා කොමිෂන් සභා, ජාතික පොලිස් කොමිෂන් සභා චක්‍රලේඛ, ආයතන සංග්‍රහයේ විධි විධාන, මුදල් රෙගුලාසි, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, භාණ්ඩාගාර චක්‍රලේඛ, ශ්‍රී ලංකා පොලිස් නියෝග, පොලිස් ගැසට් නිවේදන, පොලිස්පති චක්‍රලේඛ, පොලිස් උපදෙස් සංග්‍රහවල විධි විධාන සහ පත්වීම් ලිපියේ ඇතුළත් කොන්දේසිවලටද යටත් විය යුතු ය.

13:4 ආධුනික කාලය පත්වීම් දින සිට මුල් වසර 03 ක් සඳහා බල පැවැත්වෙන අතර, එම කාලය තුළ දී නිලධරයා හට විවාහ වීමට අවසර දෙනු නොලැබේ. විවාහ විය හැක්කේ පොලිස්පති චක්‍රලේඛවලින් ලබා දී ඇති උපදෙස් ප්‍රකාරව පමණි. මෙම රෙගුලාසිය උල්ලංඝනය කළ හොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

13:5 බඳවා ගන්නා අයදුම්කරුවන් පුහුණුව අවසන් කිරීමෙන් පසු අවුරුදු 05 ක අනිවාර්ය සේවා කාලයක් සේවය කළ යුතු ය. මෙම අනිවාර්ය සේවා කාලය අවසන් වීමට පෙර යම් නිලධරයෙකු තනතුරින් ඉල්ලා අස්වීමට අදහස් කරන්නේ නම්, ඔහුගේ පුහුණුව හා නිල ඇඳුම් ඇතුලු අනෙකුත් වියදම් වෙනුවෙන් නියම කරනු ලබන මුදල් සියල්ල ඉල්ලා අස්වීමේ ලිපිය භාර දෙන අවස්ථාවේදීම ගෙවීමට කැමැත්ත පල කිරීමේ ගිවිසුමකට එළඹිය යුතු ය. ඉල්ලා අස්වීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහය/ කාර්ය පටිපාටික රීති සහ ජාතික පොලිස් කොමිෂන් සභා හා රාජ්‍ය සේවා කොමිෂන් සභා විධි විධානයන්ට යටත්ව කටයුතු කරනු ලැබේ.

13:6 ඉදුරාම බඳවා ගන්නා සෑම නිලධාරියකුම පොලිස් සේවයට පළමුවෙන් පත් කරනු ලැබූ විට තමා සතු වූ ස්වකීය අයිතියෙන්ම ඇත්තාවූ හෝ නමට ලියා තිබෙන්නා වූ හෝ පවරා තිබෙන්නාවූ හෝ සියලුම වත්කම් පිළිබඳවද තමා විසින් දරනු ලැබූ සියලුම බැරකම් පිළිබඳවද විස්තර සිය පෞද්ගලික ලිපි ගොනුවේ ඇතුළත් කිරීම පිණිස (ප්‍රතිශෝධිත) අංක 261 දරන පොදු ආකෘති පත්‍රයේ ඇතුළත් කර පොලිස්පති වෙත සැපයිය යුතු ය.

නිලධාරියා විවාහ වූ වහාම ඉහත කී විස්තරය කලත්‍රයා සම්බන්ධවද ඇතුළත් කර සැපයිය යුතු ය.

ඉහත විස්තර කර ඇති ආකාරයේ අලුත් අයිතිවාසිකමක් හෝ වත්කමක් හෝ අත්කර ගනු ලැබුව හොත් එසේ අත්කර ගන්නා ලද අයිතිවාසිකම හෝ වත්කම පිළිබඳවද සම්පූර්ණ විස්තර තමාගේ පුද්ගලික ලිපි ගොනුවේ ඇතුළත් කිරීම සඳහා සෑම නිලධරයෙකු විසින්ම පොලිස්පති වෙත ලිඛිතව දැන්විය යුතු ය.

13:7 ආධුනික පොලිස් කොස්තාපල් රියදුරු නිලධාරින් ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ පුහුණුව ආරම්භ කළ වහාම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥා දිවුරුම් දිය යුතු ය.

**14. පත්වීම ස්ථිර කිරීම.**

14.1 බඳවාගත් නිලධාරින් වසර 03 ක කාලය තුළදී මාසිකව පවත්වනු ලබන ප්‍රගති ගොණුවක් මාස 33ක් පවත්වාගෙන යා යුතු ය. පරිවාස කාලය අවසානයේදී නිලධාරීන්ගේ සේවය පත්කිරීම් බලධරයා විසින් ස්ථිර කරනු ලැබේ.

14.2 තවද පරිවාස කාලය තුළ දී පළමුවන කාර්යක්‍ෂමතා කඩඉම සමත් වීමට අපොහොසත්වන නිලධාරීන්ගේ ජොෂ්ඨත්වය, පලමුවන කාර්යක්‍ෂමතා කඩඉම සමත්වීමට ගතවන අමතර කාලය මත කාර්ය පටිපාටික රීති අනුව තීරණයකර, පත්කිරීම් බලධාරියා විසින් සේවය ස්ථිර කරනු ලබයි.

එසේ වුවද අමතර වසර 03 ක කාලය තුළ පළමුවන කාර්යක්‍ෂමතා කඩඉම සමත්වීමට අපොහොසත් වන නිලධාරින්ගේ පත්වීම ස්ථිර කිරීම හෝ පරිවාස කාලය දීර්ඝ කිරීම සම්බන්ධව පත්කිරීම් බලධාරියා විසින් තීරණය කළහොත් පත්වීම අවසන් කරනු ලැබේ.

**15. කාර්යක්‍ෂමතා කඩඉම :**

**කාර්යක්‍ෂමතා කඩඉම ක්‍රියාත්මක කිරීම පහත පරිදි වේ.**

| *කුමන කාර්යක්‍ෂමතා කඩඉමද යන වග* | *කාර්යක්‍ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද* | *කාර්යක්‍ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්‍ෂණය/ වෘත්තිය පරීක්‍ෂණය/ සහතික පාඨමාලාව/ වෙනත්* |
|---|---|---|
| 1 වන කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්‍ෂණ (සේවය ස්ථිර කිරීමේ පරීක්‍ෂණය) | පොලිස් කොස්තාපල් රියදුරු තනතුරට පත්වී වසර 03ක් ගතවීමට පෙර | ලිඛිත හා ප්‍රායෝගික |
| 2 වන කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්‍ෂණය | පොලිස් සැරයන් රියදුරු තනතුරට පත්වී වසර 03ක් ගතවීමට පෙර | තනතුරට හැඩගැස්වීමේ පුහුණු පාඨමාලාව සාර්ථකව හදාරා අවසන් කිරීම |
| 3 වන කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්‍ෂණය | පොලිස් මහසැරයන් රියදුරු තනතුරට පත්වී වසර 03ක් ගතවීමට පෙර | තනතුරට හැඩගැස්වීමේ පුහුණු පාඨමාලාව සාර්ථකව හදාරා අවසන් කිරීම |
| 4 වන කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්‍ෂණය | උප පොලිස් පරීක්‍ෂක (ප්‍රවාහන) තනතුරට පත්වී වසර 03ක් ගතවීමට පෙර | තනතුරට හැඩගැස්වීමේ පුහුණු පාඨමාලාව සාර්ථකව හදාරා අවසන් කිරීම |

**16. භාෂා ප්‍රවීණතාව :**

| *භාෂාව* | *ලබා ගත යුතු ප්‍රවීණතාව* |
|---|---|
| රාජ්‍ය භාෂාව | ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් සේවයට බැඳුණු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/ 2014 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාව ලබාගත යුතු ය. |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/ 2020 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාව ලබාගත යුතු ය. |

**17.** මෙම *ගැසට්* පත්‍රයේ 1 කොටස (11 අ) වැනි ඡේදයේ ආරම්භයේ පල කරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි බලපානු ඇත.

18. අයදුම්කරුවන් සුදු පසුබිමේ ලබාගන්නා ලද පාස්පෝට් ප්‍රමාණයේ වර්ණ ඡායාරූපයක් හා පහත දැක්වෙන ලිපි ලේඛණවල පිටපත් අයදුම්පත් යොමුකරන අවස්ථාවේදී උඩුගත (upload) කළ යුතු ය.

(*අ*) උප්පැන්න සහතිකය,
(*ආ*) ජාතික හැඳුනුම්පත,

(ඇ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික,
(ඈ) වලංගු රියදුරු බලපත්‍රය,
(ඉ) අයදුම්කරු තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවට ප්‍රකාශිත ආයතන ප්‍රධානියාගෙන් ලබාගන්නා ලද ලිපිය. (දැනටමත් රැකියාවක නිරතවන්නේ නම් පමණක් අදාළ වේ.) (අයදුම්පතේ අංක 18 ආකෘතිය යටතේ විය යුතු ය),
(ඊ) ඔබ රජයේ සේවයෙන් හෝ සන්නද්ධ සේවයෙන් ඉවත්ව ඇත්නම් ඉවත්වීමේ ලිපිය.

18. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතුව සිටින අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත යොමුකිරීමේදී අයදුම්පතේ අනු අංක 18 යටතේ ඇති පහත ආකෘතියට අනුව සකස්කරන ලද ලිපියක් ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව සහිතව සහිතව උඩුගත (Upload) කළ යුතු ය.

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ........................................................................................ මහතා ........................................................................................ දෙපාර්තමේන්තුවේ / සංස්ථාවේ/ මණ්ඩලයේ/යුධ හමුදා බලකායේ සේවයේ නියුතු අයෙකු බවත්, ඔහු මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවත් ප්‍රකාශ කරමි.

........................................,
ආයතන ප්‍රධානියාගේ අත්සන,
නම................................,
නිල මුද්‍රාව.

දිනය : ................................

*සටහන* - **පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කරුවන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ශ්‍රී ලංකා පොලිසිය විසින් ගෙවනු නොලැබේ.**

**ප්‍රියන්ත වීරසූරිය,**
පොලිස්පති.

03 - 1150/3

---

### ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

### සීමා නිර්ණය කොමිෂන් සභාවේ සාමාජික ධුරයට පත් කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ ව්‍යවස්ථාව යටතේ සීමා නිර්ණය කොමිෂන් සභාවේ සාමාජික ධුරයේ ඉදිරියේ දී ඇතිවීමට නියමිත පුරප්පාඩු පිරවීමට මේ සඳහා උනන්දුවක් දක්වන තැනැත්තන්ගෙන් අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 95 ව්‍යවස්ථාව යටතේ, සීමා නිර්ණය කොමිෂන් සභාව, ගරු ජනාධිපතිතුමා විසින් පත් කරනු ලබන, දේශපාලන කටයුතුවලට නිරතව නොසිටින්නා වූ තැනැත්තන් වශයෙන් ගරු ජනාධිපතිතුමා සලකන්නා වූ තිදෙනෙකුගෙන් සමන්විත විය යුතු ය.

අයදුම්පත්‍ර, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ වෙබ් අඩවියෙහි (www.parliament.lk) "ක්ෂණික පිවිසුම්" යටතේ 'සීමා නිර්ණය' කොමිෂන් සභාවේ සාමාජික ධුරයට පත් කිරීම' නමින් පළ කර ඇති අයදුම්පත්‍රයට අනුකූලව පිළියෙල කරනු ලැබිය යුතු ය. යථා පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර **2026 අප්‍රේල් මස 10 දින** හෝ ඊට පෙර,

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වැඩබලන මහ ලේකම්,
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව - කාර්යාලය,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ (constitutionalcouncil@parliament.lk) යන විද්‍යුත් ලිපිනයට යොමු කළ යුතු ය.

ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ හෝ විද්‍යුත් පණිවුඩයේ විෂයය ලෙස 'සීමා නිර්ණය කොමිෂන් සභාවේ සාමාජික ධුරයට පත් කිරීම' යනුවෙන් සඳහන් කරන්න.

ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථා සභාවේ නියමය පරිදි පළ කරන ලදී.

2026 මාර්තු මස 26 දින,
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වැඩබලන මහ ලේකම්,
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව - කාර්යාලය,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

03 - 1194

---

### ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

#### මුදල් කොමිෂන් සභාවේ සාමාජික ධුරයට පත් කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ සහ 154ජ ව්‍යවස්ථා යටතේ මුදල් කොමිෂන් සභාවේ සාමාජික ධුරයේ ඉදිරියේ දී ඇතිවීමට නියමිත පුරප්පාඩු පිරවීම සඳහා, එක් එක් තැනැත්තා, මූල්‍ය, නීතිය, පරිපාලනය, ව්‍යාපාර හෝ ශාස්ත්‍රීය යන ක්ෂේත්‍රයක කැපී පෙණුනු හෝ උසස් නිලතල දැරූ තැනැත්තන් විය යුතු ප්‍රධාන ජන වර්ග තුන නියෝජනය කරන්නා වූ, මේ පිළිබඳ උනන්දුවක් දක්වන තැනැත්තන්ගෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

අයදුම්පත්‍ර, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ වෙබ් අඩවියෙහි (www.parliament.lk) "ක්ෂණික පිවිසුම්" යටතේ 'මුදල්' කොමිෂන් සභාවේ සාමාජික ධුරයට පත් කිරීම' නමින් පළ කර ඇති අයදුම්පත්‍රයට අනුකූලව පිළියෙල කරනු ලැබිය යුතු ය. යථා පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2026 අප්‍රේල් මස 10 දින හෝ ඊට පෙර,

> ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වැඩබලන මහ ලේකම්,
> ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව - කාර්යාලය,
> ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
> ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ (constitutionalcouncil@parliament.lk) යන විද්‍යුත් ලිපිනයට යොමු කළ යුතු ය.

ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ හෝ විද්‍යුත් පණිවුඩයේ විෂයය ලෙස 'මුදල් කොමිෂන් සභාවේ සාමාජික ධුරයට පත් කිරීම' යනුවෙන් සඳහන් කරන්න.

ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථා සභාවේ නියමය පරිදි පළ කරන ලදී.

2026 මාර්තු මස 26 දින,
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වැඩබලන මහ ලේකම්,
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව - කාර්යාලය,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

03 - 1195

---

#### ජාතික පොලිස් කොමිෂන් සභාවේ සාමාජික ධුරයට පත් කිරීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 ආ සහ 155අ (1) ව්‍යවස්ථා යටතේ, සහ 155අ (2) සහ 155අ(3) ව්‍යවස්ථාවන්ට යටත්ව, ජාතික පොලිස් කොමිෂන් සභාවේ සාමාජික ධුරයේ ඉදිරියේ දී ඇතිවීමට නියමිත පුරප්පාඩු පිරවීමට නිර්දේශ කරනු ලැබීම සඳහා , මේ පිළිබඳ උනන්දුවක් දක්වන තැනැත්තන්ගෙන් අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

අයදුම්පත්‍ර, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ වෙබ් අඩවියෙහි (www.parliament.lk) "ක්ෂණික පිවිසුම්" යටතේ 'ජාතික පොලිස් කොමිෂන් සභාවේ සාමාජික ධුරයට පත් කිරීම' නමින් පළ කර ඇති අයදුම්පත්‍රයට අනුකූලව පිළියෙල කරනු ලැබිය යුතු ය. යථා පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2026 අප්‍රේල් මස 10 දින හෝ ඊට පෙර,

> ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වැඩබලන මහ ලේකම්,
> ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව - කාර්යාලය,
> ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
> ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ (constitutionalcouncil@parliament.lk) යන විද්‍යුත් ලිපිනයට යොමු කළ යුතු ය.

ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ හෝ විද්‍යුත් පණිවුඩයේ විෂයය ලෙස 'ජාතික පොලිස් කොමිෂන් සභාවේ සාමාජික ධුරයට පත් කිරීම' යනුවෙන් සඳහන් කරන්න.

ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථා සභාවේ නියමය පරිදි පළ කරන ලදී.

2026 මාර්තු මස 26 දින,
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වැඩබලන මහ ලේකම්,
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව - කාර්යාලය,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

03 - 1196

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය**

## ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ II ශ්‍රේණියේ සහ III ශ්‍රේණියේ නිලධාරින් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025

1.0 ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ II ශ්‍රේණියේ සහ III ශ්‍රේණියේ නිලධාරින් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025 රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් **2026 ජුනි මස** දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම නිවේදනයට අනුව අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා අයදුම්කළ හැක්කේ **රාජ්‍ය සේවයේ ඒකාබද්ධ සේවයට අයත් නිලධාරින්ට** පමණි.

2.0 මෙම විභාගය අංක 20235/4 සහ 2017.06.21 දිනැති *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කර ඇති ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ සේවා ව්‍යවස්ථාවේ 08 ඡේදය, 03 සහ 04 පරිශිෂ්ඨ විධිවිධාන අනුව පැවැත්වේ.

3.0 ඉහත සඳහන් සේවයේ එක් එක් ශ්‍රේණිවලට අදාළව පැවැත්වීමට නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාග පහත සඳහන් පරිදි වේ.

| *අනු. අංකය* | *විභාගයේ නම* | *සංකේත නාමය* |
|---|---|---|
| 01. | ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ II ශ්‍රේණියේ නිලධාරින් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025 | **Librarian- II** |
| 02. | ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ III ශ්‍රේණියේ නිලධාරින් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025 | **Librarian -III** |

4.0 මෙම විභාගය සම්බන්ධව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. මෙම නීති උල්ලංඝනය කළහොත් විනය බලධරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනවා ඇත. අයදුම්කිරීමේ දී මූලික තොරතුරු වන නම, ජාතික හැඳුනුම්පත් අංකය, විද්‍යුත් තැපැල් ලිපිනය, දුරකථන අංකය නිවැරදිව ඇතුළත් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඒ අනුව වැරදි තොරතුරු ඇතුළත් කිරීම හේතුවෙන් විභාග ප්‍රවේශ පත්‍රයක් නොලැබීම හෝ විභාගය සඳහා පෙනී සිටීමට අවස්ථාව නොලැබීම හෝ විභාග ප්‍රතිඵල නිකුත් නොකිරීම හෝ සම්බන්ධයෙන් වගකීම අයදුම්කරුවන් සතු වන බව ද සැලකිය යුතු ය.

5.0 මෙම විභාගය සඳහා ඉල්ලුම් කිරීමේ ආදර්ශ අයදුම්පතක් මෙම නිවේදනය අවසානයේ පළ කර ඇත. නිවැරදිව හා පැහැදිලිව පිළියෙළ කරනු ලබන අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් **2026.04.10** දින හෝ ඊට පෙර ලැබෙන පරිදි **"අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, අංක 28/10, මලලසේකර මාවත, කොළඹ 07"** යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත බහා ඇති කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ II ශ්‍රේණියේ සහ III ශ්‍රේණියේ නිලධාරින් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025"** යන වචන පැහැදිලි ලෙස ලිවිය යුතු ය. තව ද, 2026.04.10 දිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් භාරගනු නොලැබේ. තැපැල් ප්‍රමාදයට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වගකියනු නොලැබේ.

5.0.1 (i) අයදුම්පතේ ශීර්ෂ අංක 1.0 සිට 5.0 තෙක් පළමුවන පිටුවට ද ඉතිරිය දෙවන පිටුවට ද වන ලෙස ගෙන අයදුම්පත "ඒ4" ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් පිළියෙල කරගත යුතු ය. අයදුම්පත යතුරු ලියනය කර පිළියෙල කර ගත හැකි වුව ද, එය අයදුම්කරුගේ අත් අකුරින්ම පිරවිය යුතු ය. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ii) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා සියලුම අයදුම්කරුවන් විසින් තමන්ගේ අයදුම්පත් රාජ්‍ය භාෂාවෙන්ම පිළියෙළ කළ යුතු අතර ඒවා එම භාෂාවෙන් ම පිරවිය යුතුය. විභාග අයදුම්පතේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කරන්න.

විභාග අයදුම්පත්‍රය ඉදිරිපත් කිරීම **2026.03.27** දින සිට **2026.04.10** දින දක්වා වන කාලය තුළ පමණක් සිදු කළ හැක.

6.0 i. *විභාග ගාස්තු* - පළමුවන වරට මෙම විභාගයට අයදුම් කරන නිලධාරින් විසින් කිසිදු විභාග

ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතකුදු වුවත් ඉන්පසු වාරවල දී නිලධාරින් විසින් එක් විෂයයකට රු. 250/- ක් බැගින් ගෙවිය යුතු වේ.

ii. විභාග ගාස්තු පහත දැක්වෙන ගිණුම වෙත බැර කළ යුතු වේ.

ගිණුමේ නම - ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
ගිණුම් අංකය - 310100119027430
බැංකුව - මහජන බැංකුව - බම්බලපිටිය ශාඛාව

iii. එම ගෙවීමට අදාළව ලබා දෙන මුදල් තැන්පතු පතේ අංකය අයදුම්පතට ඇතුළත් කළ යුතු අතර මුදල් තැන්පතු පතේ මුල් පිටපත විභාග අයදුම්පත්‍රයේ අදාළ ස්ථානයේ ඇලවිය යුතු ය.

iv. තව ද, ගිණුම වෙත මුදල් ගෙවීමේ දී මුදල් ගෙවන්නා ලෙස අයදුම්කරුගේ නම ද, අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය ද, මුදල් තැන්පත් කිරීමට හේතුව යන ස්ථානයේ ඔබට අදාළ විභාගයේ සංකේත නාමය ද ඇතුළත් කර මුදල් තැන්පතු පත සම්පූර්ණ කළ යුතුය. මාර්ගගත (Online) ක්‍රමයට මුදල් ගෙවන නිලධාරින් ද ලැබෙන රිසිට්පතේ ඉහත තොරතුරු සටහන් කළ යුතු ය.

(විභාගවල සංකේත නාම 03 ඡේදයේ දක්වා ඇති පරිදි විය යුතු ය)

7.0 අයදුම්පතේ සඳහන් කරනු ලබන අයදුම්කරු සම්බන්ධ කර ගැනීමේ මාර්ගවන ජංගම දුරකතන අංකය සහ විද්‍යුත් තැපැල් ලිපිනය විභාග කටයුතු අවසන් වනතුරු සක්‍රීයව පවත්වා ගැනීම අයදුම්කරු සතු වගකීමකි. එම ජංගම දුරකතන අංකය සහ විද්‍යුත් තැපැල් ලිපිනය වෙනස් කිරීම හේතුවෙන් ඇතිවන අපහසුතාවයන් සම්බන්ධ වගකීම් ද අයදුම්කරුවන් සතු බව සැලකිය යුතු ය.

8.0 සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගේ අයදුම්පත් සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙහි අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. (විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ නිල වෙබ් අඩවියේ (www.slida.lk) පළකරනු ඇත.) නිවේදනය පළ වී දින තුනක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍ර නොලද අපේක්ෂකයෙකු වේ නම්, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ විභාග ශාඛාවේ දුරකතන අංක 011-5980252 හෝ 011-5980236 ඔස්සේ සතියේ වැඩ කරන දිනයන්හි පෙ.ව. 8.30 සිට ප.ව. 4.00 දක්වා විමසිය හැකිය.එසේ විමසීමේ දී, අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය සහ ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතු ය. එසේ විමසීම් කිරීමේ දී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පතෙහි ඡායා පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි ඡායා පිටපත සහ අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සුදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

9.0 අයදුම්කරුගේ අපේක්ෂකත්වය තහවුරු කර ගැනීමට අවශ්‍ය වන්නේ නම් දුරකථන අංක 011-5980236 හෝ 011-5980264 ඔස්සේ ඒ බව තහවුරු කර ගත හැකිය. විභාගයට පැමිණීම වෙනුවෙන් ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

10.0 *අපේක්ෂකයින්ගේ අනන්‍යතාව* - අපේක්ෂකයන් විභාග ශාලාව තුළ දී පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතු ය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

i. ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය
iii. වලංගු රියදුරු බලපත්‍රය

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය.

11.0 සිංහල, දෙමළ, හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් මෙම විභාගය පැවැත්වෙන අතර අදාළ සේවයට ඇතුළත් වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ මෙම විභාගයට පෙනී සිටීමට නිලධාරින්ට පුළුවන. තරග විභාගයක් නොමැතිව සේවයට බැඳුණු නිලධාරින්ට ද තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ මෙම විභාගයට පෙනී සිටිය හැකිය. විභාගය සඳහා ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

12.0 තමන් කැමති නම් එක් එක් විෂයය සඳහා වෙන් වෙන් වශයෙන් හා එකිනෙකට වෙනස් වූ වාරවල දී පෙනී සිටීමට නිලධාරින්ට හැකිය. එතෙකුදු වුවත් සාමාර්ථය සඳහා එක් එක් විෂයයට නියමිත මුළු ලකුණුවලින් අවම වශයෙන් සියයට හතළිහක් (40%) බැගින් ලබාගත යුතු වේ.

13.0 විභාග ප්‍රතිඵල ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කිරීමෙන් අනතුරුව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ප්‍රතිඵල රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ වෙබ් අඩවියේ පළකරනු ලැබේ. එම ප්‍රතිඵල අනුව අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානින් නිලධාරින් උසස් කිරීම් කටයුතු සඳහා නිර්දේශ ඉදිරිපත් කළ යුතු වේ.

14.0 විභාග පරිපාටිය : එක් එක් කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා පෙනී සිටිය හැකි නිලධාරින් සඳහා විෂය සහ විෂය නිර්දේශ පහත සඳහන් පරිදි වේ.

**14.1 ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය-2025**

14.1.1 සුදුසුකම් - ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ II ශ්‍රේණියට උසස්කර ඇති නිලධරයන් මෙම විභාගය සඳහා ඉදිරිපත් වීමට සුදුසුකම් ලබයි.

මෙම විභාගය II ශ්‍රේණියට උසස් වී වසර 03 ක් තුළ සමත්විය යුතුය.

14.1.2 විභාග පරිපාටිය - විභාගය ප්‍රශ්න පත්‍ර 2 කින් යුක්තය.

**විෂය අංක 01 - සාමාන්‍ය පරිපාලනය හා මූල්‍ය ක්‍රම - කාලය පැය 03යි - (ලකුණු 100 යි)**

- **I කොටස - සාමාන්‍ය පරිපාලනය - කාලය පැය 1 1/2 යි (ලකුණු 50 යි)**

(අ) ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ මූලික දැනුම
(ආ) ආයතන සංග්‍රහයේ VI සිට VIII, XII, XIV, XXIV, XXVII, XXVIII පරිච්ඡේද ඇතුළත් වේ.
(ඇ) 1973 අංක 48 දරන රාජ්‍ය ලේඛනාරක්ෂක පනත හා 1981 අංක 30 දරන ජාතික ලේඛනාරක්ෂක පනත (සංශෝධන)
(ඈ) 1994 අංක 11 දරන විද්‍යා හා තොරතුරු තාක්ෂණ සංවර්ධන පනතේ III කොටස
(ඉ) 1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනත
(ඊ) 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත

- **II කොටස - මූල්‍ය ක්‍රම - කාලය පැය 1 1/2 යි - ලකුණු 50 යි**

(උ) මුදල් රෙගුලාසි - පුස්තකාල මගින් ඉටු කරනු ලබන ගිණුම් කටයුතු හා ඒවාට අදාළ රෙගුලාසි

**විෂය අංකය 02 - පුස්තකාල සංවිධානය - කාලය පැය 03යි - (ලකුණු 100යි)**

(අ) පුස්තකාල ගොඩනැගිලි හා උපකරණ
(ආ) රජයේ ප්‍රකාශනවල ප්‍රයෝජන හා භාවිත කරන අයුරු
(ඇ) පුස්තකාල ක්ෂේත්‍රයේ කලාපීය හා අන්තර්ජාතික සංවිධාන
(ඈ) පුස්තකාල කළමනාකරණයේ ක්‍රමෝපායන්
(ඉ) මූල්‍ය කළමනාකරණය
(ඊ) කාල කළමනාකරණය
(උ) මානව සම්පත් කළමනාකරණය
(ඌ) ශ්‍රී ලංකාවේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ කටයුතු
(එ) පුස්තකාල පරිගණකකරණය පද්ධති හා ජාල

*සැ.යු.* මෙම පරීක්ෂණයෙන් සමත් වීම සඳහා එක් එක් විෂයය සඳහා වූ ලකුණුවලින් අවම වශයෙන් සියයට හතළිහක් (40%) ලබාගත යුතු වේ.

**14.2 ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025**

14.2.1 විභාග පරිපාටිය - විභාගය ප්‍රශ්න පත්‍ර 2 කින් යුක්තය.

**විෂය අංක (01) - සාමාන්‍ය පරිපාලනය හා මූල්‍ය ක්‍රම - කාලය පැය 03යි - (ලකුණු 100 යි)**

- **I කොටස - සාමාන්‍ය පරිපාලනය - කාලය පැය 1 1/2 යි (ලකුණු 50 යි)**

(අ) ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ මූලික දැනුම
(ආ) ආයතන සංග්‍රහයේ VI සිට VIII, XII, XIV, XXIV, XXVII, XXVIII පරිච්ඡේද ඇතුළත් වේ.
(ඇ) 1973 අංක 48 දරන රාජ්‍ය ලේඛනාරක්ෂක පනත හා 1981 අංක 30 දරන ජාතික ලේඛනාරක්ෂක පනත (සංශෝධන)
(ඈ) 1994 අංක 11 දරන විද්‍යා හා තොරතුරු තාක්ෂණ සංවර්ධන පනතේ III කොටස
(ඉ) 1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනත
(ඊ) 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත

- **II කොටස - මූල්‍ය ක්‍රම - කාලය පැය 1 1/2 යි - (ලකුණු 50 යි)**

(ඇ) මුදල් රෙගුලාසි - පුස්තකාල මගින් ඉටු කරනු ලබන ගිණුම් කටයුතු හා ඒවාට අදාළ රෙගුලාසි

**විෂය අංක (02) - පුස්තකාල සංවිධානය - කාලය පැය 03 යි - (ලකුණු 100යි)**

(අ) පුස්තකාල ගොඩනැගිලි හා උපකරණ

(ආ) රජයේ ප්‍රකාශනවල ප්‍රයෝජන හා භාවිතා කරන අයුරු
(ඇ) පුස්තකාල ක්ෂේත්‍රයේ කලාපීය හා අන්තර්ජාතික සංවිධාන
(ඈ) පුස්තකාල කළමනාකරණයේ ක්‍රමෝපායන්
(ඉ) මූල්‍ය කළමනාකරණය
(ඊ) කාල කළමනාකරණය
(උ) මානව සම්පත් කළමනාකරණය
(ඌ) ශ්‍රී ලංකාවේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ කටයුතු
(එ) පුස්තකාල පරිගණකකරණය පද්ධති හා ජාල

*සැ.යු.* මෙම පරීක්ෂණයෙන් සමත් වීම සඳහා එක් එක් විෂයය සඳහා වූ ලකුණුවලින් අවම වශයෙන් සියයට හතළිහක් (40%) ලබාගත යුතු වේ.

**14.2 ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025**

14.2.1 විභාග පරිපාටිය - විභාගය ප්‍රශ්න පත්‍ර 2 කින් යුක්තය.

**විෂය අංක (01) - සාමාන්‍ය පරිපාලනය හා මූල්‍ය ක්‍රම - කාලය පැය 03යි - (ලකුණු 100 යි)**

- **I කොටස - සාමාන්‍ය පරිපාලනය - කාලය පැය 2/1 1 යි (ලකුණු 50 යි)**

(අ) ආයතන සංග්‍රහයේ VI සිට VIII, XII, XIV, XXIV, XXVII, XXVIII පරිච්ඡේද ඇතුළත් වේ.

(ආ) 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති.

(ඇ) 1974 අංක 20 දරන ශ්‍රී ලංකා පුස්තකාල සංගමය (සංස්ථාගත කිරීමේ) පනත හා 2004 අංක 7 දරන එහි සංශෝධිත පනත.

- **II කොටස - මූල්‍ය ක්‍රම - කාලය පැය 2/1 1 යි - (ලකුණු 50 යි)**

(ඈ) මුදල් රෙගුලාසි - (X පරිච්ඡේදය හැර)
පුස්තකාල මගින් ඉටු කරනු ලබන ගිණුම් කටයුතු හා ඒවාට අදාළ රෙගුලාසි

**විෂය අංක (02) - පුස්තකාල සංවිධානය - කාලය පැය 03 යි - (ලකුණු 100යි)**

(අ) පළාත් පුස්තකාල ප්‍රඥප්තිය
(ආ) පුස්තකාල කමිටු
(ඇ) පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය
(ඈ) පාඨක අධ්‍යාපනය හා මහජන සම්බන්ධතා
(ඉ) පුස්තකාල වර්ග හා සේවා
(ඊ) පුස්තකාල කළමනාකරණයේ දී සැලකිය යුතු සරල මූලධර්ම හා ක්‍රමෝපායන්
(උ) පුස්තකාලයක ක්‍රියාත්මක කළ හැකි ව්‍යාප්ති වර්ග

*සැ.යු.* මෙම පරීක්ෂණයෙන් සමත් වීම සඳහා එක් එක් විෂයය සඳහා වූ ලකුණුවලින් අවම වශයෙන් සියයට හතළිහක් (40%) ලබාගත යුතු වේ.

15.0 මෙම විභාග නිවේදනයෙන් විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳ වුවද, ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

16.0 මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යයන්ගෙන් පළවන නිවේදනවල පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් පවතී නම්, එවැනි විටෙක දී සිංහල මාධ්‍ය නිවේදනය බලාත්මක වේ.

**එන්.යූ. නිෂාන් මෙන්ඩිස්,**
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන
අමාත්‍යාංශය.

2026 මාර්තු මස 23 දින,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන
අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

**ආදර්ශ ඉල්ලුම් පත්‍රය**

ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ II ශ්‍රේණියේ සහ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025

**EFFICIENCY BAR EXAMINATION FOR OFFICERS IN GRADE II AND GRADE III OF THE SRI LANKA GOVERNMENT LIBRARIANS' SERVICE – 2025**

ඔබ විභාගයට ඉදිරිපත් වන භාෂා මාධ්‍යය :

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

සංකේත නාමය (විභාගවල සංකේත නාම 03 ඡේදයේ දක්වා ඇති පරිදි විය යුතුය)

1.0 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..........................................................................................
..........................................................................................
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :
..........................................................................................
(උදා : GUNAWARDHANA, H.M.S.K.)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන් / දෙමළෙන්) : ..........................................................................................
..........................................................................................

2.0 සේවා ස්ථානය හා ලිපිනය :

2.1 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ නම හා ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..............................
..........................................................................................

2.2 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ නම හා ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :..............................
..........................................................................................

2.3 විභාග ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..............................
..........................................................................................

3.0 3.1 ස්ත්‍රී/ පුරුෂ භාවය :

ස්ත්‍රී - 1
පුරුෂ - 0

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.2 ජාතික හැඳුනුම්පත් අංකය :

3.3 දුරකථන අංකය : ජංගම : රාජකාරි :

4.0 ඔබ ඉදිරිපත් වන විෂයය/ විෂයන් :

| විෂයය | විෂයය අංකය |
|---|---|
| | |
| | |

5.0 උපන් දිනය : වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

6.0 දැනට දරන තනතුර :

6.1 තනතුර : ..........................................................................................................................................

6.2 පත්වීම් ලිපියේ අංකය : ........................................................................................................................

7.0 7.1 ඔබ විභාගයට ඉල්ලුම් කරන්නේ ප්‍රථම වතාවට-ද? : .............................................................................

7.2 එසේ නොවන්නේ නම් ගෙවන ලද විභාග ගාස්තුව : ..................................................................................

7.3 බැංකුව/ ශාඛාව : ..................................................................................................................................

7.4 ලදුපත් අංකය : ..................................................................................................................................

7.5 ගෙවූ දිනය : ........................................................................................................................................

| |
|---|
| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.<br>(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගන්න) |

8.0 <u>අයදුම්කරුගේ සහතිකය</u>

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මා හට හිමිකම් ඇති බවත්, මොනයම් ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැති බවත් ප්‍රකාශ කරමි. තවද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

දිනය : .............................

..............................................,
අයදුම්කරුගේ අත්සන.

9.0 <u>දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය</u>

(i) **මෙම අපේක්ෂකයා/ අපේක්ෂිකාව මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්තව සිටින** රාජ්‍ය සේවයේ ඒකාබද්ධ සේවයට අයත් **ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ** II ශ්‍රේණියේ හෝ III ශ්‍රේණියේ **නිලධාරියකු/ නිලධාරිනියක බව ද,**

(ii) **ඉහත සපයා ඇති විස්තර නිවැරදි බව ද,**

(iii) **ඔහුගේ/ ඇයගේ වැඩ සහ හැසිරීම සෑම විටම සතුටුදායක බව ද, පසුගිය පස් අවුරුදු කාල සීමාව තුළ (අවවාද කිරීම් හැර) කිසිම ආකාරයක විනයානුකූල දඬුවමකට භාජනය නොවූ බව ද,**

(iv) **ඔහු/ ඇය මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බව ද,**

(v) **නියමිත විභාග ගාස්තුව ගෙවා, එම ලදුපත අලවා ඇති බව ද (අදාළ නොවේ නම් කපා හරින්න.) මම සහතික කරමි.**

…………......................................,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
සහ නිල මුද්‍රාව

දිනය : ..........................................
පදවි නාමය :.................................
ලිපිනය :......................................

03 - 1148

---

**පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත/ කාර්යාලගත නිලධාරි බණ්ඩ 2 සේවා ගණයේ පරිවාස නිලධාරි තනතුරේ 11 ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය -2026**

කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය යටතේ පවතින, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත/ කාර්යාලගත නිලධාරි බණ්ඩ 2 සේවා ගණයේ පරිවාස නිලධාරි තනතුරේ පවතින පුරප්පාඩුව (01) පිරවීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් 2026 **ජූලි මාසයේදී කොළඹ දී** පවත්වනු ඇත. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ කොමසාරිස්වරයා බලය ඇත.

අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.donets.lk වෙබ් අඩවියේ “Our Services” යටතේ ඇති “Online Application – Recruitment Exam/ E.B. Exam” ඔස්සේ පළකර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි.

**මාර්ගගත අයදුම්පත් භාර ගැනීම 2026 මාර්තු මස 30 දින පෙ.ව. 09.00ට විවෘත වන අතර 2026 අප්‍රේල් මස 27 දින ප.ව. 09.00ට අවසන් වේ.**

දැනට රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරින් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපි ගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතු ය.

**1.0 බඳවා ගැනීමේ සුදුසුකම් :**

තනතුරට බඳවා ගැනීමේ සුදුසුකම් සියල්ල මෙම නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**1.1 සාමාන්‍ය සුදුසුකම් :**

i. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.
ii. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
iii. යම් ආගමක/ ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.
iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති V පරිච්ඡේදයේ සඳහන් එකදු නුසුදුසුකමකින් හෝ පෙළෙන්නකු නොවිය යුතු ය.

**1.2 ශාරීරික හා මානසික යෝග්‍යතාව**

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය.

**1.3 වයස් සීමාව**

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවු 18 ට නොඅඩු සහ අවුරුදු 35 ට නොවැඩි විය යුතු ය.

ඒ අනුව 2008.04.27 දිනට හෝ ඊට පෙර හා 1991.04.27 දිනට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.

(උදා:- 2025.03.31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 35ට නොවැඩි විය යුතු නම්, අයදුම් කළ හැක්කේ

2007.03.31 දින හෝ ඊට පෙර හා 1990.03.31 දින හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණි.)

**1.4 අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :**

සමාජ විද්‍යාව/ මනෝ විද්‍යාව/ අපරාධ විද්‍යාව යන විෂයයන්ගෙන් එකක් හෝ කීපයක් ඇතුළත්ව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම.

1.4.1 වෘත්තීය සුදුසුකම් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන සමාජ වැඩ/ උපදේශනය/ මානව හිමිකම් යන විෂයකට අදාළව ලබාගත් මාස 06 කට නොඅඩු ඩිප්ලෝමාවක් හෝ තෘතියික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් සමාජ වැඩ/ උපදේශනය / මානව හිමිකම් යන විෂයකට අදාළව ලබාගත් මාස 06 කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක්.

1.4.2 පළපුරුද්ද : අදාළ නොවේ.

**2.0 බඳවාගැනීමේ ක්‍රමය :**

2.1 පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත/ කාර්යාලගත නිලධාරි ඛණ්ඩ 2 සේවා ගණයේ පරිවාස නිලධාරි තනතුරේ II වන ශ්‍රේණිය සඳහා විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයකින් හා පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සුදුසුකම් හා සහතික පත්‍ර පරීක්ෂාව සඳහා පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත සුදුසු අයදුම්කරුවකු බඳවා ගනු ලැබේ.

**2.2 ලිඛිත විභාගයේ විෂයයන්:**

විභාගය පැවැත්වෙන්නේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යවලින් පමණි. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| 1. සමාජ සංවර්ධනය, සමාජවැඩ හා ළමාරක්ෂන සේවා (ශ්‍රී ලංකාවට අදාළව) | පැය 1 ½ | 100 | 40% |
| 2. සිද්ධි අධ්‍යයනය | පැය 1 ½ | 100 | 40% |

**2.3 ලිඛිත විභාගයේ විෂය නිර්දේශය:**

විභාගය සඳහා වන විෂයය නිර්දේශය

| *ප්‍රශ්න පත්‍රය* | *විෂයය නිර්දේශය* |
|---|---|
| 1. සමාජ සංවර්ධනය, සමාජවැඩ හා ළමාරක්ෂනය (ශ්‍රී ලංකාවට අදාළව) | ළමා අයිතිවාසිකම්, දණ්ඩ නීති සංග්‍රහය |
| 2. සිද්ධි අධ්‍යයනය | ළමුන් සම්බන්ධ විෂයය ක්ෂේත්‍රයෙන් දෙනු ලබන ගැටලුවක් අධ්‍යයනය කොට නීත්‍යානුකුල හා සමාජීය සත්‍යතාවන් ආශ්‍රයෙන් විසඳුම් යෝජනා කිරීම |

**3.0 මාසික වැටුප් පරිමාණය :**

අංක 10/2025 දරන 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන 1 අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය

රු. 58,660 - 10x1,190 - 11x1,360 - 15x1,670 රු. 110,570/- ක (MN 5 -2025) වේ.

**4.0 සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි:**

I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතුවේ. ඔබ වැන්දඹු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

II. මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්ය. තනතුරට බඳවාගෙන වසර 03ක් ඇතුළත බඳවාගැනීමේ පටිපාටියේ සඳහන් ආකාරයට පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

III. අංක 18/2020 දරන 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි විධිවිධාන හා ඊට

ආනුෂාංගික චක්‍රලේඛවල විධිවිධාන අනුව සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාව ලබා ගත යුතු අතර, රාජ්‍ය භාෂාවක් නොවන භාෂාවකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් පරිවාස කාලය තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතු ය.

IV. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද රජයේ මුදල් රෙගුලාසිවලට ද දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

V. ඉල්ලුම්කරනු ලබන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලබන අතර, ඔබ පත්වීම ලැබීමට සුදුසුකම්ලත් භාෂා මාධ්‍යය වනුයේ ඔබ විසින් අයදුම්පතේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍යය වේ.

4.1 පැවරෙන කාර්ය භාරය පිළිබඳ :

ව්‍යවස්ථාපිත රාජකාරී

I. වරදකරුවන් පුනරුත්ථාපනය කිරීම සඳහා පරිවාස ආඥාපනත යටතේ පැවරී ඇති රාජකාරී.

II. භාරය හා ආරක්ෂාව අවශ්‍ය ළමයින් හා නීතිය සමඟ ගැටුම් ඇතිකරගත් ළමයින් උදෙසා ළමයින් හා යෞවනයන් පිළිබඳ ආඥාපනත යටතේ පවරා ඇති බලතල අනුව රාජකාරී ඉටු කිරීම.

III. ළමයින්ට විකල්ප රැකවරණය සැලසීම උදෙසා ළමයින් හදාවඩා ගැනීමේ ආඥාපනත යටතේ කටයුතු කිරීම.

IV. අනාථ, අත්හල හා අසරණ ළමයින්ට රැකවරණය සැලසීම උදෙසා අනත්දරු නිවාස ආඥාපනත යටතේ රාජකාරී කටයුතු කිරීම.

V. විපී ළමයින් හා අයාලේ යන පුද්ගලයන් පිළිබඳව අයාල ආඥාපනත හා නිවර්තන නිවාස ආඥාපනතේ නීති ප්‍රතිපාදනයන්ට අනුව රාජකාරී ඉටු කිරීම.

VI. තරුණ වරදකරුවන් පුනරුත්ථාපනය කිරීම හා ඔවුන් සමාජගත කිරීම පිළිබඳව තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලයීය ආඥාපනතට අනුව ඇති රාජකාරී කටයුතු ඉටු කිරීම.

VII. ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව පනත, අධ්‍යාපන පනත, සුනාමි පනත යටතේ කටයුතු කිරීම හා දඬ ආඥාපනත යටතේ අධිකරණය විසින් පනවනු ලබන නියෝග අනුව කටයුතු කිරීම.

VIII. ළමයින්ට අදාළ හබයාස් කෝපස් අයදුම්පත් පිළිබඳව, ළමයින්ගේ අයිතිය හා භාරකාරත්වය පිළිබඳ හා ළමා අයිතිවාසිකම් පිළිබඳව ළමයාගේ භාරකරු ලෙස හා විමර්ශන නිලධාරියකු ලෙස කටයුතු කිරීම.

ව්‍යවස්ථාපිත නොවන රාජකාරී

i. ජාතික හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ළමා සුභසාධනය පෙරදැරි කරගෙන කටයුතු කිරීම.

ii. පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවෙන් මහජනයාට අපේක්ෂිත උපදෙස් හා සේවාවන් ලබාදීම.

iii. දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

iv. ළමයින් දරුකමට හදාවඩා ගැනීම සම්බන්ධ අදාළ සියලු කටයුතු ක්‍රියාත්මක කිරීම හා එහි අධීක්ෂණ කටයුතු.

v. නීතිරීති සංශෝධනයට අදාළ නිරීක්ෂණ හා නිර්දේශ ලබා දීමේ කටයුතු.

vi. ළමයින්ට අදාළ ප්‍රතිපත්ති සැකසීමේ දී හා ක්‍රියාකාරී සැලැස්ම සැකසීමේදී සහය ලබා දීම

vii. ළමයින් සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම සැකසීමට සහායවීම.

**5.0 අයදුම් කිරීමේ ක්‍රමය:**

මාර්ගගත (online) විභාග අයදුම්පත් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතු ය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව/ භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවිඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේදී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**6.0 විභාග ගාස්තු :**

විභාග ගාස්තුව රු 600/- කි. විභාග ගාස්තු ගෙවීමේදී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතු ය.

I. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)
II. අන්තර්ජාල පහසුකම් සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card with the Facility of Internet Transactions)
III. ලංකා බැංකු මාර්ගගත ක්‍රමය/ Flex යෙදවුම මගින් (Online Banking Method/ Flex App of Bank of Ceylon)
IV. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of the Bank of Ceylon)

*සටහන :-*

(*අ*) ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියෙන් විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(*ආ*) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවිඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් (E-mail) මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(*ඇ*) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

**7.0 විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම**

*ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව සඳහන් කරමින් වෙබ් නිවේදනයක් මඟින්/ අයදුම්කරුවන් වෙත කෙටි පණිවිඩයක් මගින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අයදුම්කරුවකු වේ නම් ඒ පිළිබඳ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන නිවේදනයේ සඳහන් විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත හා විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි ඡායා පිටපත් සූදානමින් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතුය. විභාග ශාලාවේදී/ සම්මුඛ පරීක්ෂණයේදී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

**8.0 අපේක්ෂකයින්ගේ අනන්‍යතාව**

විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ :

i. ජාතික හැඳුනුම්පත,
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම, විභාග අපේක්ෂකයන් අනන්‍යතාව සනාථ කර ගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳ නොමැති බව සනාථ කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. ඊට එකඟ නොවන කිසිවකු විභාග ශාලාවට ඇතුළත් කර නොගත යුතු ය. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

**9.0** අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

**10.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම**

විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතු ය. කිසියම් රාජ්‍ය ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා ද එසේ නොවන අයදුම්කරුවකු තම

අත්සන කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි, රජයේ පාසලක ප්‍රධානියකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතු ය.

**11.0** විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේම විභාග ශාලාධිපතිවරයා වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු ය.

**12.0** විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

**13.0** සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ පාඨ අතර යම්කිසි නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**කොමසාරිස්,**
පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව.

2026 මාර්තු මස 09 දින,
පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව.

**03 - 1079**

---

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**
**වෘත්තීය අධ්‍යාපන අංශය**

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය

**කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය - මොරටුව**

***පූර්ණ කාලීන පාඨමාලාවන් සඳහා ආධුනිකයින් බඳවා ගැනීම - 2026 ජූලි කණ්ඩායම***

ශ්‍රී ලංකා රජය සහ ජර්මනු රජය එක්ව ඒකාබද්ධ ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කරන ලද මොරටුව කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනයෙහි (IETI) පහත සඳහන් පාඨමාලාවන් හැදෑරීම සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම සියලුම පාඨමාලාවන් දේශීය සහ විදේශීය (ජර්මනිය, ඕස්ට්‍රේලියාව, නවසීලන්තය, ජපානය, ඊශ්‍රායලය, රුමේනියාව) රැකියා අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි ඉතා උසස් මට්ටමේ න්‍යායික හා ප්‍රායෝගික කොටස්වලින් සමන්විත, ආධුනිකයාට ක්ෂේත්‍රය පිළිබඳ අවශ්‍ය පරිපූර්ණ දැනුම අන්තර්ගත කොට සැකසූ දිවයිනේ ප්‍රමුඛතම පාඨමාලාවන් වේ.

මෙම පාඨමාලාවන් සාර්ථකව නිම කරන ආධුනිකයන් වෙනුවෙන්,

- කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය මගින් පිරිනැමෙන පූර්ණ කාලීන පාඨමාලා සහතික පත්‍රය සහ
- එයට අදාළ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් පිරිනැමෙන ජාතික වෘත්තීය සුදුසුකම් 04 වන අදියරට අදාළ (NVQ Level 04) සහතික පත්‍රය ද හිමිවේ.

**(01.)** මෙහෙයවනු ලබන පාඨමාලා සහ අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් :

| අනු. අංකය | පාඨමාලා විස්තර | පාඨමාලා ගාස්තුව (රු.) | පාඨමාලා කාලය |
|---|---|---|---|
| පාඨමාලා අංක 01, 02, 03, 04 සහ 05 වෘත්තීන් සඳහා ප්‍රවේශ සුදුසුකම්<br>• අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් සිංහල භාෂාව, ගණිතය හා විද්‍යාව ඇතුළුව විෂයයන් 06ක් සමත්විය යුතු අතර, ගණිතය හෝ විද්‍යාව විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතු ය.<br>• අ.පො.ස. (උ. පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදය හෝ තාක්ෂණය සඳහා විද්‍යාව යන විෂයයන් 02න් එක් විෂයයක් සඳහා සාමාර්ථයක් ලබා තිබීම. | | | |
| 01. | ඉලෙක්ට්‍රොනික් කාර්මික ශිල්පී (විශේෂ) - **Electronic Craftsman (Special)**<br><br>අධ්‍යයන විෂයයන් -:<br><br>Basic Work Shop Practice, Domestic Electrical Installation, Analogue & Digital Electronics with Applications, Communication Systems, Thyristor Power Control, PLC & Micro Controller Based Control Systems (PIC & ARDUINO), Solar Power Systems & Project Works | 150,000/= | අවු. 03 |
| 02. | විදුලි කාර්මික ශිල්පී (විශේෂ) - **Electrician (Special)**<br><br>අධ්‍යයන විෂයයන් -:<br><br>Basic Work Shop Practice, Domestic & Industrial Electrical Circuits installation, Electrical Measuring Instrument, Communication & Security System, Electrical Machine & Motor Control System, Pneumatic & Electro Pneumatic Control System, Mechatronics Systems, Electrical Technology & Electrical Mathematics | 150,000/= | අවු. 03 |
| 03. | ඉදිකිරීම් සුපරීක්ෂක - **Construction Supervisor**<br><br>අධ්‍යයන විෂයයන් -:<br><br>Construction Management, Basic Workshop Practice, Basics in Construction Technology, Basics in Engineering and Architectural Drawings and Auto Cad, Construction Materials, Surveying and Levelling, Water Supply, Drainage and Sewerage Systems, Road Construction and Quantity Surveying and Cost Estimates | 100,000/= | අවු. 01 1/2 |
| 04. | ප්‍රමාණ සමීක්ෂණ සහකාර - **Quantity Surveying Assistant**<br><br>අධ්‍යයන විෂයයන් -:<br><br>Preparation of BOQ for Small and Medium construction, Pricing of BOQ, Prepare Bidding Document) | 50,000/= | අවු.01 |
| 05. | සැලසුම් ශිල්පී - Draughtsperson<br><br>අධ්‍යයන විෂයයන් -:<br><br>Building Construction, Building Services, Mathematics, Geometrical and Mechanical Drawing, Swverying & Levelling, Auto CAD, Electrical and Plumbing Drawings, Drawing Office Activities, Building Services Drawings) | 80,000/= | අවු. 01 1/2 |

| අනු. අංකය | පාඨමාලා විස්තර | පාඨමාලා ගාස්තුව (රු.) | පාඨමාලා කාලය |
|---|---|---|---|
| පාඨමාලා අංක 06 සහ 07 වෘත්තීන් සඳහා ප්‍රවේශ සුදුසුකම්<br>• අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී සිංහල භාෂාව, ගණිතය ඇතුළුව විෂයයන් 06ක් සමත් විය යුතු ය. | | | |
| 06. | ශීතකරණ හා වායුසමන කාරමික ශිල්පි - **Refrigeration & Air Conditioning Technician**<br><br>අධ්‍යයන විෂයයන් -:<br><br>**Conditioning Mechanic**<br>Basic Work Shop Practice, All type of Refrigeration, Domestic & Industrial Motor Control Tinkering Arc, Gas Welding Techniqu, industrial Air Conditioning System, Refrigeration Recovery & Recycling Methods | 100,000 | අවු. 02 |
| 07. | යන්ත්‍ර ශිල්පී (විශේෂ) - **Machinist (Special)**<br><br>අධ්‍යයන විෂයයන් -:<br><br>Lathe, Milling, Grinding Machine Operation, Pneumatic and Hydraulic Systems, Heat Treatment, CNC Programming, CNC Machining, EDM Process, Wire Cutting Process, LASER Cutting, Solid Works, Auto Cad | 1,50,000 | අවු. 03 |
| පාඨමාලා අංක 08 සහ 09 වෘත්තීන් සඳහා ප්‍රවේශ සුදුසුකම්<br>• අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සිංහල භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයයන් 06ක් සමත් විය යුතු ය.<br>• අ. පො. ස. (සා. පෙළ) හෝ අ.පො.ස. (උ. පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබිය යුතු ය. | | | |
| 08. | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශිල්පි - **Information & Communication Technology Technician**<br><br>අධ්‍යයන විෂයයන් -:<br><br>Maintaining Files & Folders, Performing Word Processing, Preparing Spread Sheets, Preparing Presentations, Performing Basic Operations of Cloud Computing Including Internet and E-mail Services, Performing Basic Database Manipulation, Computer System, Network and Peripherals, Producing Print Page Layout and Multimedia objects, Sys tems Analysis and Designing, Perform Relational Databases using Standard SQL, Designing Static Website, Developing Desktop Applications | 40,000 | අවු. 01 |
| 09. | පරිගණක චිත්‍ර නිර්මාණ ශිල්පි - **Computer Graphic Designer**<br><br>අධ්‍යයන විෂයයන් -:<br><br>(Adobe Photoshop, Adobe Illustrator, Adobe InDesign, Printing & Scanning Method, Computer Hardware & Software, Colour Theory & Input Images, Visual Media Technology Fundamentals, Typography, Edit & Manipulate Images, Illustrations, Layout Designing, Design Layout for Web & Other Types of Multimedia. | 40,000 | අවු. 01 |

| අනු. අංකය | පාඨමාලා විස්තර | පාඨමාලා ගාස්තුව (රු.) | පාඨමාලා කාලය |
|---|---|---|---|
| **පාඨමාලා අංක 10, 11 සහ 12 වෘත්තීන් සඳහා ප්‍රවේශ සුදුසුකම්**<br>• **අ. පො. ස. (සා. පෙළ) දක්වා අධ්‍යාපනය ලබා තිබීම.** | | | |
| 10. | **පෑස්සුම් ශිල්පී (විශේෂ)**- Welder (Special )<br><br>**අධ්‍යයන විෂයයන් -:**<br><br>MMA/GAS/TIG/MIG/MAG/FCAW/PLASMA/SPOT/STUD Welding Work, Destructive & Non Destructive Testing Methods, Plate & Pipe weld | 1,50,000 | අවු. 03 |
| 11. | දැව කාර්මික ශිල්පී (ගෘහ භාණ්ඩ සහ ගොඩනැගිලි) **- (Wood Craftsman (Furniture and Building)**<br><br>**අධ්‍යයන විෂයයන් -:**<br><br>Use hand tools, Basic Wood Fitting and Safe use of Modern Machinery to Manufacture Furniture from Wood and Composite Wood, Sharpen and Mintain Hand Tools and Machine Blades, Polish Furniture Using Modern Tools and Equipment, Theoretical Knowledge of Wood Technology, Prepare Estimated using Mechanical Drawing and Industrial Mathematics, Construct Roofs and Ceilings, Make Door Frames, Doors and Windows, Lay Wooden Stair Treads, Construct Partitions, Make Shutterings. | 20,000 | අවු. 02 |
| 12. | බහු කුසලතා කාර්මික ශිල්පී - **Multi Skilled Technician**<br><br>**අධ්‍යයන විෂයයන් -:**<br><br>Masonry works, Plumbing works, Carpentry works, Electrical works, Maintenance of air Conditioning, Basic aluminum fabrication works, Work Place Communication, Occupational literacy, Occupational Health and Safety. | 40,000 | අවු. 01 $^1/_2$ |
| **පාඨමාලා අංක 13 වෘත්තීන් සඳහා ප්‍රවේශ සුදුසුකම්**<br>• **08 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලබා තිබීම.** | | | |
| 13. | ජලනල කාර්මික ශිල්පී - **Plumber**<br><br>Connect PVC, CPVC, GI, PB, PPR pipes currently used in construction industry, install modern sanitary equipment, install water pumps, install hot water systems, create and figure out plans, make estimates | 60,000 | අවු. 02 |

(02). මූලික තොරතුරු

- වයස් සීමාව -: 2026.06.30 දිනට වයස අවුරුදු 16ත් 35ත් අතර විය යුතු ය.
- ගෙවීම් -: පාඨමාලා ගාස්තු වාරික වශයෙන් ගෙවීම් කළ හැකි ය.
- ද්විත්ව පුහුණු ක්‍රමය -: පාඨමාලාවන් සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. මෙහි මුල් අර්ධය ආයතනික පුහුණුව වශයෙන් ද, දෙවන අර්ධය රජයේ හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක හෝ කර්මාන්තශාලාවක රැකියාස්ථ පුහුණුව (OJT) වශයෙන් ද, ආධුනිකයින් වෙත ලබා දෙනු ලැබේ.
- බඳවා ගැනීමේ ක්‍රමය -: ලිඛිත සහ සම්මුඛ පරීක්ෂණයන් මගින් තෝරා ගනු ලැබේ.

(03) ආධුනික ප්‍රතිලාභ

- නේවාසිකාගාර පහසුකම් (පිරිමි ආධුනිකයින් සඳහා පමණක් දුර ප්‍රමාණය මත පදනම්ව ලබා දෙනු ලැබේ.)
- පුස්තකාල පහසුකම් සහ සහනදායී මිලට ආහාරපාන ලබාගත හැක.
- ලං.ග.ම. (CTB) වාර ප්‍රවේශපත්‍ර (Season) පහසුකම් සලසා දීම.
- අඩු ආදායම්ලාභී පවුල්වල ආධුනිකයින් සඳහා මසකට රු. 5,000/- ක දීමනාවක් ලබා දීම.

(04). අයදුම්කිරීමේ පටිපාටිය

අයදුම්පත්‍රය සකස් කිරීම - : A4 කඩදාසියක සකස් කළ අයදුම්පතක් හෝ www. naita.gov.lk වෙබ් අඩවියෙන් බාගත කරගන්නා ලද අයදුම්පත්‍රයක් භාවිතා කළ හැක.

**අවශ්‍ය ලේඛන**

- ජාතික හැඳුනුම්පතේ (NIC) ඡායා පිටපතක්.
- තම ලිපිනය ලියූ මුද්දර අලවන ලද (9" X 4" ප්‍රමාණයේ) ලියුම් කවරයක්.
- අයදුම්පත් ලියාපදිංචි ගාස්තුව වශයෙන් රු. 1,000/- ක මුදලක් මහජන බැංකුවේ කටුබැද්ද ශාඛාවේ ගිණුම් අංක 313100153656984 වෙත තැන්පත් කළ යුතු ය. එම රිසිට් පත්‍රයෙහි පැහැදිලිව ආධුනිකයාගේ නම සහ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් විය යුතු අතර, එම මුල් පිටපත අයදුම්පත්‍රය සමග අමුණා එවිය යුතු ය. (අදාළ රිසිට් පත්‍රයේ ඡායා පිටපතක් ඔබ සතුව තබා ගත යුතු ය.)
- යොමු කිරීම - : ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට යොමු කළ යුතු ය.
  අධ්‍යක්ෂ/ විදුහල්පති
  කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය,
  අංක 581, ගාලු පාර, කටුබැද්ද,
  මොරටුව.
- ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ආධුනිකයින් බඳවා ගැනීම - 2026 ජූලි කණ්ඩායම" ලෙස සඳහන් කළ යුතු ය.
- අයදුම්පත්‍ර භාරගන්නා අවසන් දිනය **2026.04.30** වේ.
- අධ්‍යාපන සුදුසුකම් මත පිළිවෙලින් ඔබගේ කැමැත්ත පරිදි පාඨමාලා ත්‍රිත්වයක් අයදුම් කළ හැකි ය.
- තැපෑලේ දී නැතිවන හෝ ප්‍රමාදවන අයදුම්පත් සම්බන්ධයෙන් කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය වගකියනු නොලැබේ. ප්‍රමාදය වලක්වා ගැනීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2026.04.30 දින හෝ එදිනට ප්‍රථම අප වෙත ඉදිරිපත් කළ යුතු ය.

**එච්. ඒ. සත්තාර්,**
සභාපති,
ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය.

අංක 971,
ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ, රාජගිරිය.

| කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය - මොරටුව<br>Industrial Engineering Training Institute - Moratuwa<br>ආධුනිකයින් බඳවා ගැනීමේ අයදුම්පත්‍රය - 2026 ජූලි | Doc. No. :- ADM/TRE/FM/02<br>Issue No. :- 02<br>Issue Date :- 2019.03.14<br>Reviewed by :-<br>Approved by :- |
|---|---|

| |
|---|
| |
| කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි. |

01. අයදුම්කරුගේ නම (මයා/මිය/ මෙනෙවිය.) :-.......................................................................
...............................................................................................................
02. මුලකුරු සමග නම :-.......................................................................
03. ලිපිනය :-.......................................................................
04. පදිංචිය
    (i) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :-.......................................................
    (ii) දිස්ත්‍රික්කය :-.......................................................

05. දුරකථන අංකය :

    (i) ස්ථාවර :-.......................................................
    (ii) ජංගම :-.......................................................
    (iii) වට්ස්ඇප් (WhatsApp) අංකය :-.......................................................
    (iv) විද්‍යුත් තැපැල් ලිපිනය :-.......................................................

06. උපන් දිනය :-............/............/..................(දිනය/මාසය/වර්ෂය)
07. ජාතික හැඳුනුම්පත් අංකය :-.......................................................

08. **අධ්‍යාපන සුදුසුකම්** (ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම ඉදිරියෙන් (✓) ලකුණින් සලකුණු කරන්න)

| අ. පො. ස. (උ. පෙළ) | | අ. පො. ස. (සා. පෙළ) | | 8 ශ්‍රේණිය දක්වා | |
|---|---|---|---|---|---|

අ.පො.ස . (සා. පෙළ) විභාග ප්‍රතිඵල :

| අනු. අංකය | විෂයය | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

අ.පො.ස. (උ. පෙළ) විභාග ප්‍රතිඵල :

| අනු. අංකය | විෂයය | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

09. ඔබගේ අධ්‍යාපන සුදුසුකම් මත පදනම්ව, අයදුම් කිරීමට බලාපොරොත්තුවන පාඨමාලා ත්‍රිත්වයක් ප්‍රමුඛතා අනුපිළිවෙළින් සඳහන් කරන්න.

| | |
|---|---|
| 01. | |
| 02. | |
| 03. | |

මා විසින් ඉහත සඳහන් කරන ලද තොරතුරු මාගේ දැනුම අනුව සත්‍ය සහ නිවැරදි බව මෙයින් සහතික කරමි.

……………………………………,
අයදුම්කරුගේ අත්සන.

දිනය :- …………………

03 - 1179

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.